# දළදා වරුණ


මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2560 බක් මස 10 වන සඳු දින ■ 2017 අප්‍රේල් මස 10 වැනි සඳුදා



■ නොමිලේ පිරිනමන දහම් පඩුරකි ■ විකිණීම සඳහා නොවේ

# නැකතට හිස තෙල් ගෑමේ සිංහලයාගේ අරමුණ



සිරිලක සැමදෙනා සතුටු වන ප්‍රධාන උත්සවය සිංහල අලුත් අවුරුදු උත්සවය බව අවිවාදයෙන් සම්මත වන්නේ එය වටා ඇති පොදු ලක්ෂණ නිසාය. සිංහල, හින්දු, ක්‍රිස්තියානි, මුස්ලිම් යන සැම පුරවැසියාටම තම අනන්‍යතාවට හානි නොවන අයුරින් විවෘත හදවතින් මෙයට සම්බන්ධ වන්නට හැකි වන්නේය. එහෙත් මෙහි ක්‍රියාත්මක වන සිරිත් විරිත් වසර දහස් ගණනක් තුළ දේශීයත්වයෙන් පුරුදු පුහුණු ඒවා නිසා සිංහල ජාතියට ආවේණික ජීවන රටාවට සුවිශේෂ සම්බන්ධයක් විද්‍යාමාන වන්නේය. සූර්ය මංගල්‍යය ලෙසින් හැඳින්වෙන සිංහල දමිළ අලුත් අවුරුද්දේ ලාංකේය ජනතාවට අතිශය වැදගත් වන සංස්කෘතික මංගල්‍යයකි. අතීතයේ සිටම විශ්වයේ අතිශය සුන්දර වූ සොබාදහම සමග ආත්මීයව බැඳෙමින් ඉරහඳ අහස පොළොව කේන්ද්‍ර කරගෙන තම තමන්ගේ ජීවන රටාව සකස් කරගැනීම හා කෘෂිකාර්මික ජීවන රටාවකට හුරු පුරුදු වූ අපේ ශ්‍රී ලංකාවාසී ජනතාව සතුට සෞභාග්‍යය ඔප් නංවන හෙළයේ මහා ජාතික උත්සවයකි.

හෙළ සිරිතට, විරිතට සුවිසල් අගයක් එකතු කරමින් සැමරෙන සිංහල දමිළ අලුත් අවුරුදු චාරිත්‍ර අතර අවසන් නැකත වෙන් වන්නේ හිසතෙල් ගෑමේ චාරිත්‍රයටයි. සිංහල දමිළ අලුත් අවුරුදු උළෙලේ ඉටු කෙරෙන පාරම්පරික චාරිත්‍ර රාශියකි. ඒවායේ ජාතීන් හා පළාත් අතර සුළු සුළු වෙනස්කම් ඇත.

හිසතෙල් ගෑමේ චාරිත්‍රය පිළිබඳව ඩේවි හා ඩොයිලිගේ විස්තර වාර්තා අනුව අලුත් අවුරුදු උළෙලේදී රජු ඇතුළු රාජකීයයන් හා ප්‍රභූන් නැකතට හිසතෙල් ගෑම සිදුකළ බව සඳහන් වෙයි.


හිස තෙල් ගෑම සඳහා දුර්ලභ ඖෂධ ශාක එකතු කොට කපා කොටා කකාරා හිස තෙල් නානු පිළියෙළ කරනු ලැබේ.

මේ මගින් බලාපොරොත්තු වන්නේ ලෙඩ රෝග දුරලා නිරෝගි සුව ලැබීමට සුබ නැකතින් ගිනියම් හිස්වලට ඖෂධවලින් සැකසූ හිස තෙල් නානු ගෑමෙන් අලුත් අවුරුදු සමයේ උදුවන ග්‍රීෂ්මය විඩාව ලෙඩ රෝග දුරු කිරීම හා මිනිසා දුක් පීඩා සහිත දිවියකින් තොරව මිනිසා කැමැති ලෞකික ජීවිතයේදී මුහුණ දීමට සිදුවන නොයෙක් දුක්ඛ දෝමනස්සයන් හා ව්‍යසනයන්ද වාතයෙන්, පිතෙන්, සෙමෙන්, ආහාරපාන මගින් අට අනූවක් රෝග, නව අනූවක් අනතුරු සහගත රෝග පීඩාවන් අව්වෙන්, වැස්සෙන්, ගින්නෙන්, සුළඟින් හටගන්නා පීඩාවන් හා යක්ෂ භූත පිසාචාදී අමනුෂ්‍ය බිය උපද්‍රව ග්‍රහ අපලවලින් පවා මිනිසාට ඇතිවන ලෙඩ රෝග දුරලා නිරෝගීකම ලබාදීම බව අප ජනතාවගේ පරම විශ්වාසයයි. ඒ නිසා හිසතෙල් ගෑම චාරිත්‍රය ඉතා වැදගත් වෙයි.

**පූජ්‍ය බෝගමුවේ ඉන්ද්‍රරතන හිමි**

"මේ ලෝකයේ කවරදවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."

# ඔබ පියවර තැබිය යුත්තේ ආලෝකයටයි



**ජී**වත් වන්නේ ඇයි? යන ප්‍රශ්නයට එකවර නිශ්චිත හා නිවැරදි පිළිතුරක් දීමට ඔබට අසීරු විය හැකිය. මේ ප්‍රශ්නයට ඔබ විවිධ පිළිතුරු ලබා දෙනු ඇත. ජීවත් වන්නේ කා බී විනෝද වීම සඳහාද? එසේ නැත්නම් කෙසේ හෝ ජීවත් විය යුතු නිසාද? එසේ නැත්නම් මිනිස් ආත්මයක් ලද නිසාද? මේ ආදී පිළිතුරු ඔබගේ හිතේ උපදින්නට පිළිවන.

ඔබගේ ජීවිතයට ඉලක්කයක් හා අරමුණක් තිබිය යුතුමය. එසේ යහපත් ජීවන අරමුණක් ඇතිව ජීවත් වන්නා තමා විසින් සමාජයට ඉටු කළ යුතු මෙහෙවර ඉටු කරන්නට වෙහෙසෙයි. එහෙත් මෙබඳු ධනාත්මකව සිතන පිරිස් අප සමාජය තුළ සිටින්නේ කීයෙන් කී දෙනාද? ධනාත්මක චින්තනයෙන් යුතු පුද්ගලයාට උදාවෙන හැම දිනයක්ම එකසේ වැදගත්ය. ඔබ හැමවිටකදීම ක්‍රියාත්මක විය යුත්තේ සමාජයට යහපත් දෙයක් දායාද කිරීම උදෙසාය. එබඳු යහපත් සිතිවිල්ලක් ඇති පුද්ගලයා ජීවත් වන්නේ සතුටිනි. ඔහු කිසි විටෙක ජීවිතය ගැටලුවක් කර නොගනී. ඔහුට ඥානාන්විත ලෙස ගැටලු විසඳාගත හැකිය. ඔහු පළමුව ගැටලුව හඳුනා ගනී. එවිට එය නිරාකරණය කරගන්නට පහසුය. ඔබ හමුවට එන ඕනෑම ගැටලුවක් සැහැල්ලු මනසකින් දකින්නට උත්සාහ කරන්න. එසේම ඔබ ගන්නා තීරණ ගැන එක්වරක් නොව දෙවරක්ම සිතන්න.

ඔබ ගත් තීරණයේ සෘජුව පිහිටන්න. '**තම හිසට තම අතමය සෙවණැල්ල**' ලෙසට සිතන්න. එවිට ජයග්‍රාහී පුද්ගලයකු වීමේ මාවත ඔබ ඉදිරියේ විද්‍යමාන වනු ඇත. ධනාත්මක සිතිවිලිවල බලය ගැන කරුණු දක්වන්න. 'නෝර්මන් වින්සන්ට් පීල්ගේ' කෘතියේ එන තවත් වැදගත් සටහනක් උපුටා දක්වන්නට කැමැත්තෙමි.

**"ඔබේ යටි සිතේ විශ්මිත බලයක් තිබෙන බව විශ්වාස කරන්න. එම බලය නිතරම ඔබගේ සහායට සිටින බව සිතන්න. මේ මහා විශ්ව බලයෙන් ඔබේ යටි සිතට විශාල ශක්තියක් කාන්දු වෙන බවට තේරුම් ගන්න."**

ලොව ජයගත් බොහෝ ප්‍රකට පුද්ගලයන් සිය ජයග්‍රහණයන් සඳහා හිතේ ඇති මෙම විශ්ව ශක්තිය උපයෝගී කරගෙන තිබේ. මේ ලෙස අභ්‍යන්තර චිත්ත ශක්තිය ගැන විශ්වාසය තබන්නා තුළ දැඩි ආත්ම විශ්වාසයක් ගොඩ නැගේ. ඔබ හැමවිටකදීම ඉතාමත් බැතියෙන් යුතුව තම භවාංග සිතින් තමාගේ සියලු කාර්යයන් සාර්ථක කර දෙන ලෙස ඉල්ලා සිටින්න. එය කළ යුත්තේ මුළු හදවතින්ම බවද සිහියට ගන්න. ඉන්පසු ඔබගේ කාර්යයන් වීර්යයෙන් හා උනන්දුවෙන් යුතුව ක්‍රියාවට නගන්න. ඔබ මෙසේ මුදාහරින ලද චිත්ත ශක්තිය ගැන පසුව ඔබම පුදුමයට පත්වනු නිසැකය.

**"මට පුළුවන්" යන සිතුවිල්ල ඇති කරගන්න**

ජයග්‍රාහී සිතිවිලිවලින් සිත පිරුණ තැනැත්තා පරාජයන් හමුවේදී වුවද ජයග්‍රාහකයකු ලෙස හැසිරේ. ඔහුගේ සිතේ ඇති අයෝමය ශක්තිය ගැන මිතුරන් පවා පුදුම වනු ඇත. එක් බටහිර මනෝ විශ්ලේෂකයෙක් මේ ගැන මෙබඳු ප්‍රකාශයක් කොට ඇත.

**"තමාට පුළුවනිය යන විශ්වාස ඇති කර ගන්නා පුද්ගලයා හැමවිටම ජයග්‍රහණය කරයි."**

ඔබද මේ අයුරින් නිරතුරුව සිතන්න.

''මගේ යටි සිත සාර්ථකත්වයේ හා ජයග්‍රහණයේ හරි මග පෙන්වන බව මට විශ්වාසයි. ඒ නිසා මට මගේ සියලු කටයුතු සාර්ථකව නිම කළ හැකියි. මගේ සිත ශක්තිමත්. මට හැමදෙයක්ම සාර්ථකව කරන්න පුළුවන්. මාව කිසි විටෙකත් පරාජයට පත් කළ නොහැකියි.''

උදේ දවස ආරම්භයේදීම ඔබ මේ වචන ටික යටි සිතින් කීප වරක්ම මුමුණන්න. මෙසේ තෙපළද්දී ඔබගේ සිතට මහත් ශක්තියක් හා අභිමානයක් දැනෙනු නිසැකය. පරාජිත සිතිවිලි පලවා හරින්න. මෙය ඔබට මාහැඟි ඖෂධයක් වනු ඇත.

මිනිසුන් සිව් වර්ගයකි. ඒ මේ අයුරිනි.


**ආලෝකයෙන් අඳුරට යන අය.**
**අඳුරින් අඳුරට යන අය.**
**අඳුරින් ආලෝකයට යන අය.**
**ආලෝකයෙන් ආලෝකයට යන අය.**

*- තිලෝගුරු බුදුන් වහන්සේ*

ඔබ පියවර තැබිය යුත්තේ ආලෝකයෙන් ආලෝකයටය. එසේ කළහොත් ඔබට ජීවිතය දිනන්නටත්, ආලෝකය දකින්නටත් වාසනාව අත්වෙනු නිසැකය.

**නිව්ටන් ගුණසේකර**

''යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ.''



# සියල්ල සිදුවන්නේ කර්මය අනුවද?

කර්මය නිසාම සියල්ල සිදු නොවේ. කර්මය හේතු කොටගෙන සියල්ල සිදුවේ යන කර්ම නියතිවාදයක් බුදු සමය නුගන්වයි. බුදු සමය ඒක හේතුවාදයක් නුගන්වන අතර යමක් සිදුවීමේදී පුද්ගලයකුගේ පැවැත්මට අවශ්‍ය ආහාර වර්ග 4 ක් බුදු සමයෙන් නිර්දිෂ්ට වේ. එනම්,

1. කබලිංකාර ආහාර - බත් වැනි අප ආහාරයට ගන්නා රළු දේවල්.
2. මනෝ සංචේතනා ආහාර හෙවත් මනස පදනම් කරගෙන කරනු ලබන සචේතනාමය ක්‍රියාවන්.
3. පස්සසාහාර හෙවත් ඉන්ද්‍රියයන් හා අරමුණු හෙවත් විෂය වන දේවල් එකිනෙකට ගැටීම.
4. විඤ්ඤාණ ආහාර හෙවත් විඤ්ඤාණයට ගෝචර වන අරමුණු.

සත්වයාගේ පැවැත්මට බලපාන මෙම ආහාර වර්ග සතරෙන් විඥානය තනිව එක් කොටසක් නියෝජනය කරයි. පස්ස හා මනෝ සංචේතනා යන ආහාර වර්ගද, මානසික ක්‍රියාකාරිත්වයේ අංගයන්ය. කර්මය නිසා නොව ඉහත ක්‍රියාකාරිත්වයද පුද්ගල පැවැත්මට අත්‍යවශ්‍ය වේ.

සත්ව ජීවිතයේ පැවැත්මට කරුණු සතරක් අවශ්‍ය වේ. ඒවා කර්ම චිත්ත, ඍතු, ආහාර වශයෙන් හැඳින්වේ. මෙහිදී කර්මය යනුවෙන් භාග්‍ය හෙවත් වාසනාව හැඳින්වේ. නියති වාදයක් ලෙස කර්මය බුදු දහමේ නුගන්වන අතර කර්මය වෙනස් නොකළ හැකි දෙයක් සේද නුගන්වයි. කර්මයත්, කර්ම විපාකයත් න්‍යාම ධර්මයක් සේ බුදු සමය උගන්වයි.

1. ඍතු නියාම:

ඍතුන් එළඹෙන විට ඒ ඒ වෘක්ෂලතාවල මල් ඵල හටගැනීම සිදුවේ. මෙයට කර්මය හෝ කිසිවකුගේ බලපෑමක් හේතු නොවේ.

2. බීජ නියාම:

ඒ ඒ ගස් වැල්වලට ආවේණික ලක්ෂණ ඒ ඒ බීජයන්හි ඇතිවීමයි. මඩි ගසට සමාන මල්ඵල හටගනී.

3. කම්ම නියාම:

ඒ ඒ කර්මවලට සුදුසු විපාක ලැබීමයි. පාප කර්මවලට දුක් විපාකද කුසල කර්මවලට සැප විපාකද ලැබෙයි.

4. ධම්ම නියාම:

ආලෝකය ලැබෙන විට අඳුර දුරු වෙයි. ජලය පහත් තැනිත්ම ගලා බසියි. උතුමන්ගේ ගුණ මහත්වන නිසා ඇතැම් විට භූමිකම්පා ඇතිවේ.

5. චිත්ත නියාමය:

කිසිවකුගේ මෙහෙයවීමකින් තොරව සත්වයන්ගේ චිත්ත පරම්පරා නීතියයි. සිත් පහළවීම එය නිරුද්ධ වී නව සිතක් පහළවීම සිතේ ස්වභාවයයි.

''පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.''

කර්මයෙන් තොරව බොහෝ දේවල් සිදුවන බවත් කර්මයට ඇත්තේ එක් කොටසක් බවත් නියාම ධර්ම විමසන විට මැනවින් පෙනී යයි. කර්මය ඉඳුරාම සිදු නොවන බවත් කර්මයේ විවිධත්වයත්, සංකීර්ණත්වයත් ඇති බව මෙයින් පැහැදිලි වන තවත් කරුණකි. එම නිසා සියල්ලම සිදුවන්නේ කර්මය නිසා යන්න බුදු සමයෙන් ප්‍රතික්ෂේප වෙයි. ඒ බව ගිරිමානන්ද සූත්‍රයේදී පෙන්වා දී තිබේ.

වාපිත් සෙම් ආදී තුන්දොස් කිපීමෙන් වන රෝගද සෘතු පෙරළීමෙන් විෂමාචාරයෙන්, විවිධ උපක්‍රම මගින් ලෙඩ රෝග ඇතිවේ. කර්ම විපාක නිසාද ලෙඩ රෝග හට ගනී. සීත, උෂ්ණ, බඩගිනි, පිපාසා ආදියෙන්ද රෝග හටගනී. කර්මයට ඇත්තේ මෙයින් එක් කොටසක් පමණි. සියල්ල කර්මයෙන් සිදු නොවන බව මෙයින් පැහැදිලි වේ. වර්තමානයේ මාරාන්තික "ඒඩ්ස්" වැනි රෝග පූර්වකර්ම නිසා නොව විෂමාචාර පැවැත්මේ ප්‍රතිඵලයි.

අලසකමින් කටයුතු කරන්නෝ පිරිහෙති. එය කර්මයේ විපාක නොව දූන් සීතලයි, උණුසුම වැඩියි, බඩගිනි පිපාසයි, නිදිමතයි, උදෑසන වැඩියි, සවස් වැඩියි යැයි යමෙකු සිතා කටයුතු අතපසු කරයි නම් ඔහු පිරිහෙයි. ඒ කර්මය නිසා නොව ඔහුගේ අලස බව නිසයි.

යමෙකු තුළ ප්‍රඥාවෙන් පරිපෝෂණය වූ යහපත් වීර්යයත් තිබේ නම් නොකළ හැකි දෙයක් හෝ නොපැමිණිය හැකි තැනක් හෝ නැත. ග්‍රහලෝක තරණයත් වර්තමාන නව සොයාගැනීම් මේ වීර්යයේ ප්‍රතිඵලය. යමකු ආධ්‍යාත්මිකව ක්‍රමවත් වැඩපිළිවෙළවල් අනුගමනය කරන්නේ නම් මගඵල පවා අවබෝධ කළ හැකිවේ. ධර්මය සාන්දෘෂ්ටිකය, අකාලිකය. තම තමන්ම සත්‍යාවබෝධ කළ යුතු වේ. "පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤුහි", ඥානවන්තයා ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කළ යුතුවේ. එසේ නම් භෞතික දියුණුවටත්, ලෝකෝත්තර දියුණුවටත් පුද්ගලයා ප්‍රඥාවෙන් පෝෂණය වූ වීර්යයක් තිබිය යුතු බව මෙයින් පැවැසිය හැකි අතර කර්මය වුවද සකස් කරගත හැකි දෙයක් බව පෙනේ.

මෛත්‍රිය වඩන පුද්ගලයාට අනුසස් එකොළහක් (11) ලැබෙන බව මෙත්ත සූත්‍රයේද දක්වේ. ඉන් අනුසස් 10 ක්ම මෙලොවදී ලැබෙන අතර ඉන් එකක් පමණක් මරණයෙන් අනතුරුව විපාක ලැබේ. බුද්ධ දේශනාව පිළිපැදීමෙන් පරලොව අනුසස් ලැබීම පමණක් නොව වැඩි ප්‍රමාණයක් පුද්ගලයාගේ මෙලොව ජීවිතය සුඛිත මුදිත කර ගැනීමට ඉවහල් වන අන්දම මැනවින් පැහැදිලි වේ. අංගුලිමාල පැවිදි වීමට පෙර මිනිසුන් රැසක් මැරුවත් බුදු බණ අසා මගඵල ලැබීමට පෙර කර්ම බාධාවක් නොවීය.

තිදොරින් කර්ම කිරීමේදී විමසා බලා කටයුතු කරන මෙන් රාහුලෝවාද සූත්‍රයේදී රාහුල හිමියන්ට දේශනා කළ සේක. එම දේශනාවට අනුව කර්මයක් කොට එහි විපාක කඳුළු පිරි දෑසින් යුතුව ශෝකබරිතව විඳීමට සිදුවේ නම් එවැනි කර්ම නොකරන ලෙස දේශනා කර ඇත.


කර්මයක් විපාක දීමේදී බලපවත්වන කරුණු අතර සම්පත්ති හා විපත්ති දක්විය හැක. ගති, කාල, උපාධි, ප්‍රයෝග වශයෙන් මේ සම්පත්ති හා විපත්ති දක්වා ඇත. යම් ස්ථානයක නුසුදුසු කාලයක හැඩරුවින් විරූපව නුසුදුසු අන්දමින් කටයුතු කරන අයට අකුසලය තදින්ම බලපායි.

බොහෝවිට හිතකර මෙන්ම අහිතකර බලවේගයන්ගේ විරෝධය නැතහොත් ආධාරය මෙම ස්වයං ක්‍රියාකාරී නීතියට ලැබෙන්නේය. එසේ ආධාර හෝ අවහිර ඇතිකරන සෙසු බලවේගයක් නම්, ඉපදීම, කාලය, තත්ත්වය හා ප්‍රයත්නයයි. ගති සම්පත්ති හෝ විපත්තිවලදී කර්මය දූරීම හෝ මර්දනය හෝ කරයි. නිදසුනක් ලෙස අයකු වංශවත් හෝ වාසනාවන්ත තැනක උපදී යැයි සිතමු. ඔහුගේ වාසනාවන්ත ඉපදීම යහපත් කර්මය ක්‍රියාත්මක වීමට අනගි අවස්ථාවක් සපයෙයි. රජ කුලයක ඉපිද සෙසු අයගෙන් ගෞරවාදර ලබයි. ඔහු එතරම් වාසනාවන්ත උපතක් නොලදී නම් එසේ ගෞරවාදරයක් නොලැබේ.

හැඩරුව ඇති (උපධි සම්පත්තිය) හැඩරුවින් අඩු (උපධි විපත්තිය) බව කර්මයේ මර්දනයට හෝ වර්ධනයට බලපාන තවත් සාධක දෙකකි. යහපත් කර්ම නිසා අග පසඟ හොඳින් ලබා හැඩරුවද හොඳින් ලබයි. කර්මයේ අයහපත් ප්‍රතිලාභය නිසා විරූපී, අංගවිකල, පහත් කුලවල වැනි උපතක් ලබාදෙයි. ශරීරාංග විකලත්වය, ඇතැම් විට රජ පවුලක උපන්නත් රජය පවා අහිමි වීමට හේතු වේ. ඇතැම් විට දිළිඳු අයට විශිෂ්ට ස්ථාන හිමිවන අවස්ථාද ඇත. දුප්පත් වූ, සැඟවුණු ඇතැම් අය නළු නිළියන් වීම, රූප රාජිනියන් වීම වැනි ශ්‍රේෂ්ඨත්වයට, ජනාදරයට පත්වන අවස්ථාද දැකිය හැක. දිළිඳු මල්ලිකාව පසුව කොසොල් රජුගේ දේවිය බවට පත්වූවාය. වර්තමානයේද මෙවැනි අවස්ථා සුලබය.

කර්මය ක්‍රියාත්මක වීමට බලපාන සෙසු සාධක නම් කාලය හා අවස්ථාවයි. දුර්භික්ෂයක් හෝ යුද්ධයක් පවත්නා කල්හි සියලු පුද්ගලයෝම එකම ඉරණමක මුහුණ පා පීඩා විඳිති. මෙහිදී සිදුවී ඇත්තේ අයහපත් තත්ත්වයක් උදාවී අයහපත් ක්‍රියාත්මක වීමට ඉඩ තැබීමයි. කර්මය ක්‍රියාත්මක වීමට බලපාන අනෙක් සාධකය වන්නේ ප්‍රයත්නය නොහොත් බුද්ධියයි. ප්‍රයත්නයක් නොමැති කල්හි ලෞකික හෝ ආධ්‍යාත්මික ප්‍රගතියක් නොවිය හැකිය. රෝගයකින් සුවය ලැබීමට හෝ දුෂ්කරතාවන්ගෙන් බේරීමට හෝ ප්‍රගතිය සඳහා නොපසුබටව ක්‍රියා කිරීමට යම් අයකු ප්‍රයත්නයක් නොදරයිද එවිට ඔහුගේ පව්වූ කර්මවලට අයත් විපාක නිපදවීමට මහඟු අවස්ථාවක් ඇති කරනු ලබන්නේය. කෙසේ වෙතත් ඔහුගේ දුෂ්කරතාවන් ඉස්මතු වීමට ආයාසයක් දරයිද ඔහුගේ යහපත් කර්මය ඔහුට ආධාර සඳහා ඉදිරිපත් වෙයි. පෙර භවයක බෝධිසත්වයෝ සයුර මැදදී යාත්‍රා කරමින් තිබූ නැව අනතුරකට පත්වූයෙන් තම මෑණියන්ද කරපිට තබාගෙන පිහිනූහ. සෙස්සෝ දෙවියන්ට යාඥා කරමින් තම ඉරණම දෙවියන් වෙත පැවරූහ. එහි ප්‍රතිඵලය වූයේ බෝසතුන් හා මෑණියන් දිවි ගලවා ගැනීමත්, සෙසු අය විනාශ වීමත්ය.


මේ අනුව කර්මය ක්‍රියාත්මක වීමට උපත, හැඩරුව, කාලය, පෞද්ගලික වෑයම හෝ බුද්ධිය උපකාර වන අන්දම පැහැදිලි වේ. කෙසේ වෙතත් මිනිසාට ක්‍රම හා විධි අනුගමනය කිරීමෙන් කර්මයේ ආසන්න විපාකයන් ජයගත හැකිය. එහෙත් ඔහු කළ එම කර්මවල විපාකයන්ගෙන් සසර වසන තුරු නිදහස් නොවේ. තමා වර්ධනය [illegible] කර්ම විපාකයන් තමාට පලදෙන අවස්ථා යළිත් පැන නැගිය හැකිය. එය ලෞකික ජීවිතයේ අස්ථිර භාවයයි. කර්මයේ යහපත් විපාක මෙන්ම අයහපත් විපාක බුද්ධාදි උතුමන්ට ලැබුණු අන්දම ප්‍රකටය, එසේම අතීතයේ පිරූ දසපාරමී ආදී කුසල ධර්මවල විපාක අපමණ ලැබූ බවද ප්‍රකටය. මුගලන් රහතන් වහන්සේගේ අවසාන කාලය ඉතා ඛේදජනකය. ලෝසක තෙරුන්ට ආහාර විරල විය. මේ ආදී කරුණුවලින් කර්මයේ ඇති යථා තත්ත්වය මඳක් හෝ සිතා ගැනීමට දුෂ්කර නොවේ.



පූජ්‍ය පිටපොළ
මෙත්තානන්ද හිමි

"අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."

# ශෝක
## තරණය කළ පසු පහුර බිමින් තබන්න



ආගම්, ජාති හා කුල භේදයකින් තොරව කාටත් ජරා, ව්‍යාධි හා මරණය උරුම වී ඇත. සිදුහත් කුමරුට රජ සැප විඳීමට බාධාවක් වූයේද, මෙම ජරා ව්‍යාධි හා මරණයයි. පංච ඉන්ද්‍රියයන් සමග බැඳී ඇති දස සංයෝජනද බිඳ දමා සිදුහත් තවුසාණෝ බුද්ධත්වයට පත්වී ජරා ව්‍යාධි හා මරණයෙන් නිදහස් වූහ. පළමු සංයෝජන තුන් වන සත්ව පුද්ගල දෘෂ්ටිය, සැකය හා සිල් ව්‍රත බිඳ දැමූ විට යමෙක් නිවන් මාර්ගයට හෙවත් සත්‍යයේ මාර්ගයට අවතීර්ණ වෙයි. මධ්‍යම ප්‍රතිපදව නැතහොත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය යනු මෙම සත්‍යයේ මාර්ගයයි.

සත්ව පුද්ගල දෘෂ්ටිය ඇතුළු සියලුම දෘෂ්ටි දැනුමේ ඵලයන්ය. දැනුම වැරදි බැවින් එහි ඵලයන් වූ සියලුම දෘෂ්ටි මිත්‍යා දෘෂ්ටි වෙයි. දැනුම හෙවත් අවබෝධය තුළ සම්මා දෘෂ්ටියක් නැත. කුඩා ළමයාට අනුන්ගෙන් අසා දැන ගත් බාහිර දැනුමක් නැති බැවින් ඔවුනට හෝ ඇයට සත්ව පුද්ගල දෘෂ්ටියක් නැත. ඔහුට හෝ ඇයට මවාගත් ලෝකයක් නොමැති බැවින් එතෙර වීමටද ලෝකයක් නැත. සත්ව පුද්ගල දෘෂ්ටිය නැති කුඩා දරුවාට සසරින් එතෙර වීමටද නොහැක. සසරින් එතෙර වීමට නම් නිවැරදි දැනුම අප තුළ තිබිය යුතුය.

සැකය අපව සසරට බැඳ තබන දෙවැනි සංයෝජනයයි. ධර්මය කෙරෙහි ඇති සැකය මෙයින් අදහස් කෙරෙයි. සසරින් එතෙර වීමට නම් සත්ව පුද්ගල දෘෂ්ටය මෙන්ම ධර්මය කෙරෙහි ඇති සැකයද ශෝකය තුළ ජීවත් වන අප කෙරෙහි තිබිය යුතුය. සත්ව පුද්ගල දෘෂ්ටිය නැති කුඩා දරුවාට සත්‍ය දකින්නට නොහැකියාව මෙන්ම ධර්මය කෙරෙහි සැක නැති පුද්ගලයාටද සසරින් එතෙර වීමට නොහැකිය. අවාසනාවකට මෙන් නිවන් සොයා යන බොහෝ දෙනකුට තමන් අනුගමනය කරන්නා වූ ධර්ම කෙරෙහි සැකයක් නැත. ඔවුහු ධර්මය සැකයකින් තොරවම පිළිගනිති.

සාරාංශ කර කියනවා නම් දස සංයෝජනයන්ගෙන් ලෝකයට බැඳී ඇති මිනිසා සත්‍ය දැකීමට සුදුස්සෙකි. යෝගාවචරයෝ සත්ව පුද්ගල දෘෂ්ටිය වැරදි දෘෂ්ටියක් බව

"මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?

පිළිගන්නා නමුත් එය වැරදි දැනුමේම ප්‍රතිඵලයක් බව නොදනිති. එම නිසා අනුන්ගෙන් ඉගෙන ගත් දැනුමෙන් ඉවත් නොවී දැනුම හරහාම සත්ව පුද්ගල දෘෂ්ටියෙන් නිදහස් වීමට භාවනාවකින් හෝ කිසිම විදියකින් සත්ව පුද්ගල දෘෂ්ටිය බිඳ දැමිය නොහැකිය. ඇයි? සියලුම භාවනාවලට හා සීලයට පදනමද සත්ව පුද්ගල දෘෂ්ටියෙන් නිර්මාණය කරගත් ධර්ම බැවිනි. සක්මන් භාවනාවේදී ''මම මගේ පාදය ඔසවමි'' යැයි භාවනා කරන කල, පාදය ඔසවන්නේ ''මම'' ය. යෝගාවචරයෝ ''පාදය'' ත් පිළිගනිති. ''මම'' ත් පිළිගනිමි. ''බුද්ධ'' යනු සියලුම පිළිගත් ධර්මවලින් නිදහස් වූ තැනකි. සියලුම පිළිගත් ධර්මවලින් නිදහස් වී දුක නැතිකර ගැනීම මිනිසාට දුෂ්කර වී ඇත්තේ ඇයි? මිනිසාට අවශ්‍යම ධර්මයක් වන තර්කය හා විතර්කය නොමැතිකමයි. ඔබ තර්ක හා විතර්කවලින් තොරව අන්‍යයන් දේශනා කරන ධර්ම එලෙසම පිළිගනිති. ධර්මය විමර්ශනයන්හි ඇති පරස්පර විරෝධතා දකින්නේ නැත. සත්‍ය දැනීම සඳහා ඔබ අනුගමනය කරන්නේ බාහිර නැති රූපයකින් නිර්මාණය කරගත් වැරදි දැනුමක් බව ඔබ දකින්නේ නැත. මෙම නොදැනීම නිසාත්, ධර්මය එලෙසම පිළිගැනීම නිසාත් ඔබට ධර්මය කෙරෙහි සැක පහළ නොවෙයි. තර්කය සහ විතර්කයත් එමගින් පැන නගින්නා වූ සැකයත් නොමැති නම් සත්‍ය පහළ නොවෙයි. නමුත් ඔබේ ගුරුවරයා ඔබට උගන්වන්නේ ධර්මය කෙරෙහි සැක පහළ කර නොගන්නා ලෙසයි. යම් කෙනකු තමන් අනුගමනය කරන්නා වූ ධර්ම තුළ සැක නැති නම් එයින් අදහස් කරන්නේ ඔහුට හෝ ඇයට තර්කය හා විතර්කය නැති බවයි. තර්කය හා විතර්කය නැති පුද්ගලයා සත්‍ය දැකීමට සුදුසු පුද්ගලයකු නොවේ.

ගඟ තරණය කළ පසු පහුර ඔසවාගෙන යන්නේ නැත. පහුරද, හබලද තොටුපොළ තබා යයි. එපමණක්ද නොවෙයි. තොටියා ගඟ තරණය කරන විටද පහුර කරගසාගෙන යන්නේ නැත. ඔබ මෙතෙක් නොදැක්කේ එයයි. ඔහු පහුර මත හිඳ හබල් ගසයි. පහුර අවශ්‍ය වන්නේ තොටියාට ඉඳගෙන යාමට පමණි. ගඟ තරණය කරන්නේ හබලෙන් මිස පහුරෙන් නොවෙයි. බුදුන් වහන්සේ ''පහුර'' ධර්මයට උපමා කළ අපූරුව බලන්න. මෙතරම් රසවත් ධර්මයක් බුදුන් වහන්සේ දේශනා කර තිබියදී ඔබ කරන්නේ කුමක්ද? ඉඳගෙන යාමට ඇති ධර්මය නමැති පහුර හිස තබාගෙන, හබලද ඉවත දමා මෝහය නමැති ගඟ තරණය කිරීමට වීර්යය කරයි. ඔබ සැඩ පහරට අසුවී පහුරත් සමග මුහුදට ගසාගෙන යයි. ගඟෙන් එතෙර වීමක් නම් නැත.

ධර්මය තිබෙන්නේ ලෞකික ලෝකයේ ජීවත් වීමට මිස, ඔබ නිර්මාණය කරගත් ලෝකයෙන් එතෙර වීමට නොවේ. පහුරේ ආධාරයෙන් තොටියා ගඟ පහළට ගසාගෙන යනවා විනා ගඟ තරණය කළ නොහැකිවා මෙනි. ගඟ තරණයට හබල අවශ්‍ය වෙයි. හබලින් කරන්නේ සැඩ පහරට එරෙහිව ඔරුව මෙහෙයවා ඔබේ ගමන් මග වෙනස් කර නිවැරදි මගට ගැනීමයි. හබල උපමා කළ හැක්කේ කවර ධර්මයකටද? ප්‍රඥාව හෙවත් සම්මා දෘෂ්ටියද? නැත. භවය තරණය කරන තොටියාට තවම ප්‍රඥාව පහළ වී නොමැත. ප්‍රඥාව පහළ වන්නේ ගඟ තරණය කළ පසුවයි. පහුර මත සිටින තොටියාට මිත්‍යා දෘෂ්ටිය මිස, සම්මා දෘෂ්ටියක් නැත. එසේ නම් ඔබේ ගමන් මග වෙනස් කරමින් ඔබ තොටුපොළ කරා රැගෙන යන මෙම හබල කුමක්ද?

මෙම හබල නම් තර්කය හා විතර්කයයි. නැතහොත් සැකයයි. තර්කයෙන් හා විතර්කයෙන් ධර්මය කෙරෙහි සැකය උපදී. මෙම සැකයෙන් තොටියාගේ ගමන වෙනස් කරයි. තර්කය හා විතර්කය නමැති හබල අත නැති ධර්මය පිළිගත් යෝගාවචරයා සැඩ පහරට අසුවී මරණයට හෙවත් මුහුදට ගසාගෙන යයි.

ලෝකයෙන් එතෙර නොවූ කිසිවකු ''දුක'' යනු කුමක්දැයි නොදනිති. ඔවුහු ලෞකික දුකක් ගැන දේශනා කරති. තිරිසන් සත්වයන්ට මිනිසාට මෙන් සසර ගමන දුකක් නොවේ. තිරිසන් සත්වයෝ ධර්මය නමැති පහුර ඔසවාගෙන යන්නේ නැත. ඔවුන්ට ඔසවාගෙන යන්නට ධර්මයක් හෝ දැනුමක් නොමැති බැවිනි. මිනිසාට පමණක් ඇති මෙම ''දුක'' නම් ධර්මය නමැති පහුර හිස තබාගෙන ගඟ තරණය කිරීම බව ඔබට නොපෙනේද? ධර්මය හෙවත් දැනුම පිළිගැනීම මිනිස් සත්වයාට දුකකි. දුකින් නිදහස් වීමට යැයි කියමින් ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග තුළින් ඔබ තව තවත් දුකට පත්වෙයි. දුකින් නිදහස් වීමට නම් සියලුම පිළිගත් ධර්මවලින් නිදහස් විය යුතුය. එක් ධර්මයක් අත්හැර තවත් ධර්මයක් අල්ලා ගත හොත් ගමන තවත් දිගු වෙයි. පහුර හිස තබාගෙන සැඩ පහරට අසුව මුහුදට ගසාගෙන යන බුද්ධිමත් ඔබට පහුර හිසෙන් කරට ගෙන කරින් ජලය මත තබා එය මත නැගී හබල නිවැරදි අතට මෙහෙයවීමට කල්‍යාණ මිත්‍ර සේවනය උදව් වෙයි.


**ආචාර්ය තිස්ස අත්තනායක**



''යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ.''



# අටලෝ දහමින් කම්පා නොවෙමු



දේශකයාණෝ - මහනුවර නායගිරි
විජයසුන්දරාරාම විහාරද්වයාධිපති,
ඓතිහාසික බදුලු මුතියංගන රජමහා
විහාරාධිපති, ශ්‍රී දළදා මාළිගාවේ තේවාවිහාර,
අතිගෞරවාර්හ
වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද
ඤාණරතනාභිධාන
මහාවිහාරවංශික ශ්‍යාමෝපාලි මහානිකායේ
අස්ගිරි මහාවිහාර පාර්ශවයේ මහානායක
මාහිමිපාණන් වහන්සේ

"ලාභො අලාභො අයසො යසො ච
නින්දා පසංසා ච සුඛං ච දුක්ඛං
එතෙ අනිච්චා මනුජෙසු ධම්මා
අසස්සතා විපරිනාමධම්මා"

පින්වත්නි,

අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ ලෝකධම්ම සූත්‍රයේ සඳහන් වන මෙම ගාථා පාඨයට අනුව "ලාභය, අලාභය, යසය, අයසය, නින්දාව, ප්‍රසංසාව, සුඛය, දුක්ඛය යනාදී අනිත්‍ය වූ අශාස්වත වූ මෙම අෂ්ට ලෝක ධර්මයෝ මනුෂ්‍යයන් කෙරෙහි පෙරළෙන ස්වභාව ඇත්තාහ."

මේ අෂ්ට ලෝක ධර්ම ලෝකය අනුව පෙරළෙයි. ලෝකය ද අෂ්ට ලෝක ධර්මයන් අනුව පෙරළෙයි. පෘථග්ජනයාට මෙන්ම ආර්‍ය ශ්‍රාවකයාට ද එකසේ උපදී. එහෙත් පෘථග්ජනයාට වඩා ආර්‍ය ශ්‍රාවකයා කෙරෙහි වෙනස්ව පවතී. අශ්‍රැතවත් පුදුහුන් මිනිසා කෙරෙහි ලාභයක් උපන් විට ඔහු එය නුවණින් නොදකී. මට ලාභයක් උපන්නේය,

"දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් යමෙකු විසින් කරන ලද පව වහා නොමේරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බැඳී

එය අනිත්‍යය, දුකය, පෙරළෙන ස්වභාව ඇත්තේ යැයි ඇති සැටියෙන් නොදකී. ඔහු දුකක් උපන්නත් එය අනිත්‍යය, දුකය, පෙරළෙන ස්වභාව ඇත්තේය යනුවෙන් ඇති සැටියෙන් නොදකී. ලාභයක් උපන් විට සිත සතුටින් පිරී යයි. අලාභයක් උපන් විට සිත මැඩගෙන සිටියි. යසස, අයස කෙරෙහි ද එසේමය. නිඳාව, ප්‍රසංසාව කෙරෙහි ද සිත මැඩගනී. සුඛ දුක්ඛයන් කෙරෙහි ද එසේමය. ලාභයක් උපන් විට ඇලෙයි. අලාභයක් උපන් විට විරෝධයට පත් වෙයි. අටලෝදහම කෙරෙහිම එසේ පවතියි. එසේ ඇලීම හා විරෝධයට පත්වූ ඔහු ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසාදියෙන් ද නොමිදෙයි. දුකෙන් නොමිදෙයි.

එහෙත් ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා ලාභයක් උපන් විට එය අනිත්‍ය බව, දුක්ඛ බව, පෙරළෙන සුළු බව යථාභූතව දැනගනී. අයසක් උපන් විට ද, යසසක් උපන් විට ද, ප්‍රසංසාවක්, නිඳාවක්, සුඛයක්, දුක්ඛයක් උපන් විට ද එසේම සලකයි. මට උපන්නා වූ දුක්ඛය අනිත්‍යය, එය පෙරළෙන සුළුය යනුවෙන් දැනගන්නා ඔහු ලාභයෙන් හෝ අලාභයෙන් සිත මැඩ නොගනී. අවශේෂ ලෝක ධර්මයන් කෙරෙහි ද එසේම පවතී. ඔහු තුළ ඇලීම හෝ විරෝධය නැති නිසා ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසාදියෙන් සිත මිදෙයි. සියලු දුකෙන් මිදෙයි. ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයාත්, අශ්‍රැතවත් පෘථග්ජනයාත් අතර විශේෂත්වය මෙයයි.

ආර්‍ය ශ්‍රාවකයින් ඇතුළු ප්‍රඥාවන්තයින් මෙම අෂ්ට ලෝක ධර්ම ස්වභාවය නුවණින් දැන ඔහුගේ සිත ඉෂ්ටාරම්මණ තුළින් කැලඹීමට පත් නොකර ගනී. අනිටු අරමුණුවලින් ගැටීමක් ද ඇතිකර නොගනී. ඉෂ්ටාරම්මණ කෙරෙහි ඇලීමෙන් හෝ ගැටීමෙන් සිත මුදවාගෙන, ක්ලේශයන් ප්‍රහීන කළ සිත ඇති ආර්‍ය ශ්‍රාවකයා ප්‍රඥාවෙන් නිවන් මග හෙළිකර ගනී. මෙම අටලෝදහම සනාථන දහමකි. ලෝකය ඇතිවූ දා සිට ඇතිවෙමින්, පෙරළෙමින් පවත්නා ස්වභාවයකි. ලොව උපන් සෑම මනුෂ්‍යයෙක්ම මෙම අටලෝදහමට මුහුණ දිය යුතුමය. අශ්‍රැතවත් පුහුදුන් මිනිසා මෙන් අටලෝදහමෙහි නොඇලී, කම්පා නොවී, නොසෙල්වී සිටිය හැකිනම් එය ඉතාමත්ම අගනේය. බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා මෙම ලෝක ධර්මයෙහිලා කම්පා වූයේ නැත. අකම්පිතව නොසැලී සිටියහ. එහි අනිත්‍යතාවය මැනවින් දත්හ. අටලෝදහමින් නොසෙල්වී ලාභය හෝ, අලාභය හෝ, අයස හෝ යස හෝ, නිඳාව හෝ ප්‍රසංසාව හෝ, සුඛ හෝ දුක්ඛයේ දී ආර්‍ය ශ්‍රාවකයන් වහන්සේලා, නොසැලී, නොකලකිරී, උපේක්ෂා සහගතව සිටියහ.

තමන් කෙරෙහි ප්‍රසංසා කරන, ගෞරව බුහුමන් කරන, ලාභ ප්‍රයෝජන ගෙන දෙන අය කෙරෙහි සතුටට පත්වී ඔවුන් කෙරේ ඇල්ම ඇතිකර ගැනීම හා අවමන් කිරීමක් හෝ කිපීමක් හෝ වෛර කිරීමක් හෝ හමුවේ ගැටීම විරෝධය ඇතිකර ගැනීම ද, ඒ ඉෂ්ට වස්තූන් කෙරෙහි ඇලීමක් හෝ, අනිෂ්ට වස්තූන් කෙරෙහි පිළිකුල් බවක් හෝ බැහැර කිරීමක් ඇති කර ගැනීම ද යන ගතිය ලෝකයේ පවතිනා සාමාන්‍ය ස්වභාවයයි. මෙම ලාමක ස්වභාවය පවත්නා තාක් සසර දුකින් මිදීමට නොහැකි බව ආර්‍ය ශ්‍රාවකයන් දැන ගනී. එබැවින්ම උන්වහන්සේලා ලාභ, අලාභ, යස, අයස යන මේ අටලෝදහම්හි සමසිත් ඇතිව උපේක්ෂා සහගතව කටයුතු කරති. කොටසකට ඇලුම් කරන, කොටසකට වෛර කරන තැනැත්තාට කිසිදු යහපත් ක්‍රියාවක යෙදෙන්නට නොහැකි වනවා ඇත.

උපේක්ෂා සහගත සිතක් ඇති කෙනෙකුට අටලෝදහම්හි නොසැලී සිටීමට හැකිය. මේ අටලෝදහම්හි මධ්‍යස්ථව සිටින තැනැත්තාට එහි අනිත්‍ය බව ගැන අවබෝධ කරගත් තැනැත්තාට ලෝක ස්වභාවය මැනවින් දැන අටලෝදහම්හි කම්පා නොවී මධ්‍යස්ථව කටයුතු කළ හැකි වේ. අටලෝදහම්හි, ලාභ අලාභ කෙරෙහි මධ්‍යස්ථව සිටිය හැකි නම් ජීවිතය වඩාත් සාර්ථක කරගත හැකිය. ජීවිතයේ හැමදාම හැමවිටම ලාභම උපයා ගත නොහැකිය. අටලෝදහම පෙරළෙන සුළු බැවින් ලාභය සමඟ අලාභයට ද ළං ළංව මුහුණ දීමට සිදුවෙයි. අතීතයේ මෙන්ම වර්තමානයේ ද ධනය හමුවේ සොම්නස් වන ධනවතුන් ප්‍රකෝටිපතියන් බවට පත්වී උන්හිටි ගමන් බලාපොරොත්තු නොවූ ආකාරයට අඥානවන්තව වැඩ කිරීමෙ ප්‍රතිඵලයක් වශයෙන් ධන හානියට පත්ව අන්ත අසරණව දිළින්දන් බවට පත්වූ අවස්ථා කොතෙකුත් වර්තමාන සමාජයෙහි ද දක්නා ලැබෙන ධර්ම ස්වභාවයකි. අධර්මයෙන් ලබන ලාභයට වඩා ධර්මයෙන් ලබන අලාභය වඩා උතුම්ය. ලාභයක් ලැබුණු විට උඩගු වීමත්, අලාභයක් ලැබුණු විට කණස්සලු වීමත් පුහුදුන් පුද්ගලයාගේ පිළිවෙතයි.

බුද්ධාදී උත්තමයෝ ලාභ අලාභ දෙකෙහිම අකම්පිතව කණස්සලු නොවී ලැබෙන ආකාරයට ඉවසීමෙන් කටයුතු කළහ. කෙනෙකුට යස අයස ද හැමදා එකසේ නොලැබේ. ඒවා ද පෙරළෙන සුළුය. කීර්ති ප්‍රසංසා හැමදාම ලද නොහැකිය. නිඳාව ද එසේමය. ඒවා විටින් විට මිනිසාට උරුමවන ධර්ම ස්වභාවයන්ය. බුද්ධාදී උතුමන්ට ද කීර්ති ප්‍රසංසා මෙන්ම නිඳාව ද, අයස ද ලැබුණු වාර බොහෝය. බුදුහිමියන්ගේ අනන්ත අප්‍රමාණ ගුණයන්ට අද දක්වාත් ලෝක සත්වයාගෙන් යසස, කීර්තිය, ගුණ ඝෝෂාව පිදෙයි. බුද්ධ කාලයේදීම දෙව්දත් තෙරගෙන්, අන්‍ය තීර්ථකයන්ගෙන් උන්වහන්සේට එල්ල කරන ලද අපකීර්තිමත් නිඳා, අපහාස, දෝෂාරෝපණ අපමණය. එබඳු අවස්ථාවල දී උන්වහන්සේ කිසිවෙකින් නොසැලී නිර්දෝෂී බැවින් මුලාවට පත් නොවී මෛත්‍රී සිතින් ඒවා ජයගත් හැටි බුද්ධ චරිතයෙන් දක්නා ලැබේ. නිඳා, ප්‍රසංසා ද වරින් වර ලබන්නට සිදුවේ. අවමන් කිරීමේ දී කම්පාවට පත්වී, ගුණ ගායනා කිරීමේදී සොම්නසට පත්වීමත්, නිඳාවේ දී කම්පාවට පත් වී ප්‍රශංසාවේ දී සොම්නසට පත්ව පිම්බී කටයුතු කිරීමත් නොකළ යුතුය. ලෝකයේ නිඳාවට පාත්‍ර නොවන කෙනෙක් ඇත්තේම නැත. නිඳාවට මෙන්ම ප්‍රසංසාවට පත්වීම ලෝක ස්වභාවයයි. නිඳාවත් ප්‍රසංසාවත් එකසේ දරාගැනීමට ශක්තිය ඇතිනම් ජීවිතය නොසැලී ඉදිරියට පවත්වාගෙන යා හැකිය. බුද්ධි හීනයන්ගෙන් ලබන කීර්තියට වඩා නුවණැතියන්ගෙන් ලබන අපකීර්තිය උතුම්ය. අනුවණයන්ගෙන් ලබන ප්‍රසංසාවට වඩා නුවණැතියන්ගෙන් ලබන ගර්හාව උතුම්ය. කාම සුඛයට වඩා විවේකයෙන් ලබන දුක උතුම්ය. ආර්‍ය ශ්‍රාවකයන් වහන්සේ මේ දෙකෙහිම සමව පවතී. කීර්තියේ දී උඩගු වීමත්, අපකීර්තියේ දී කම්පා වීමත් පුහුදුන් මිනිසාගේ ස්වභාවයයි. ශ්‍රමණයන් වහන්සේලා කීර්ති අපකීර්ති දෙකෙහිම යස අයස දෙකෙහිම සමව පවතී. ශ්‍රමණයන් වහන්සේලා නින්දා ප්‍රසංසා දෙකෙහිම සමව පවතිතත් පුහුදුන් මිනිසුන් ප්‍රසංසාවේ දී උඩගු බවටත් නුගුණ කීමේදී කම්පාවටත් පත් වෙයි. ශ්‍රමණයන් වහන්සේලා නින්දා ප්‍රශංසා දෙකේදීම සමව පවතී.

දුක සැප ද රථ රෝදයක් මෙන් කැරකෙමින් අප කරා එළඹෙයි. දුකේදී කම්පාවට පත්ව ලතවන්නටත්, සැපේදී උද්දාමට පත්ව පිම්බෙන්ටත් යතොත් ඔහුගේ ජීවිතය සාර්ථක කරගත නොහැකිය. දුකේදී මෙන්ම සැපේදීත් මධ්‍යස්ථව එය විඳ දරාගත හැකිනම් ජීවිතය ජයගත හැකිය. ප්‍රඥාවෙන්, වීර්යයෙන් කටයුතු කිරීමෙන් ජීවිතය ජයගත හැකිය. අෂ්ට ලෝක ධර්මයට අනුව සත්වයාට ඇතිවන්නා වූ යහපත හෝ අයහපත ලොව කිසිවෙකුටත් වළකාලිය නොහැකිය.

මහත් දුකට පත්ව බුදුන් හමුවට පැමිණි අයට දුක නිවාගන්නා ආකාරය උන්වහන්සේ මහත් අනුකම්පාවෙන් පෙන්වා දුන් සේක. කිසාගෝතමිය ස්වකීය සෙනෙහෙබර දරුවා මියගොස් අධික දුකට ශෝකයට පත්ව බුදුන් හමුවට පැමිණ විට ඒ දුක නිවා සනහා ඇයට ධර්ම මාර්ගය දේශනා කර සසරින් එතෙර කළ සේක. පටාචාරාවගේ අනන්ත වූ නොඉවසිය හැකි දුක නිවූහ. දුක හමුවෙහි බලවත් චිත්ත ශක්තියෙන් ක්‍රියා කළ බන්දුලමල්ලිකාවගේ කතා පුවතින් ද ඇය දුක හමුවේ ඉවසීමෙන් කටයුතු කළ අයුරු මැනවින් උගත හැකිය.

සියලු සත්වයන් කෙරෙහි, සියලු වස්තූන් කෙරෙහි උපේක්ෂා සහගතව, අටලෝදහම් කෙරෙහි සම සිත පතුරුවමින් ඇලීම් විරුද්ධවීම් දෙක දුරු කරමින් ඉෂ්ටා අනිෂ්ට සත්ව සංස්කාරයන්හි උපේක්ෂා සහගතව පැවතීමෙන් අටලෝදහම කෙරෙහි මධ්‍යස්ථව විසීමට මෙම උතුම් පොහෝ දිනයේ දී අදිටන් කර ගනිමු.

තෙරුවන් සරණයි.


"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."

පූජනීය චරිත



## අවසන් අත්භවයේදී සිදුහත් කුමරුන්ගේ බිරිය වන්නට

# යශෝධරාවෝ පෙරුම් පිරූ හැටි



වෙස්සන්තර රජුගේ බිරිය ලෙස උපත ලැබූ මද්‍රී දේවිය අප බෝසතුන් සමග සංසාර සාගරය තරණය කළ පාදපරිචාරිකාවයි. ඇය යශෝධරා නම් වන්නීය. මද්‍රී දේවිය ලෙස අවසන් වරට උපත ලත් ඇය මෙලොවින් චුතව බෝසතුන් සමග තුසිත දෙව්ලොව උපන්නාය. තුසිත දෙව්ලොවද අප මහ බෝසතාණන්ගේ අග බිසව වූයේ ඇයයි. අප බෝසතාණෝ දේව ආරාධනා ලබා සුද්ධෝදන රජතුමාට දාව මහාමායා දේවියගේ කුස පිළිසිඳ ගත් කල ඇයද තුසිත දෙව්ලොවින් චුතව කෝලිය නුවර රජකම් කළ සුප්‍රබුද්ධ නම් රජතුමාගේ අග මෙහෙසිය වූ අමිතා නම් බිසවගේ කුස පිළිසිඳ ගත්තාය. අමිතා දේවිය සුදොවුන් රජුගේ නැගණිය වූවාය.

බෝසතුන් මව්කුසින් බිහිවූ එම වෙසඟ පෝ දින එම මොහොතේම ඇයද විසා නැකතින් මෙලොව උපත ලැබුවාය. රනින් අඹන ලද රූපයකට සමාන වූ හෙයින් බිම්බා යැයි නම් ලැබීය. පසුව ඇය යශෝධරා නම් වූවාය.

''මා පුතණුවෝ මහ පින් ඇතියහ. අද උන් හා එක නකත උපන් රජ දුවක් කවර දෝ හෝ'' යි තෙසැට දහසක් රාජධානි පරීක්ෂා කරවා තමන් නැගණියන් එදා දුවක ලදහයි අසාම යේළිම පුතණුවන් මතු අග මෙහෙසුන් වෙයි කියා එදවස්ම මපුතණුවන් නමින් කිරිමවුන් ලවා සියලු මඟුල්ම එක දා කරන සේ නියෝග කළහ.''

පූජාවලි කතුවරයා ඒ සිදුවීම වචනයට නගා ඇත්තේ එලෙසිනි.

සිදුහත් කුමරා වයසින් සොළොස් අවුරුද්දට පා තබත්ම නැවතත් රජ මැදුරට පැමිණියේ පණ්ඩිත බමුණු පිරිසකි.

''දීර්ඝායු වේවා මහරජතුමනි, අප කැඳවූයේ ඇයි?'' අසුන් ගැනීමෙන් පසුව ඔවුහු බැගෑපත්ව විචාළහ.

''මා පුතණුවන් දූන් සොළොස් වියට පා තබා තිබේ. ඔහුගේ අනාගතය පිරික්සීමට කැමැත්තෙමි.''

''සතර පෙර නිමිති දකින කුමරු අනිවාර්යයෙන්ම මහණ දම් පුරනවා හැර ගිහි සැප නොපතන්නේමය'' යන්න බමුණු මතය විය.

''මා පුතණුවන් බුදුවීමෙන් කම් නැත'' යැයි පැවැසූ රජතුමා නුවර සතර වටින් රැකවල්ලා සෘතු තුනට සුදුසු වූ මාලිගා තුනක් තනවා කුමාරයාගේ විවාහය ඉක්මන් කරවන්නට කටයුතු සූදානම් කළේය.

සුදොවුන් රජතුමා සුප්‍රබුද්ධ රජතුමාට පණිවුඩයක් යවමින් යශෝධරා කුමරිය තම පුතුගේ අග මෙහෙසිය සේ කැඳවා ඒමට ඇති කැමැත්ත පළ කළේය.

සිදුහත් කුමරු ගිහිගෙය අත්හැර මහණ වන බව සුප්‍රබුද්ධ රජතුමාටද රහසක් නොවීය. ''සිදුහත් කුමරු මහණට ගිය කළ මා දුව වැන්දඹුවක් වන්නී ය. ඒ නිසා මම දුව සිදුහත් කුමරුට නොදෙමි'' යි පෙරළා පණිවුඩ එවීය.

මේ පුවත ඇසූ සිදුහත් කුමරු පැවැසූ වදන් පූජාවලි කතුතුමා මෙසේ විස්තර කරන්නේය.


''සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය.

''මහණත් වෙම්මය, යශෝධරාවනුත් මට පාවා නුදුනහොත් රාජ්‍යය මට නොකැමැත්තේය.''

සිදුහත් කුමාරයාගේ බිරිය සේ සංසාරය පුරාම පියමන් කළ යශෝධරාව කෙරෙහි කුමරු හදවතේ තිබූ සෙනෙහස කෙතරම්දැයි විග්‍රහ කිරීමට තවත් වචන අවශ්‍ය කෙරේද?

යශෝධරාවෝ අවසාන අත් භවයේදී සිදුහත් කුමරුගේ බිරිය වන්නට පෙරුම් පිරුවේ දීපංකර බුදු සමයේදීය.

දීපංකර බුදුන් සමයේ රම්‍යවතී නම් නුවර බහුධන කුලයක සුමිත්‍රා නම් කුල ස්ත්‍රියක් වාසය කළාය. දිනක් එම ස්ත්‍රිය බුදුන්ගෙන් බණ අසා එන කළ එම බුදුන් ගිහි කල විසූ විශාල මන්දිරයේ විසිතුරු නෙත ගැටුණාය. පදුමා නම් වූ දීපංකර බුදුන් වහන්සේගේ ගිහි කළ බිසවගේ සුන්දර රූපශ්‍රීයද දුටුවාය. එවන් රූපයකින් යුක්ත වන්නේ කෙසේදැයි සුමිත්‍රාවෝ නුවණ ඇත්තන් විචාළාය. සිල් රැකිය යුතුය. පෙරුම් පිරිය යුතුය. එපවත් අසා තමා සතු ධන සම්පත් අතහැර දමා තවුස් වෙස් ගෙන සිල් රක්ෂා කරන්නටද පටන් ගත්තීය. මෙසේ සිල් රක්ෂා කරන ඇයගේ එකම පැතුමක් විය.



''මේ රැස්කරන්නා වූ පිනෙන් මමද රූපශ්‍රීයෙන් අගතැන් පැමිණ මතු බුදුවන බුදු කෙනකු ගිහි ගෙය වසන කල ඔහුගේ අගමෙහෙසිය වෙම්වා.''

මෙසේ ප්‍රාර්ථනා කරමින් උදේ සවස නොයෙක් අයුරින් කුසල් රැස් කරන්නා වූ එම පරිබ්‍රාජිකාවෝ දිනක් මල් නෙලමින් සිටියදී කලබලයෙන් දුවන මහජනකායක් දුටුවාය. කාරණය විමසූ විට බුදුන් වඩින බව පසක් විණි. බුලත්, මල්, පහන්, තෙල්, සුවඳ දුම් යනාදිය අතැතිව තරග දිවීමක යෙදෙන මේ ජනකාය පසු පස ඕ තොමෝද දුවන්නට පටන් ගත්තාය. ඇය අත කිසිම පූජා භාණ්ඩයක් නොවීය. පිපුණු මානෙල් මලින් සුන්දර වූ විලක් ඇය දුටුවේ එවිටය. විලට බැස ගත් ඇය මානෙල් මල් අටක් නෙළා ගත්තාය. බුදුන් පෙරමගට වඩින අසිරිය ඇය දුටුවාය. සවණක් රැස් දුටුවාය. තේජස් රැස් මාලා විහිදුවමින් වඩින බුදුන්ගේ රූපශ්‍රීය සහ දෙතිස් අසූ ලකුණු දුටුවාය. බුදුන් වහන්සේ පසුපස වඩින 'උස්භක්ඛන්ධ' නම් තෙර දුටුවාය. එම තෙර නමට බුදුරුවට සමාන රුව ඇත්තේ උන්වහන්සේ බුදුන් වහන්සේගේ ගිහි කල ලද පුතු නිසා බව ඈ පසක් කර ගත්තාය.

එකෙණෙහි ඇගේ සිතේ නැවතත් ලැගුම් ගත්තේ දැසෙහි මැවෙන්නට වූයේ බුදුනුවන්ගේ ගිහිකළ බිරිය වූ පදුමා නම් බිසවයි. මෙවන් සැමියෙක් ලබන්නට මෙවන් පුතණුවෙක් ලබන්නට ඇය කෙතරම් පින් කරන්නට ඇත්දැයි සිතූ සුමිත්‍රාවෝ මානෙල් මල් හිස් මුදුණේ තබාගෙන බුද්ධාලම්භන ප්‍රීතියෙන් ඔද වැඩී ගිය පහන් සිතින් පෙර පැතූ දේම යළිත් පැතුවාය.

පූජාවලි කතුතුමා ඒ පැතුම විස්තර කර ඇති සුන්දර ලීලාව මෙහි ඇතුළත් කරන්නේ ඒ බස් විලාසයත්, මවන සුන්දර දර්ශනයත් කියවන ඔබගේ සිත් සතන් තුළ සටහන් වේවා යැයි ප්‍රාර්ථනා කරමිනි.


''මේ ලෝකයෙහි පින්වත් වූ ස්ත්‍රී නම් මෙබඳු වූ ස්වාමියෙක් හට පක්ෂපාත වූ ස්ත්‍රියක් යැයි කිය කියා බලන තැනැත්තී පස්සෙහි වඩනා උස්භක්ඛන්ධ නම් වූ පුත් මහතෙරුන් සඳුට අනූන වූ නකත් තරුවක් සේ දිළිසෙන්නවුන් දැක බුදුන්ගේ ශ්‍රී මුඛය හා පුතණුවන් වහන්සේගේ ශ්‍රී මුඛය හා එක්වැනි සේ බලා බුදු කෙනකුන් හා එක්වැනි වූ මෙවැනි පුත් රුවනක් වදාපීම බුදු කෙනකුන්ම වැදුවා වැන්න. මෙසිරි මටත් වාසනා වේවායි සිතූහ. සෙස් ස්ත්‍රීන්ගේ රූප ශ්‍රී බලා මේ රූප ශ්‍රී මටත් වේවායි සිතීමද, පුරුෂයන්ගේ වික්‍රම බලා මේ පුරුෂයා මට වල්ලභ වේවායි සිතීමද, අනුන් දරුවන්ගේ සුරතල් බලා මෙවැනි දරු සිරි මටත් වේවායි සිතීමද සියලු ස්ත්‍රීන්ගේ ස්වභාව ධර්මයෙක්මය. ඒ කාරණයෙන් යට කී සිත සිතා බුදුන්ගේ ශ්‍රී බල බලා පුත් මහතෙරුන් එන ලීලා බල බලා පදුම නම් බිසවුන් ලද දරු සිරි සිත සිතා දෝත් බුදුන් දී බුදුන් වැඳ එන්නා වූ ඒ පරිබ්‍රාජිකාවෝ සුවන් මේ කඳුරෙහිදී දිවි දී වැදගත් බෝධිසත්වයන් දැක මේ සුමේධ තාපසයෝ මහණෙනි, මතු ගෞතම නම් බුදු වෙතියි පෙර කී සේ බුදුන් වදාළ විවරණ කතා අසා මගේ ප්‍රාර්ථනාව අද මේ වීර පුරුෂයා නිසා ඒකාන්තයෙන්ම සිද්ධ වෙම්යයි එමවිටම බෝසතුන් කෙරෙහි ප්‍රේම බැඳ තමා ගෙන ගිය මහනෙල් මල් අටකළමින් පස් කළඹක් ගෙන තෙල පිනින් පස්මරුන් බින්ද මැනවැයි කියන්නා සේ, බෝසතුන් නමට පුදා මතු තුන්පායෙහි එක්ව සුව විඳීමට කාරණා පානා සේ මොහු තුන්කළඹක් තමන් නමට පුදා මේ ස්වාමීහු මතු බුදුවන කල් දක්වා මොහු සිත් සේ වාසය කොට මොහු බුදුවන ජාතියෙහි මේ බුදුන් දැන් විවරණ කතාවෙහි වදාළ යශෝධරා නම් අගබිසෝ තනතුර මටම ලැබවයි, තවද මෙම බුදුන් වදාළ රාහුල නම් පුත්රුවන මාගේ කුසින්ම වදා දෙම්වයි මෙසේ තුන්යළක් පැදකුණු කොට ප්‍රාර්ථනා කළාහුය.''

පූජාවලියේ කතුතුමා යශෝධරාවන්ගේ ප්‍රාර්ථනය මොන තරම් රමණීය ලෙස හුවා දක්වා තිබේද?

එක ස්වාමියකුට තිර සේ පෙම් කරමින් එකම ස්වාමියකු පතමින් බිරියක්, මවක් විසින් ඉටු කළ යුතු යුතුකම් සෙනෙහෙබරව ඉටු කරමින් දිවි ගෙවාලූ යශෝධරාවෝ වරම් පැතූ දින සිට නිවන් දක්නා මොහොත දක්වා සංසාර ගමනක යෙදුණේ බෝධිසත්වයන්ගේ බිරිය ලෙසිනි. ඇය පරමාදර්ශී උතුම් චරිතයකි.

ශ්‍රියා රත්නකාර

''යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත.''



# ඔබ මානසික ආතතියෙන් පෙළෙන්නේද?

ශ්‍රී ට වසර 2635 කට පමණ පෙර භාරත දේශයේ උපත ලැබූ භාරත පුත්‍ර රත්නය වූ සිදුහත් මහ බෝසතාණෝ පෙර භවයන්හි පුරුදු පුහුණු කළ අයුරින් භද්‍ර යෞවන වයසේදී කුමර හා රජ සැපට වඩා සැපක් තමා තුළම සැඟවී ඇති බව වටහාගෙන "කිං කුසල ගවේෂී" "කුසල් යනු කිම?", "කිං සච්ච ගවේෂී" "සත්‍යය යනු කිම?" යන ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රායෝගිකව සෙවීම හෙවත් "ආර්ය පර්යේෂණය" ආරම්භ කළහ.

පරම සත්‍යය සොයා ගිය ගමනේදී නොයෙකුත් ගුරුවරුන් හමුවී ඔවුන්ගේ ඉගැන්වීම් අනුගමනය කළත්, තමා තුළ සැඟවී ඇති සැබෑ සාමය හා සැනසීම සෙවීමට ඒ ඉගැන්වීම් උපකාර නොවීය. සය වසරක් දැඩි වීර්යය හා දැඩි අධිෂ්ඨානය පෙරටු කර ගෙන ගිය ගමනේදී අන්තගාමී දුකත්, අන්තගාමී සැපත් තම විමුක්තියට බාධාවක් බව වටහා ගත්හ.

මේ අන්ත දෙකින් බැහැර වී මැදුම් පිළිවෙත අනුගමනය කිරීමට අදිටන් කර ගත් බෝසතාණෝ ශීල, සමාධි, ප්‍රඥා ගුණ සපිරෙන දහම් බස තුළින් තමා තුළ සැඟවී තිබූ හා ලොවට හෙළි කළ හැකි පරම හා සදාතනික සැබෑව හෙවත් චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගත් සේක.

ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ අවබෝධ කර ගත් සැබෑව හෙවත් යමක යථා ස්වභාවය අද විද්‍යාවෙන් හා තාක්ෂණයෙන් දියුණු සමාජය තුළ වඩ වඩාත් දීප්තිමත් වී ඇත. පෙරදිග මෙන්ම අපරදිග බුද්ධිමත්හු බුදු දහම පිළිබඳ රුචියක් දක්වන්නේද මේ සැබෑව දීප්තිමත් වූ නිසාවෙනි.

බුදුරජාණන් වහන්සේ අපට සාමය ඇති කර ගැනීමට දෙසූ මග කිසිදු දිනක වෙනස් නොවන මගකි. එනම් පළමුව තමා තුළ හෙවත් තම චිත්ත සන්තානය තුළ සාමය ඇති කර ගැනීමකි. සිත සංවර වූ විට වචනද, ක්‍රියාද සංවරය.

මිනිස් සිත තරම් අසිරිමත් හා ඉතා බලවත් දෙයක් මෙලොව නැත. අද ලොව තුළ සැලසුම් කර ඇති සියල්ලම මිනිස් සිතේ බලයයි. එහෙත් බොහෝ විට බොහෝ දෙනා මෙය යොදා ඇත්තේ වැරදි මාර්ගයකටය. ඒ සඳහා අද සමාජය තුළ පැන නැගී ඇති ප්‍රශ්න හා ගැටලු සාක්ෂි දරති.


යමෙක් යම් විටෙක සමාහිත සිතෙකින් යම් කටයුත්තක් ආරම්භ කළේ නම් කිසි විටක කිසිවකුට එයින් පීඩාවක් සිදු නොවේ. එහෙත් බුදු සමිඳාණෝ අපට ඉගැන්වූ දහම් මාර්ගයෙන් ප්‍රයෝජන ගැනීම සුලභය.

මිනිසා බොහෝ දේ තුළින් ප්‍රයෝජන ගත්තත්, ප්‍රයෝජන ගත යුතුම සිත ප්‍රයෝජනයට ගන්නේ, පාවිච්චි කරන්නේ ඉතාම සුළු වශයෙනි. මිනිස් ජීවිත ලබාගෙන සිටින බහුතරයක් අද ඒ ගැන ගැඹුරට නොසිතති.

සිතීමේ ශක්තිය තුළින් නියම ප්‍රයෝජනය ගත්තේද සම්මා සම්බුද්ධ, පසේබුද්ධ, මහරහත් උතුමන් වහන්සේලා බවට පත්වූ බෝසත්වරු පමණ යැයි කීම නිවැරදිය.

සම්මා සම්බුදු සමිඳුගේ තෙමඟුල සිහි කෙරෙන මෙවන් යුගයක, අවංකව අප බොදුනුවන් ලෙස විශේෂයෙන් වටහා ගත යුත්තේ දුකෙන් නිදහස් වීමේ මගය. මිනිස් ලොව වසන සෑම මිනිස් සාමාජිකයකුගේම ජීවිත කායික හා මානසික දුක්වලින් ගොනුවී ඇත. කායික පීඩාවන්ට යම් ප්‍රතිකාරයක් තිබුණද මානසික පීඩාවන්ට දහම් පිහිට හැර වෙන පිහිටක් හෝ ප්‍රතිකාරයක් නම් නැත. සම්මා සම්බුදු හිමිගේ උපත වැදගත් වන්නේ එවිටය. නැවත නැවත ඉපදෙමින්, මැරෙමින් යන මේ භයානක සසර ගමනේදී නොයෙකුත් භයානක පීඩාවන්වලට මුහුණ දීමට සිදුවේ. මිනිසකු හෝ දෙවියකු හෝ බ්‍රහ්මයකු හෝ වේවා ඒ දුක වෙනසක් නොවේ. යම් විටෙක අකුසල පක්ෂය බලවත් වී ඉතා දුක්ඛිත හා ශෝකජනක උපතක්, තිරිසන් භවයක් ලැබුණොත් ඒ ස්වභාවයෙන් කෙදිනක ගොඩ එන්නේද?


සමහර විට ඔබ සැප පහසුවත්, ධන, දේපොළ, මිල මුදල්, බලය හා පිරිස අතින් ශක්තිමත්ව සම්පූර්ණව සිටීම නිසා ඔබ සිතාවි ඔබට දුකක් නැති බව. නමුත් ඔබට වැළඳෙන අසනීපයකින් ඒ සියලු ධනය හා බලය අභිබවා ඔබ මානසික පීඩාවෙන් තෙරපී, මානසික රෝගියකු වීමට පුළුවන. මානසික වේදනාව හා පීඩාව සුව කිරීමට ඔබේ ධනයට හෝ බලයට හෝ බල පිරිසට හෝ හැකියාවක් නැත. ඒ සඳහා පිහිට වන්නේ ඔබ පුරුදු පුහුණු කරගත් යහපත් සිත පමණය.



වත්මන්හි විශ්ව සමාජය තුළ යම් ගැටලුවක් හෝ නොසන්සුන් භාවයක් උදාවී ඇත්නම් එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ සෑහීමකට පත් නොවන ආශාව හෙවත් බලවත් තණ්හාවය, කිසිදු සෑහීමකට හා සතුටට පත් කළ නොහැකි මේ තණ්හාව නමැති පිපාසයට නොවරදින සැබෑ පිළිතුරු සොයා තණ්හාවේ ස්වභාවය හෙළි කළේත්, එයින් මිදීමේ මග දේශනා කර වදාළේත් සම්මා සම්බුදුරජාණන් වහන්සේය.

පූජ්‍ය හොරච්පතානේ සතින්ද්‍රිය හිමි

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."



# නිවැරදිව භාවනා කරන හැටි ඉගෙන ගන්න

සමාජයේ බහුතරයකට "භාවනාව" යනු කුතුහලය දනවන්නකි. භාවනාව වචනයක් ලෙසින් පමණක් දන්නා පුද්ගලයා එය ප්‍රායෝගික කරගැනීම පිළිබඳ කුතුහලයකින් යුක්තය. භාවනාවේ ප්‍රායෝගිකව යෙදෙන තැනැත්තා එහිදී මතුවන ගැටලු පිළිබඳව කුතුහලයකින් පසුවේ. මේ ප්‍රශ්නෝත්තර මාලාව පළවනුයේ ඒ පුද්ගල දෙකොට්ඨාසයම වෙනුවෙනි.

විපස්සනා භාවනාවට ප්‍රවේශයක් ලබාගැනීමේ සිට එහි පරිණත වීම දක්වා උත්සාහයේදී පැන නගින ගැටලු සරලම තැන සිට මෙහිදී විග්‍රහ වේ.

**1. භාවනා කිරීම සඳහා උචිත ස්ථානය කුමක්ද?**

භාවනා කිරීම සඳහා වනාන්තරයක ගසක් මුල හෝ අන් කවර නිහඬ ස්ථානයක් යෝග්‍ය බව බුදුරජාණන් වහන්සේ උපදෙස් දී ඇති සේක.

**2. භාවනා කිරීම සඳහා යෝගාවචරයා කවර අන්දමින් හිඳගත යුතුද?**

නිහඬව, ශාන්ත ලෙස බද්ධ පර්යංකයෙන් හිඳගත යුතු බවට උන්වහන්සේ අනුශාසනා කොට ඇති සේක.

**3. කොන්දේ අමාරුව වැනි ශාරීරික ආබාධයන්ගෙන් පෙළෙන අය කෙසේ හිඳගත යුතුද?**

ශාරීරික දුබලතාවලින් පෙළෙන අයට අපහසු බව හැඟෙනවා නම් කවර පහසු ඉරියව්වකින් වුවද හිඳගත්තාට වරදක් නැත. එවැන්නන් පහසු භාවනා ආසනයක හෝ පුටුවක වාඩි වුණාට වරදක් නැත. කෙසේ වුවද කොන්ද කෙළින් තබාගෙන ඍජුවත්, සැහැල්ලු ලෙසටත් හිඳගත යුතුය.

**4. භාවනා යෝගියා කොන්ද කෙළින් තබාගෙන ඍජු ඉරියව්වකින්ම හිඳගත යුතු වන්නේ ඇයි?**

කොන්ද කෙළින් තබාගෙන ඍජු ඉරියව්වකින් හිඳ ගැනීමට උපදෙස් දීමේ හේතුව දුන ගැනීම එතරම් අපහසු නැත. නැමුණු, වක ගැසුණු කොන්ද ඉක්මනට වේදනා ගෙන දෙයි. ඒ හැරත් වෙනත් බාහිර උදව්වක් නැතිව සිරුර ඍජුව තබා ගැනීම සඳහා ගනු ලබන අතිරේක උත්සාහය භාවනා අභ්‍යාසය වීර්යවන්ත වීමට හේතුපාදක වේ.

**5. භාවනාව සඳහා සුදුසු ඉරියව්වක් තෝරා ගැනීම එතරම් වැදගත් වන්නේ ඇයි?**

නිරවුල් මනසක් ඇතිකර ගැනීම සඳහා සිරුර නිශ්චලව තබාගත යුතු බවට අප වගබලා ගත යුතු බව පැහැදිලිය. ඒ නිසා දිගු කාලපරිච්ඡේදයක් ඉඳගෙන සිටිය හැකි යෝග්‍ය සුවපහසු ඉරියව්වක් තෝරා ගැනීම අත්‍යවශ්‍යය.

**6. පහසු ඉරියව්වකින් හිඳගැනීමෙන් පසු යෝගියාකළ යුත්තේ කුමක්ද?**

දෙනෙත් පියාගන්න. දූන් ඔබේ අවධානය උදරයට යොමු කරන්න. ආයාසයකින් තොරව, හිමිහිටවත්, ඉක්මනටවත් නැතිව සාමාන්‍ය පරිදි හුස්ම ගන්න.

**7. ආශ්වාසයේදී හා ප්‍රශ්වාසයේදී ඔබ අවබෝධ කර ගන්නේ කුමක්ද?**

ආශ්වාසයේදී හුස්ම ඇතුළට ගැනීමත් සමග උදරයේ පිම්බීමක් ඇතිවන බවත්, ප්‍රශ්වාසයේදී හුස්ම පිට කිරීමත් සමග උදරයේ හැකිලීමක් සිදුවන බවත්.

**8. ඔබේ මූලික අරමුණ වඩාත් තියුණු කරගන්නේ කෙසේද?**

ආශ්වාස, ප්‍රශ්වාස ක්‍රියාවලියේ සෑම අවස්ථාවකදීම ඒ පිළිබඳව සිහියෙන් යුක්තව කටයුතු කිරීමට වගබලා ගැනීමෙන් ඔබේ අරමුණ තියුණු කරගත හැකිය. ආශ්වාසයේදී උදරයේ පිම්බීමේ ක්‍රියාවලියේ මුල සිට අවසානය දක්වාම ඒ පිළිබඳව දූඩි අවධානයක් සහිතව පවත්වාගෙන යන්න. එලෙසින්ම ප්‍රශ්වාසයේදී උදරයේ හැකිලීමත් සමග එම ක්‍රියාවලියේ මුල සිට අවසානය දක්වා අවධානය යොමු කරන්න.

**9. මෙම භාවනා අභ්‍යාසයේදී (අඛණ්ඩ) උත්සාහය සහ නිවැරදි එල්ලය යන දෙකම වැදගත් කොට සලකන්නේ ඇයි?**

උත්සාහය සහ නිවැරදි එල්ලය යන දෙකම ඇති විට දූනීම්, අත්දූකීම් දෙසට කෙළින්ම හා බලවත්ව යොමුවන බැවින් මේ දෙකම මෙහිදී ඉතා වැදගත් වේ.

**10. වඩාත් නිශ්චිත හා නිවැරදි වීම් සඳහා උපකාරයක් විය හැකි එක් මාර්ගයක් දක්වන්න.**

අරමුණු කරන දෙය වැටහෙන ආකාරය අනුව නම් කරමින් "පිම්බෙනවා, පිම්බෙනවා" හෝ "හැකිළෙනවා, හැකිළෙනවා" යනුවෙන් තමා වටහා ගත් දෙය සිතින්ම නම් කිරීම නියත හා නිවැරදි අවධානයක් ඇතිකර ගැනීම සඳහා උදව් විය හැකි එක් මාර්ගයකි.

**11. සිත අරමුණින් ඉවතට පැන බාහිරයට යෑම අනුව වෙන යමක් සිතන්නට වූ විට යෝගියා කළ යුත්තේ කුමක්ද?**

මේ අවස්ථාවේ සිතේ ක්‍රියාකාරකම් බලන්න. අඩු තරමින් ඔබ හිතන බව හෝ වටහා ගන්න.

**12. සිතීම පිළිබඳ වැටහීම පැහැදිලි කරගන්නේ කෙසේද?**

නිශ්ශබ්දවම සිතුවිල්ල පිළිබඳ "හිතනවා, හිතනවා" යනුවෙන් මෙනෙහි කොට පිම්බීම-හැකිලීම වෙත ආපහු එන්න.

**13. උදයේ පිම්බීම හා හැකිලීම වැනි එකම අරමුණක් කෙරෙහි නිරන්තරයෙන්ම අවධානය යොමුකර ගෙන සතියෙන් සිටීමට කිසිවකුටත් හැකියාවක් තිබේද?**

යෝගියා ඒ සඳහා උත්සාහ කරනවා හැරෙන්නට කිසිවකුටත් නිරතුරුවම උදරයේ පිම්බීම - හැකිළීම කෙරෙහි එක එල්ලේ දිගටම අවධානය යොමුකර ගෙන සිටීමට පුළුවන්කමක් නැත. අනිවාර්යයෙන්ම වෙනත් අරමුණු පැන නැගී ඉස්මතු වන්නට පුළුවන. භාවනා කරගෙන යන විට දූකීම්, දූනීම්, ශබ්ද, ගඳ, සුවඳ, ආඝ්‍රාණ, රස, ශාරීරික වේදනා හෝ සිතුවිලි මගින් හෝ හැඟීම්වලින් හටගන්නා චිත්ත රූප වැනි බාහිර අරමුණු අපේ භාවනා අරමුණු වසා ගන්නවා ඇත. එවැනි කවර හෝ බාහිර අරමුණක් ඉස්මතු වූ විටෙක යෝගියාගේ ඍජු අවධානය එයටම යොමු කොට ඒ අනුව නම් කරමින් සිතින් මෙනෙහි කළ යුතුය.

පූජ්‍ය මිහිරිගල ධම්මජීව හිමි



"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."



# නිර්මාංශ ආහාරයට හුරු වෙමුද?


**"සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා<br>පචිත්ත පරියෝ දපනං - ඒතං බුද්ධානු ශාසනං"**

ලොවට උතුම් ධර්ම දේශනා කළ සෑම බුදුවරයන්ගේ උතුම් ධර්ම දේශනාව වූයේ "අකුසලයට බිය වන්න කුසල් වඩන්න" යන්නයි. අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේගේද ශ්‍රී මුඛයෙන් දේශනා කළ ධර්මයද වූයේ "සියලු සත්වයින්ට මෛත්‍රී කරන්න" යන්නයි.

අද ලෝකයේ සෑම තැනකම බුදු දහම ප්‍රචලිතව පවතී. විදේශිකයන් පවා නිර්මල බුදු දහම ගැන අවබෝධය ලබාගෙන බුද්ධ ශාසනයට ඇතුළුව බණ භාවනා කරමින් මෙම ජීවිතයේ නිසරු බව අනිත්‍ය මෙනෙහි කරගෙන ලෝකෝත්තර ජීවිතයට ලැදිව කටයුතු කරති.

එදා මිහිඳු මහරහතන් වහන්සේ පොසොන් පොහොය දින මිහින්තලා ගල මතට නගින විටද එදා අශෝක රජතුමා දඩයම් කෙළියේ යෙදී සිටි දිනක් විය. මිහිඳු මාහිමියන්ගේ ලංකා ගමනේ උතුම් ප්‍රතිඵලයක් ලෙසට සිංහලයනට උතුම් නිර්මල බුදු දහම වැළඳගෙන කටයුතු කිරීමට වාසනාව උදාවුණි.

බුදු පියාණන් දේශනා කළ ධර්මයට අනුව මෙම උතුම් ධර්මය අවබෝධ ඥානයෙන්ම තේරුම් ගෙන ජීවිතය ජයගත යුතුව ඇත. බුදුපියාණෝ ඉදිරියේ මල් පහන් පූජා කිරීමට පළමුව බුද්ධ, ධම්ම, සංඝ තෙරුවන් නැමැද පළමුවෙන්ම පොරොන්දු වෙන ශික්ෂාපද පහකි. පන්සිල් සුරකින සමාජයක් ඇතිවීමට නම් මෙම ශික්ෂාපද පහ කඩ නොකර ආරක්ෂා කිරීම සෑම සිංහල බෞද්ධයෙක්ගේම උතුම් සත් ක්‍රියාවක් විය යුතුය.



පන්සිල් පද පහෙන් පළමුව පොරොන්දු වන ශික්ෂා පදය වන්නේ "මම සතුන් නොමරමි" යන අදහස දෙන "පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි" යන ශික්ෂා පදයයි. මෙයින් තේරුම් ගත යුතුව ඇත්තේ පණ තියෙන කිසිම සත්වයෙක් නොමැරීමටත්, මැරීමට අනුබල නොදීමටත් පොරොන්දු වෙන ශික්ෂා පදයක් බව තේරුම් ගැනීමයි.

සිංහල බෞද්ධයන් වන අපට ඇත්තෙන්ම මෙම පළමු සිල් පදය රකිනවාද - නොදැනුවත්කමින් හෝ මෙම ශික්ෂා පදය කැඩෙන ලෙසට අප කටයුතු කරනවාද කියා අවබෝධයෙන් තේරුම් ගැනීමට දැන්වත් උනන්දුවීම සිංහල බෞද්ධයන්ගේ උසස්ම සිතුවිල්ලක් විය යුතුව ඇත.


"සියලු සත්වයන්ට මෙත් වඩන්න" තථාගත බුදු පියාණන් දේශනා කළ ධර්මය සිංහල බෞද්ධයන් ඒ ලෙසට පිළිපදිනවාද යනු සැකයකි.

අප සැමදෙනාම අපේ ජීවිතයට ආදරය

කරනවා සේම තිරිසන් සතුන් ඇතුළුව සියලු සත්වයන්ද තම තමාගේ ජීවිතයට ආදරය කරති. ඒත් අද සිංහල බෞද්ධ රටක දිනකට සිදුකරන සත්ව ඝාතන කොපමණද? මෙම සියලු සතුන්ගේ බෙලි කැපෙන්නේ මිනිසාගේ කට, දිව රස කිරීමට තිබෙන ආශාව නිසාමය.

රටේ ආර්ථිකය ඉහළ නැංවීමට මාංශ වෙළෙඳාම ප්‍රධාන ඉලක්කයනට ගෙන ඇත. රට ආර්ථිකත්වයෙන් දියුණු වන විට එක පැත්තකින් රටේ පිරිහීම මිනිසාගේ සාරධර්ම පිරිහීම ඇතිකරයි. මස්, මාළු කෑමට ප්‍රියතාව දක්වන මිනිසාගේ ආධ්‍යාත්මික තත්ත්වය ඔවුන් නොදැනීම විනාශයට පත්වෙයි. මිනිසාගේ මානසික පිරිහීම මෙන්ම ශාරීරික පිරිහීමද ක්‍රමයෙන් වර්ධනය වෙයි.

අධි ශීතකරණවල තබා සති, මාස ගණන් කුණු කරන මස්-මාළු රස කර කර ගිල දමන විට ඔවුන් සිතන්නේ එම වේලාවට ලබන රස බව පමණයි. ඉන්පසු කාලයක් යනවිට මෙහි ප්‍රතිඵලය වන්නේ සොයා ගැනීමට අපහසු රෝග පීඩාවන් නිසා රෝගීව දුක් විඳීමට සිදුවන අසරණ තත්ත්වයට පත්වීමයි.



බුදු දහමට අනුව බලන විට මෛත්‍රී භාවනාව වැඩීමටද මාංශ ආහාර ගැනීම බාධාවකි. ශරීරයට තලා පෙලා දස දුක් වේදනාවන් දී මරා මස් කළ සතකුගේ මාංශ අනුභවයට ගත් අයගේ මෛත්‍රිය කෙසේ විය යුතුද කියා සිතිය යුතුයි.

අප සිංහල බෞද්ධයන් අනවබෝධයෙන් කටයුතු කිරීම හේතුවෙන් අද බුදුන් වහන්සේට පූජා කරන බුද්ධ පූජාවටද මෙම කුණු මස්, මාළුවලින් සකස් කළ ව්‍යංජන තිබීම බුදුන් වහන්සේටද කරන අගෞරවයකි. බුදු ගෙය මෙම මළකුණු තබා අපවිත්‍ර කරමින් පාප කර්මයන්ද රැස්කර ගනිති.

අප ස්වාමීන් වහන්සේලා මේ ගැන අවබෝධයක් මිනිසුනට ලබාදෙන්නේ නම් මේ වැනි පහත් දනයන් බුද්ධ පූජාවට තැබීමට උපාසක උපාසිකාවන් උනන්දු නොවනු ඇත.

බුදු පියාණන් දේශනා කළ ධර්මයට අනුව බලන විට අන්සතු ජීවිතයක් විනාශ කිරීම බලවත් පාප කර්මයකි. අද මාංශ ආහාරයට ලොල් වූ අය තම ගැලවීමට සිතන්නේ, කියන්නේ "අප සතුන් මරන්නේ නැත. මස් කර වෙළෙඳාමට තබා ඇති දෙය ලබා ගන්නා" බවය. මස් මාංශ ආහාරයට ගන්නා සැමදෙනාම අවබෝධයෙන් මේ ලෙසට සිතන්නට පුරුදු වූවා නම් අප මේ මුදල් වැය කර මිලට ගන්න නිසානේ අසරණ සතුන්ගේ මරණ සංඛ්‍යාව දිනෙන් දින ඉහළට යන්නේ කියා. එහෙම නම් මෙලොව පාරිභෝගිකයන් වැඩිවන්නේ නැත.

මෙසේ බලන විට මුදල් දී මළකුණු ලබන්නාත් ඔවුන් නොදැනීම පාප කර්මයට අසුවෙති. ඔවුන් නොමැරුවත් මැරීමට අනුබල දීම තවත් එක් පාප කර්මයකි. තමන් අන්සතු ජීවිතයක් විනාශ කිරීමට බාහිරව අනුබල දෙන පිරිසකි.

එම නිසා අවබෝධයෙන් බුදු දහම සරණ යන්නෝ මෙලෙස පාප කර්මයන්ට දයක නොවෙති. මෙම සත්ව මළකුණු අනුභව කිරීම, බුද්ධ පූජාවට තැබීම, සංඝයා වහන්සේලාට දනයට පූජා කිරීම සුදුසු නොවන බව තේරුම් ගෙන කටයුතු කිරීමට දැනුවත් වීම සිංහල බෞද්ධයන්ගේ යුතුකම් වෙයි. දනයක් දෙන විට ශ්‍රද්ධාව සමග ප්‍රඥුව එකතු විය යුතුව ඇත. දෙන දනය උතුම්, උසස් දනයක් වන්නේ නිර්මාංශ දනයක් සූදනම් කළ විටය. ඒ සමග දනය වළඳන ස්වාමීන් වහන්සේලාටද එම දනයෙන් මානසික ශාරීරික පැවැත්මට යහපතක්වීම තවත් කුසල කර්මයකි.

නොපෙනෙන සංසාර ගමනේ ගමන් කරන සත්වයා තිරිසන් ආත්මවල උපදින වාර අනන්තය. මරා ඇති සත්ව මාංශ හිමි සතුන් පෙර ජාතිවල තම දූ දරුවන්, මා පිය සහෝදර සහෝදරියන් වීමට පුළුවන. මෙම අත්භවයේ තමන් රස කරමින්, තලු මරමින් භුක්ති විඳින්නේ තමාගේම පෙර මව, පියා, දූ දරුවන් වීමට බැරිද?

එසේ හෙයින් නිර්මාංශ ආහාරයට ගැනීමට පුරුදු වීමෙන් යහපත් මානසික, ශාරීරික තත්ත්වයක් මෙන්ම එලොව මෙලොව යහපත පිණිස කුසල කර්මයන්ද එක්රැස්වෙයි.

සියලු සත්වයෝ නිදුක් වෙත්වා, නිරෝගි වෙත්වා, සුවපත් වෙත්වා!

**සේපාලි කරුණාරත්න**

"ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත."



# 'සුඛී දීඝායු කෝ භව'

## සුපසන් දිවිමගෙහි 76 විය සපුරන අනතිමානී ගුණයෙන් ශෝභමාන මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ අති ගෞරවාර්හ අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

" සන්තකායෝ සන්තවාචා
සන්තවා සුසමාහිතා
වන්තලෝකාමිසෝ භික්ඛු
උපසන්තොති වුච්චති "

"ශාන්ත වූ කයත් වචනයත් සිතත් ඇති ඉතාම තැන්පත් වූ ලෝකාමිෂය දුරුකළ භික්ෂුව උපශාන්ත වූවෙක් යැයි කියනු ලැබේ."

ඓතිහාසික කන්ද උඩරට දිසාවට අයත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත දිඹුල්කුඹුර ග්‍රාමයේ අතිසම්භාවනීය පෞරාණික කුල පරම්පාරාවක් වන බජ්ජල වලව්වේ රම්බණ්ඩාර නිළමේතුමාට සහ ඩිංගිරි මැණිකේ කුමාරහාමි මැතිණියට දාව 1941 ක් වූ අප්‍රේල් මස 16 වන දින ජන්මලාභය ලද පූර්වකෘත පුණ්‍යබල මහිමයෙන් ශෝභාමත් වූ කුල කුමරුවන්ට දෙමාපියන් විසින් ටිකිරි බණ්ඩාර නමින් නම් තබන ලදී.

අප ගුරුදේවෝත්තමයන් වහන්සේගේ ගිහිකල මූලික අධ්‍යාපනය දිඹුල්කුඹුරේ කනිෂ්ඨ විද්‍යාලයෙන් ලැබූ අතර අනතුරුව ඓතිහාසික මල්වතු මහාවිහාරයීය සංඝරාජ පිරිවෙණට ඇතුළත්ව තත් යුගයේ පරිවේණාධිපති ධූරය හෙබ වූ අමුණුගම රාජගුරු ශ්‍රී විපස්සී මහනාහිමි ප්‍රමුඛ සම්භාවනීය ආචාර්ය මණ්ඩලය වෙතින් ද්විතික අධ්‍යාපනය සම්පූර්ණ කළහ. ස්වකීය අධ්‍යාපනය මනාලෙස ලැබූ අප ගුරුදේවෝත්තමයන් වහන්සේ 1965 දෙසැම්බරු මස 30 වන දින පෙර පුරුදු හා පූර්වකෘත පුණ්‍ය බල මහිමය උද්දීපනය වී ප්‍රව්‍රජා වීමට අවකාශ උදාවිය. එවකට මල්වතු මහාවිහාරයේ මහානායක පදවිය හෙබ වූ අමුණුගම රාජගුරු ශ්‍රී විපස්සී මහනාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යයත්වයෙන් හා මාත්ගමුවේ ධම්මාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, ඉලුක්වත්තේ ධම්මානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ තත් ශිෂ්‍ය වතුරකුඹුරේ ඤාණවිමල යන ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ ආචාර්යත්වයෙන් පැවිදි බිමට පත් විය.

එදිනම සවස යථෝක්ත ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙන් රඹුක්වැල්ලේ ශ්‍රී සුමංගල ලේඛකාධිකාරී නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ රත්තින්දේ අනෝමදස්සී ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ කර්මවාගාචාර්යත්වයෙන් අධිශිල ශික්ෂා සංඛ්‍යාත උතුම් උපසම්පදාවෙහි පිහිටුවා වදාරණ ලද අතර එහිදී දිඹුල්කුඹුරේ විමලධම්ම යන නාමයෙන් ප්‍රකට වන්නට විය.

අප ගුරුදේවෝත්තමයන් වහන්සේ අයත් වන්නේ වර්තමාන සම්බුද්ධ ශාසනය පිහිටුවීම උදෙසා සිය ජීවිතය දෙවැනිකොට අප්‍රතිහත ධෛර්යයෙන් ක්‍රියාකළ බෝධිසත්ව ගුණෝපේත වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ සවැනි ශිෂ්‍ය රත්නය වන ඤාති මුණුපුරු වැලිවිට ශ්‍රී සරණංකර මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වූ අත්‍යුදාර ශ්‍රේෂ්ඨ සංඝ පරම්පරාවටයි.

1970 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය ලැබීමේ වරම් ලද අප ගුරුදේවෝත්තමයන් වහන්සේ පෙරදිග ඉතිහාසය පිළිබඳ ගෞරව උපාධිය ලද අතර පාලි, සංස්කෘත හා සිංහල මෙන්ම ඉංග්‍රීසි ආදී භාෂාවන් පිළිබඳව ද නිපුණත්වයක් ලබා පෙරළා මල්වතු මහාවිහාරයට වැඩමකොට ශාසනික, ජාතික මෙන්ම සාමාජික සුභසිද්ධිය උදෙසා සුවිශාල කාර්යභාරයක් ඉටුකරමින් ඒ සඳහා සිය ජීවිතය කැප කළහ. ඒ අනුව සුවහසක් සිසුනනට ඥානාලෝකය ලබාදීමට 1976 සිට ගුරුවෘත්තියට පිවිස නුවරඑළිය ශ්‍රී නිශ්ශංක විද්‍යාලය, මහ/ දොඩම්වල විද්‍යාලය, නු/ අඹගමුව විද්‍යාලය යන ආයතන වල ධර්මාචාර්යන් වහන්සේ නමක් ලෙසත් 1986 සිට 2001 වර්ෂය දක්වා මහ/ වතුරකුඹුර විද්‍යාලයේ විදුහල්පති ධූරය ද හෙබ වූහ.

ගැරඬිපිටිය පුරාණ විහාරය හා රණවන පුරාණ විහාරය මූලික කරගනිමින් සුවිශාල ශාසනික මෙහෙවරක් සිදුකළ අතර මෙම කටයුතු නිසාවෙන් අතිගෞරවාර්හ සිරිමල්වත්තේ ශ්‍රී ආනන්ද මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් කාරක සංඝ සභික ධූරයෙන් ද 2002 වර්ෂයේ දී මහෝපාධ්‍යාය පදවියෙන් ද පිදුම් ලද අප ගුරුදේවෝත්තමයන් වහන්සේ 2009 වර්ෂයේ දී අනුනායක ධූරය හෙබවූ අඹන්වැල්ලේ ශ්‍රී සිද්ධාර්ථ ප්‍රඥාසේකරාභිධාන ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අපවත් වීමෙන් පුරප්පාඩු වූ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ රාජකීය අනුනායක ධූරයට මල්වතු මහාවිහාරයේ විංශත් වර්ගික කාරක සංඝ සභාවේ සමනාච්ඡන්දයෙන් පත් වී වදාළ සේක.

බෝධිසත්ව ගුණෝපේත වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ සතුව තිබූ අනතිමානී ගුණයෙන් ශෝභමාන අප ගුරුදේවෝත්තමයන් වහන්සේ කිසිදිනෙක තාන්තමාන්න ගරු සම්මාන කරා හඹා නොගිය අතර ඒවා ආභරණයක් ද කර නොගත්හ. නිරන්තරයෙන් ම සම්බුද්ධ දේශනාව අනුව යමින් නිර්වාණය සාක්ෂාත් කරගනුවස් ක්‍රියා කළ නිසාවෙන් තනතුරු ආදිය උනවහන්සේ වෙත ගලා ආවේය.

"පටිසන්ථාර වුත්තස්ස -
ආචාරකුසලෝ සියා
තතො පාමොජ්ජ බහුලෝ -
දුක්ඛස්සන්තං කරස්සසි"

"මනා පිළිසඳරින් යුක්ත වූ ආචාරයෙහි දක්ෂ වූ භික්ෂුව එයින් ලබන මහත් ප්‍රීතිය බහුලව වැඩීමෙන් සියලු සසර දුක්ඛස්ඛන්ධය කෙළවර කරන්නේය." යන බුදුවදන වඩවඩාත් ඔපවත් කරගනිමින් සිය ජීවිතයට බද්ධකරගත් අප ගුරුදේවෝත්තමයන් වහන්සේ සසුන්කෙත බැබලවීමට සමත් ගුණනුවණින් යුතු ශිෂ්‍යපුත්‍රයන් වහන්සේලා ද ඇතිදැඩි කළහ.

ජීවිතයේ අසාරබව මැනවින් අවබෝධ කොට දුෂ්කරව ලද මෙම මනුෂ්‍යාත්මභාවය සුචරිතවත් වූවක් මෙන්ම නිර්වාණාධිගමයට මාර්ගය සකස් කරගන්නක් ලෙසත් ගතකරන අයුරු පිළිබඳව අප කාහටත් අනුශාසනා කරන මෙන්ම ස්වකීය දිවි පෙවෙත ද පරමාදර්ශීව ගත කරන අප ගුරුදේවෝත්තමයන් වහන්සේට සියක් වසක් ආයු වඩා ලෝ සසුන් වැඩ වඩා සුවෙන් දිවි ගෙවන්නට ශ්‍රී දළදා වහන්සේගේ හා බුද්ධාදී රත්නත්‍රයේ ආශිර්වාදය නිතැතින් ම ලැබේවා'යි ප්‍රාර්ථනා කරමි.

**මල්වතු මහා විහාරවාසී, අස්ගිරි මහා විහාර මහ පිරිවෙණෙහි ආචාර්ය, ගෞරව ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත,**

**පූජ්‍ය ටැම්පිටියේ ඉන්දවිමල හිමි**

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය

# පොදු දේපළ කොල්ලකෑම අනිවාර්යයෙන්ම දුගතියේ උපදින වරදක්



## මහාචාර්ය පාතේගම ඤාණිස්සර හිමි

❒ අපරාධ ලෙස ඔබවහන්සේ අර්ථ දක්වන්නේ කුමන විදියේ අපරාධද?

දණ්ඩ නීති සංග්‍රහයේ නීතිය අර්ථකථනය වෙනවා අංශ දෙකකින්. ඒ සිවිල් සහ අපරාධ වශයෙන්. සිවිල් වරදක් කියන්නේ පුද්ගලයෙක් තවත් පුද්ගලයකුට එරෙහිව කරනු ලබන වරදක්. ඒකට දඬුවම් දෙන්නේ සිවිල් නීතිය යටතේ. පුද්ගලයෙක් පොදු සමාජයට එරෙහිව කරන වරදක් අපරාධයක් ලෙස අර්ථකථනය කරනවා. අපරාධ නීතිය වඩා ප්‍රබලයි. බුදු දහම තුළ දක්වන්නේත් ඒකම තමයි.

❒ බුදු දහම තුළ එය අර්ථ දක්වන්නේ කුමන ආකාරයටද?

පුද්ගලයකු පොදු සමාජයට එරෙහිව කරන වරදකදී ඒ කියන්නේ අපරාධ වරදකදී විපාකය වැඩියි. මිනිසා කරනු ලබන කර්ම කොටස් දෙකකට බෙදෙනවා. ඒ සචේතනිකව කරන කර්ම සහ අචේතනිකව කරන කර්ම ලෙසින්. සචේතනික කර්ම කියන්නේ චේතනාව සහිතව කරනු ලබන කර්ම. අචේතනික කර්ම යනු චේතනාවකින් තොරව ඉබේ අප අතින් සිදුවන ඒවා.

❒ පොදු දේපළ කොල්ලකෑම, මහජන දේපළ අවභාවිත කිරීම වැනි කාරණා බුදු දහමේ අර්ථ දක්වා තිබෙන්නේ කොහොමද?

බුදු දහමට අනුව මරණින් පසු අනිවාර්යයෙන්ම දුගතියෙහි උපදින වරදක් තමයි ජාතික සම්පත්, පොදු දේපළ කොල්ලකෑම කියන්නේ. ඒවාත් අපරාධ වශයෙන් සැලකෙනවා. පොදු දේපළ කොල්ලකෑම කියන්නේ ඒවා පෞද්ගලික පරිහරණයට ගැනීමයි. අපරාධ නීතිය යටතේ මේවාට දඬුවම් ලැබෙනවා වගේම බුදු දහමට අනුවත් දඬුවම් ක්‍රියාත්මක වෙනවා. තම ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවීම, සමාජයේ ගැරහීමට ලක්වීම, දරු පවුල් දුකට පත්වීම ආදී විවිධාකාරයේ දඬුවම් මේ අයට නිසැකවම ලැබෙනවා.

❒ අද මෙතරම් විද්‍යුත් මාධ්‍ය තුළින් බණ අසන, බණ නරඹන සමාජයක අපරාධ මෙතරම් වැඩිවීම ඔබවහන්සේ අර්ථ දක්වන්නේ කොයි විදියටද?

විද්‍යුත් නාලිකාවල බණ දෙසීම හා මිනිසුන් බණ ඇසීම කියන්නේ කාරණා දෙකක්. කොහොම වුණත් පොදුවේ ගත්තම මිනිසුන් වැරදි කරනවා අඩුයි. රටක අපරාධ ගණනය කළ යුත්තේ මාධ්‍යවලින් අසන, දකින අපරාධවලට අනුව නෙමෙයි. එහි ජීවත් වන ජනතාවට සාපේක්ෂවයි. ඒ කොහොම වුණත් අපේ රටේ නීතිය සංශෝධනය විය යුතු පැති ගොඩාක් තිබෙනවා. තිබෙන නීති රාමුව තුළ සැබෑම අපරාධකරු නීතියට හසුවෙනවාද කියන එක ගැටලුවක්. බෞද්ධ නීතියත්, නීති විෂය නිර්දේශයට ඇතුළත් විය යුතු බවයි මගේ නම් අදහස.

❒ රටක අපරාධ අඩු කිරීමට ධර්ම දේශනා කිරීම පමණක් ප්‍රමාණවත් යැයි ඔබවහන්සේ සිතනවාද?

ධර්ම දේශනා මගින් පමණක් අපරාධ අඩු කරන්න හෝ වැඩි කරන්න බෑ. පසුගිය කාලයේ සිදුවූ ප්‍රධාන අපරාධ ගණනාවක් පිළිබඳව මා අධ්‍යයනය කළා. එහිදී මේ සඳහා බලපෑ ප්‍රධාන හේතු දෙකක් පිළිබඳව අනාවරණය කරගත හැකි වුණා. එකක් මානසික ආබාධ. දෙවැන්න මත්ද්‍රව්‍ය. බහුතරයක් අපරාධවලට මේ දෙකෙන් කුමක් හෝ එකක් සම්බන්ධයි. අපරාධ නිමා කරන්න නම් හේතුව සොයලා ප්‍රතිකර්ම යොදන්න ඕනේ. මෙයට පියවර තුනක් තිබෙනවා. පළමුවැන්න හේතුව සෙවීම. දෙවැන්න ප්‍රතිකර්ම යෙදීම. තුන්වැන්න නීතිය නිවැරදිව ක්‍රියාත්මක කිරීම.

❒ අපරාධවලින් තොර රටක් සඳහා ඔබවහන්සේ යෝජනා කරන්නේ කුමන විදිහේ ක්‍රමවේදයක්ද?

අපරාධවලින් තොර රටවල් නෑ. බුද්ධ කාලයේ තිබුණෙත් නෑ. නමුත් අපරාධ සිදුවීම අවම කරන්න පුළුවන්. මාධ්‍යවලින් මේවා අනාවරණය නොකර ඉන්න තරමට හොඳයි. මිනීමැරුම්වලට ලක්වූ කුඩා දැරියකගේ නිරුවත් මළසිරුර පවා විකුණාගෙන කනවා. අපේ රටේ සමහර මාධ්‍ය අපරාධවලට දෙන අසීමිත ප්‍රචාරයන් නතර කර ඊට වඩා ඉහළින් ඒ සඳහා ලැබෙන දඬුවමට ප්‍රචාරය දීම වඩාත් සුදුසු ක්‍රමයයි. මිනිසුන් හික්මවන එක් ක්‍රමයක් තමයි නීතිය. නීති දමන්නේ බලය තිබෙන අය. ඒ නීති නිවැරදිව ක්‍රියාත්මක වීමයි අවශ්‍ය වන්නේ.

**ඉන්දු පෙරේරා**

"යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

# දළදා වරුණ

ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## රටේ දියුණුවයි සිතේ දියුණුවයි

මුළු ලෝකයටම මානව දයාව හා සමානාත්වය ඉගැන්වූ ප්‍රථම ආගමික ශාස්තෘවරයා වන්නේ අපේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේය. එපමණක් නොව රටක් පාලනය කළ යුතු දැහැමි පිළිවෙත ගැනද ප්‍රථම පාඩම දේශපාලකයන්ට පෙන්වා දුන්නේද බුදුන් වහන්සේමය. සමාජ සංවර්ධනය ඇති කිරීම තුළින් පුද්ගල සංවර්ධනයත්, ආධ්‍යාත්මික දියුණුවත් ඇති කිරීමේ මාර්ගය ලෝ සත හට පහදා දුන්නේද උන්වහන්සේ විසින්මය. ඒ අතින් සලකා බලන විට අප බුදු පියාණන් විසින් පෙන්වා දුන් ශ්‍රී සදහම් මාර්ගය අදටත් ලොව බැබළෙමින් පවතී. බුදු සසුනේ චිරස්ථිතිය අදටත් මුළු ලෝකය පුරාම නොසැලී, නොබිඳී පවතින්නේ එබැවිනි. කරුණාව, දයාව, මුදිතාව හා උපේක්ෂාව පහදා දුන් බුදුරජාණන් වහන්සේ සියලු භේද දුරලා පුද්ගලයාගේ ආධ්‍යාත්මික ගුණාංගවලට ප්‍රමුඛස්ථානය ලබාදුන් සේක. මෙම උතුම් න්‍යාය බුදු සසුන තුළ පමණක් නොව සමස්ත සමාජය තුළම පතුරු වන්නට බුදු සම්දාණෝ සමත් වූහ. බුදු දහම ආගමකටත් වඩා දර්ශනයක් ලෙසට අද සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාව පිළිගන්නේ එබැවිනි.

බුද්ධ දර්ශනය ගිහියන්ටත්, පැවිද්දන්ටත් වෙන් වෙන්ව දේශනා කළ දහමක් නොවන බවද අප කොයි කවුරුත් වටහා ගත යුතු කරුණකි. පන්සිල් හා අටසිල් ආරක්ෂා කර ගනිමින් සදහම් මාර්ගයේ ගමන් කිරීම ගිහි පැවිදි දෙපාර්ශ්වයටම පොදු කරුණකි. ධාර්මික ජීවිතයක් ගත කිරීමෙන් සසර විමුක්තිය ලබාගත හැකි බව බුදු දහමින් උගන්වන වැදගත්ම පාඩම වේ. ''ව්‍යග්ග පජ්ජ සූත්‍රය'' මගින් මෙලොව දියුණුවට බලපාන කරුණු පහද දුන්නා සේම, අංගුත්තර නිකායේ එන ''වඩ්ඩි සූත්‍රයෙන්'' රටක් සංවර්ධනය විය යුත්තේ කෙසේද යන්න පහද දුන්නේද බුදුරජාණන් වහන්සේ විසින්මය. අද වත්මන් සමාජය මේ පිළිබඳව දක්වන අවධානයේ අඩු බවක් පවතින බවක් පෙනී යයි. විවිධ පටු මතවාද සමාජගත කිරීමේ උත්සාහයක් අද රට තුළ තිබෙන බවක් අපට දුටුව හැකිය. ගිහි සමාජයේ පමණක් නොව සංඝ සමාජයේ ඇතැම් ස්වාමීන් වහන්සේලා අතරද මෙබඳු දුර්මත තිබෙන බවක් පෙනී යයි. මෙබඳු අවිචාරවත් පසුබිමක ත්‍රෛනිකායික ගරුතර මහානායක ස්වාමීන් වහන්සේලා ප්‍රමුඛ සිල්වත් හා ගුණවත් සංඝ පීතෘවරයන් වහන්සේලා පාලක දේශපාලන නායකත්වයට නිවැරදි සදහම් මාර්ගය පෙන්වා දෙමින් අනුශාසනා කිරීම අපගේ ගෞරවාදරයට හේතු වන්නේය. කවුරුන් බලයට පැමිණියද එම අවවාද, අනුශාසනාවලට සමාජය යොමු කරන රාජ්‍ය පාලනයකට මේ රටේ ජනතාවගේද විරෝධයක් නැත්තේය. ■



සර්ප වර්ගයන් කෙරෙහි මෛත්‍රී කිරීමෙන් ඔවුන්ගෙන් සිදුවිය හැකි අනතුරු කෙරෙන් ආරක්ෂාව සලස්වා ගැනීම අරමුණු කොට මෙම ''කඳ පිරිත'' (ඛන්ධ පරිත්තය) අප මහා බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාරා ඇත.

අප භාග්‍යවත් ගෞතම බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු මහසිටාණන් විසින් කරවා පිළිගන්වන ලද ජේතවන නම් ආරාමයෙහි වැඩ වසනා සමයෙක, සැවැත්නුවර එක්තරා භික්ෂූන් වහන්සේ නමක් නයකු විසින් දෂ්ට කරන ලදුව කලුරිය කළේය. එකල්හි බොහෝ භික්ෂූන් වහන්සේ එක්ව බුදුරජාණන් වහන්සේ වැඩ සිටි ජේතවන ආරාමයට එළඹ, වැඳ, එකත්පසෙකට වී, ''ස්වාමීනි, මේ සැවැත්නුවර එක්තරා භික්ෂු නමක් සර්පයකු විසින් දෂ්ට කරන ලදුව කාලක්‍රියා කළේය'' යනුවෙන් එපවත් දන්වා සිටියේය. එය ඇසූ බුදුරජාණන් වහන්සේ, එම භික්ෂු පිරිස අමතා, ''මහණෙනි, ඒ භික්ෂු නම සතර සර්පරාජ කුලයන් කෙරෙහි මෛත්‍රී සිත් පැතිරවූයේ නැතැයි සිතමි. සතර සර්පරාජ කුලයන් කෙරෙහි මෙත් සිත් පැතිරවූයේ නම්, මෛත්‍රිය වැඩූයේ වී නම් ඒ භික්ෂු නම සර්පයකු විසින් දෂ්ට කරන ලදුව කලුරිය නොකරන්නේ යැයි'' වදාළ සේක.


එම සතර සර්පරාජ කුලයන් නම්,

1. විරූපක්ඛ නම් සර්පරාජ කුලය.
2. ඒරාපථ නම් සර්පරාජ කුලය.
3. ඡබ්‍යාපුත්ත නම් සර්පරාජ කුලය.
4. කණ්හාගෝතමක නම් සර්පරාජ කුලය යන සතරයි.

බුදුරජාණන් වහන්සේ ''අනුජානාමි භික්ඛවේ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තේන චිත්තේන ඵරිතුං, අත්තගුත්තියා අත්තරක්ඛාය අත්තපරිත්තයානි'' යනුවෙන් ''තමාගේ ආරක්ෂාව පිණිස, පිරිත් පිණිස ඒ සතර නාග කුලයන් කෙරෙහි මෙත් සිත් පතුරු වන්නට අවසර දෙමි'' යි අනුදැන වදරා, සියලු සත්වයන්ගේ ප්‍රයෝජනය සඳහා මතු දැක්වෙන ගාථාවන් වදරණ ලද සේක.

1. විරූපක්ඛෙහි මේ මෙත්තං - මෙත්තං ඒරාපථේහි මේ,
ඡබ්‍යාපුත්තේහි මේ මෙත්තං - මෙත්තං කණ්හාගෝතමකේහි ච.
2. අපාදකේහි මේ මෙත්තං - මෙත්තං දිපාදකේහි මේ,

''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් ෙ



# සර්පයන්ගෙන් ආරක්ෂාවට බුදුරජුන් අනුදැන වදාළ 'කළු පිරිත්'


ුප්පදේහි මේ මෙත්තං - මෙත්තං බහුප්පදේහි මේ.
මා මං අපාදකෝ හිංසි - මා මං හිංසි දිපාදකෝ
මං චතුප්පදෝ හිංසි - මා මං හිංසි බහුප්පදෝ
සබ්බේ සත්තා සබ්බේ පාණා - සබ්බේ භූතා ච කේවලා
බ්බේ භද්‍රානි පස්සන්තු - මා කඤ්චි පාපමාගමා
අප්පමාණෝ බුද්ධෝ, අප්පමාණෝ ධම්මෝ, අප්පමාණෝ සඞ්ඝෝ
මාණවන්තානි සිරිංසපානි අහිවිච්ඡිකා සතපදී, උණ්ණානාභි, සරබූ,
සිකා,
තා මේ රක්ඛා කතා මේ පරිත්තා, පටික්කමන්තු භූතානි
යෝහං නමෝ භගවතෝ, නමෝ සත්තන්නං සම්මා සම්බුද්ධානන්ති.

1. මාගේ මෛත්‍රිය විරූපක්ඛ නම් සර්ප කුලය සමගය. මාගේ මෛත්‍රිය ඒරාපථ නම් සර්ප කුලය සමගය. මාගේ මෛත්‍රිය ඡත්‍යාපුත්ත නම් සර්ප කුලය සමගය. මාගේ මෛත්‍රිය කණ්හාගෝතමක නම් සර්ප කුලය සමගය.

2. මාගේ මෛත්‍රිය පාද නැති නාග, පිඹුරු, පොළොං ආදී දීර්ඝ ජාතීන් සමගය. මාගේ මෛත්‍රිය දෙපා ඇති මිනිසුන් හා පක්ෂීන් සමගය. මගේ මෛත්‍රිය හස්ති, අශ්ව, ගව, මහිෂ ආදී සිවුපා සත්වයන් සමගය. මාගේ මෛත්‍රිය පත්තෑ, ගෝනුසු ආදී බොහෝ පාද ඇති සත්වයන් සමගය.

3. පාද නැති සත්වයෙක් මා නොපෙළාවා, දෙපා සත්වයෝත්, සිවුපා සත්වයෝත්, බහු පාද සත්වයෝත් මා නොපෙළාවා.

4. සියලු සත්වයෝද, සියලු ප්‍රාණීහුද, හුදෙක් සියලු භූතයෝද යන සෑම දෙනාම යහපතක්ම දකිත්වා. මොවුන් කිසිවකු කෙරෙහි දුකක් නොපැමිණෙත්වා.



5. බුද්ධ රත්නයේ ගුණ අප්‍රමාණය, ධර්ම රත්නයේ ගුණ අප්‍රමාණය, සංඝ රත්නයේ ගුණ අප්‍රමාණය. මා විසින් තෙරුවන් ගුණ සිහි කිරීමෙන්, සර්පයෝ, ගෝනුස්සෝ ආදී දීර්ඝ සත්වයෝද, බහු පාද ඇති සත්වයෝද, මකුළුවෝද, සිකනල්ලුද, මීයෝද යන මේ සියලු සතුන් කෙරෙන් ආරක්ෂා කරන ලද්දහ. මා විසින් පිරිත් කරන ලද්දහුය. එබැවින් මා කෙරෙහි නපුරු අදහස් ඇති සත්වයෝ ඉවත් වෙත්වා. මම භාග්‍යවත් ගෞතම බුදුරජාණන් වහන්සේට වඳිමි. සත් බුදුවරයන් වහන්සේලාටද නමස්කාර කරමි.

මෙම ගාථාවන් සර්ප විෂ බස්සවන මන්ත්‍රයක් ලෙසින් පැරණියේ සිටම ලක්දිව ප්‍රචලිතව පවතී. එමෙන්ම සර්ප බිය ඇති වන විටෙක හා සර්පයන් බහුල ප්‍රදේශයන්හිදී මෙම ගාථාවන් නිතර නිතර ශ්‍රද්ධාවෙන් භාවිත කිරීමෙන් සර්පයන්ගෙන් වන උවදුරුවලින් මිදිය හැකිය. පන්සිල් සුරකිමින් සියලු සත්වයන්ට හට මෛත්‍රී කරන්නන් හට මෙහි ප්‍රයෝජන සාර්ථකව ලද හැකිය.

සංඛ ඉන්ද්‍රනාත් - ශ්‍රී දළදා මාලිගාව

ු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.'' - (ධම්ම පදයේ 3 වන ගාථාව)



# මුතු මාලය සොරකම් කළ වැඳිරිය

නූතන සමාජයේ මිනිසුන් කෙරෙන් යහගුණ මෙන්ම අවගුණද කොතෙකුත් දක්නට ලැබේ. තම අඩුලුහුඬුකම් හා නොහැකියාවන් වසා ගැනීමට අන්‍යයන් වෙත චෝදනා එල්ල කිරීම සුලභව දක්නට ඇත. තමන් අතින් සිදුවූ වැරදීම් අසරණයන් වෙත පවරා තමන් නිවැරදිකරුවකු වීමට උත්සාහ කිරීම ඉතා පහත් ක්‍රියාවකි. එනිසා වරදට දඬුවම් ලබාදීමත්, නිවැරදි දේ අගය කිරීමත් අප විසින් කළ යුතු වේ. සමාජය හා සමාජයේ ජීවත් වන පුද්ගලයන් පිළිබඳ විමසිලිමත්ව සිටීමෙන් යහපත් හා අයහපත් පුද්ගලයන් හඳුනා ගැනීමට අපහසු නොවේ.

අතීතයේ ඉන්දියාවේ බරණැස් නුවර බ්‍රහ්මදත්ත නමින් රජකු රජකම් කළේය. උයන් කෙළියට ගොස් උයන්සිරි විඳීම සහ ක්‍රීඩා කිරීම රජුගේ විනෝදාංශය විය. එමෙන්ම තම බිසෝවරු සමග ජල ක්‍රීඩාවෙහි යෙදීමද රජුගේ විනෝදාංශයක් විය. දිනක් රජු තම බිසෝවරුන් සමග ජල ක්‍රීඩා කිරීම සඳහා රජ උයනේ පිහිටි පොකුණට ගියේය. එහිදී බිසෝවරු තම ශරීරයෙහි පැළඳි රන් අභරණ ගලවා ඒවා ආරක්ෂා කර ගැනීමට මෙහෙකාරියට දී පොකුණට බැස ජල ක්‍රීඩා කරන්නට වූහ. එම බිසෝවරුන්ගේ රන් ආභරණ හා මුතු මාල අතැති මෙහෙකාරිය ජලස්නානය කරන බිසෝවරුන් දෙස බලමින් සිටියාය.

පොකුණ අසල වූ වනයේ ගස්වල වඳුරන් හා වැඳිරියන් ඒ මේ අත දුව පනිමින් කල් ගෙවන්නට වූහ. එහිදී එක් වැඳිරියක් මෙහෙකාර සේවිකාවගේ අතෙහි රන් ආභරණ හා මුතු මාල තිබෙනු දැක ඇය අහක බලා සිටියදී ඇයට නොපෙනෙන සේ මුතු මාලය රැගෙන ගස් අතර සැඟවීය.

පසුව ජල ස්නානය කොට ගොඩට පැමිණි බිසෝවරු ඇඳුම් ඇඳ ආභරණ පැළඳ ගැනීමට සූදානම් වූ විට එක් මුතු මාලයක් අඩු බව දැක ඒ පිළිබඳ මෙහෙකාර සේවිකාවගෙන් විමසීය. මෙහෙකාරියද මුතු මාලයක් අඩු බව තමන් නොදැන සිටියාය.

එහෙත් ඒ බව නොදන්වා තමන් අතින් වරදක් වී ඇති බව දැන ඉන් මිදීම සඳහා සොරකු පැමිණ එය උදුරාගෙන දිවූ බව පැවැසුවාය. ඒ බව රජුටද දැන්වීය. ඒ අනුව රාජ නියමය පරිදි සොරා ඇල්ලීමට ඒ මොහොතේම රාජ පුරුෂයෝ ක්‍රියාත්මක විය. ඒ අසල වූ අහිංසක මිනිසකු අල්ලා ගත් රාජ පුරුෂයෝ මුතු මාලය ගත්තේ ඔබදැයි විමසූහ. ඒ අහිංසක මිනිසා තමන් එය නොගත් බවත් වෙනත් අයකු ගත් බවත් පැවැසීය.

එහිදී රාජ පුරුෂයන් ඔහුට වද හිංසා කළ අතර පසුව රාජ පුරුෂයන්ගෙන් බේරීම සඳහා තමන් මුතු මාලය ගෙන රටේ සිටුතුමාට දුන් බව පැවැසීය. ඒ අනුව රාජ පුරුෂයෝ සිටුවරයා සොයා ගියහ.

සිටුවරයා වෙත ගිය රාජ පුරුෂයෝ අසවල් හොරා ඔබට මුතු මාලයක් දුන්නේදැයි විමසීය. නොදුන් බව ප්‍රකාශ කළහොත් රාජ පුරුෂයන් තමන් ගැන සැක සිතන නිසා සොරා තමාට දුන් මුතු මාලය රාජ පුරෝහිතයාට දුන් බව පැවැසීය. රාජ පුරුෂයෝ පුරෝහිතයා වෙත ගොස් අසවල් සිටුවරයා දුන් මුතු මාලය ලබාදෙන ලෙස ඉල්ලූහ. පුරෝහිතයාද ඔවුන්ගෙන් බේරීම සඳහා එම මුතු මාලය ගාන්ධර්වයාට දුන් බව පැවැසීය. රාජ පුරුෂයෝ ගාන්ධර්වරයා වෙත ගොස් පුරෝහිතයා දුන් මුතු මාලය කොහිදැයි විමසීය. ගාන්ධර්වයාද රාජ පුරුෂයන්ගෙන් මිදීම සඳහා එය නගර සෝභනියකට දුන් බව පැවැසීය. රාජ පුරුෂයෝ නගර සෝභනිය වෙතද ගොස් මුතු මාලය ඉල්ලූහ. ඇය එය තවත් අයකුට දුන් බව පැවැසුවාය.

මෙලෙස පුද්ගලයාගෙන් පුද්ගලයා වෙත ගොස් විමසූ නමුදු මුතු මාලය අතැති අවසන් පුද්ගලයා සොයා ගැනීමට නොහැකි විය. අවසානයේ රාජ පුරුෂයෝ මේ බව රජතුමාට දැන්වූහ.

කෝපයට පත් රජ සොරා යැයි සිතූ මුල් අහිංසක මිනිසාගේ පටන් සියලු දෙනා අත්අඩංගුවට ගෙන රාජ සභාවේ සිටි බුද්ධිමත් ඇමැතිවරයකු කැඳවා රාජ බිසවගේ මුතු මාලය සොරා ගත් පුද්ගලයා සොයා දෙන ලෙස පැවැසීය.

රාජ සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වූ ඔහු ප්‍රඥාවන්තයකු විය. සොරකමට හසුවී සිටි ගැමියා, සිටුවරයා, පුරෝහිතයා, ගාන්ධර්වයා සහ නගර සෝභනිය සිරගත කොට රාත්‍රී කාලයේදී ඔවුන් කතාබහ කරන දේ අසා දැන ගැනීමට චර පුරුෂයන් යෙදවීය. ඔවුන්ගේ කතාබස් අනුව

එම සොරකම සිදුකොට ඇත්තේ ඔවුන් නොවන බව වටහා ගත් නුවණැති ඇමැතිවරයා ඔවුන් සියලු දෙනාම නිදහස් කළහ. පසුව රාජ බිසෝවරුන් ජලස්නානය කළ පොකුණ පිහිටි උයනට ගිය නුවණැති අමාත්‍යවරයා එය පරීක්ෂා කරන්නට විය. අවට ගස්වල සිටින වඳුරන් හා වැඳිරියන් දුටු අමාත්‍යවරයා ඒ පිළිබඳ පරීක්ෂණයක් කිරීමට සූදානම් විය.

සියලු ගස්වල සිටි වැඳිරියන් අල්ලා දිළිසෙන නූල්වලින් සැකසූ රන් පැහැති ආභරණ පළඳා, ගස්වලට යැවීය. එසේ ගිය වැඳිරියන් සතුටු වන්නට වූවාය. එහෙත් එක වැඳිරියක් අල්ලා ගැනීමට රාජ පුරුෂයන්ට නොහැකි විය. ඇය අහංකාර ලෙස කල්ගත කළාය. සෙසු වැඳිරියන් දිළිසෙන නූල්වලින් සැකසූ රන් පැහැති ආභරණ පැළඳ අහංකාර වැඳිරියට උසුළු විසුළු කරන්නට වූහ. කෝපයට පත් එම වැඳිරිය තමා සඟවා තිබූ මුතු මාලය රැගෙන සෙසු වැඳිරියන්ට පෙන්වමින් ''බලව් තොපට වඩා වටිනා මුතු මාලයක් මට තිබෙනවා'' යනුවෙන් උදම් අනන්නට විය. ඒ දුටු චර පුරුෂයන් වැඳිරිය ළඟ ඇති මුතු මාලය දිය නෑ බිසවගේ නැතිවූ මාලය බව දැන ඉක්මනින් වැඳිරිය අල්ලා මුතු මාලය ලබා ගත්තේය.

නුවණැති ඇමැතිවරයා චර පුරුෂයන්ගෙන් එම මුතු මාලය ගෙන රජු වෙත ගොස් රජතුමනි, මීට පෙර සැක කළ පිරිස මුතු මාලය සොරකම් කර නැත. රාජ උයනේ විසූ වැඳිරියක් මෙම මුතු මාලය සොරකම් කොට තිබූ බවත් උපක්‍රමයක් තුළින් එය ලබාගත් බවත් පවසා, මුතු මාලය රජුට පිරිනැමීය. ඉමහත් සතුටට පත්වූ රජු නුවණැති ඇමැතිවරයාට ප්‍රශංසා කළේය. එහිදී රජු ඇමැතිතුමන් ඇතුළු පිරිස අමතා ''යුද්ධයකදී සටන්කාමීන්ද යම් වැඩ පිළිවෙළක් කිරීමේදී ඇමැතිවරුද ප්‍රශ්න නැගුණ විටදී නුවණැත්තෝද සිටීම යහපත් බව ප්‍රකාශ කරමින් ඇමැතිතුමාට ඉමහත් සැලකිලි, සත්කාර කරන්නට වූහ. සෙසු ජනතාවද ඇමැතිවරයාගේ බුද්ධි මහිමය පිළිබඳ ඉමහත් සතුටට පත්වූහ.

මෙම කතා පුවත තුළින් වත්මන් සමාජයේ ජීවත් වන අප සෑම දෙනාටම ඉතා වැදගත් ආදර්ශ රැසක් පෙන්වයි. එනම් මෙහෙකාර කාන්තාවගේ චරිතය තුළින් තමන් අතින් සිදුවූ වරද සැඟවීමට එම වරදට සෙසු පුද්ගලයන් හසු කිරීම නිසා විශාල පිරිසකට ඉමහත් පීඩා ගෙන දෙන බවයි. එම නිසා අප අතින් කිසිදු වරදක් නොවීමට අප වග බලාගත යුතුයි. තවද නුවණැති අමාත්‍යවරයාගේ චරිතයෙන් පැහැදිලි වන්නේ සෑම කරුණක් පිළිබඳව නිවැරදිව පරීක්ෂා කර බැලීමෙන් වරදකරු හා නිවැරදිකරු හඳුනා ගැනීමට හැකි බවයි.

මෙහිදී සිදුවූ ගැටලුව විසඳීම සඳහා බ්‍රහ්මදත්ත රජු බුද්ධිමත් ඇමැතිවරයකුට පැවැරීම රජුගේ ශ්‍රේෂ්ඨත්වය ප්‍රකට වන අවස්ථාවකි. සුදුස්සාට සුදුසු කාරිය පැවැරීම තුළින් එහි විපුල ඵල නෙලා ගැනීමට හැකියාව ලැබෙයි. එම නිසා අපගේ දිවි මගේ සාර්ථක සාරඵල නෙලා ගැනීම සඳහා නිරතුරුව බුද්ධිමත්ව නිවැරදි ක්‍රියාමාර්ග තුළින් ජය හා ප්‍රතිඵල ලබාගැනීමට අපි උත්සාහ ගනිමු.

**පූජ්‍ය විතාරන්දෙණියේ වජිරවංශ හිමි**



# විසඳමුද දහම් ගැටයක්

හතර කෝරලේ ගේකට හොරු පැන්නා
අටදෙනා බරට ගැනී ගෙයි උන්නා
වඩුවෙන් දෙළොස් රියනයි ඇගේ උස මැන්නා
හරියන් හමාරයි තන් දෙක තව එන්නා

මේ වනාහී මුඛ පරම්පරාවෙන් පැවැත එන බොහෝ දෙනා දන්නා පැරණි ජන කවියකි. එහෙත් කවියේ තේරුම දන්නෝ විරලය. බෞද්ධ ධර්මයේ දක්වෙන ගැඹුරු කරුණු ඇතුළත් මේ ප්‍රහේළිකා පද්‍යය වනාහී උසස් ධර්මධරයන් වූ ධර්මසේන මහා ස්ථවිරයන් විසින් හෝ වීදගම මෛත්‍රිය මහා ස්ථවිරයන් විසින් හෝ රචිත යැයි සලකනු ලබන දහම් ගැට මාලාව නමැති ග්‍රන්ථයේ පද්‍යවලට සමානය.

තේරුම:

1 වන පදය

පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහ භූතයන්ගෙන් යුක්ත වූ ශරීරය නමැති ගෙට කෙලෙස් නමැති හොරු ඇතුළු වූහ.

2 වන පදය

දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග, පුබ්බන්ත, අපරන්ත, පුබ්බාපරන්ත, පටිච්ච සමුප්පන්න ධම්ම යන ස්ථාන අටේ නොදැනීම නිසාවෙන් හෙවත් බරින් හටගත් අවිද්‍යාව නමැති ගැහැනිය ඒ ගෙයි (ශරීරයෙහි) සිටියාය.

3 වන පදය

අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරා, මරණ යන දෙළොසින් ඈ (අවිද්‍යාව) යුක්ත වූවාය.

4 වන පදය

අවිද්‍යාව නමැති ගැහැනියට තන දෙකකි. ඒ තන දෙක නම් කාම තණ්හාව හා භව තණ්හාවද වේ. තණ්හාව උපදවන චක්ෂුර් විඥානය, ශ්‍රොත විඥානය, ඝ්‍රාණ විඥානය, ජිහ්වා විඥානය, කාය විඥානය, මනෝ විඥානය යන සය හරියන ලෙසද ධම්මාරම්මණයේ නාම රූප කොටසින් අඩක් වූ නාම (අරූපි) කොටස රියන් හමාර ලෙසද සලකා ''හරියන් හමාර'' යැයි කියන ලදී.

''තන දෙක තව එන්නා'' යැයි කීමෙන් භගවන්නා කාම තණ්හා භව තණ්හා දෙක රහත් මගින් මුල සිඳ නසන තෙක් ජාතියෙන් ජාතියට සසර පැවැතීගෙන එන බවයි.

"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - විනීල ජාතකය"



## ජීවිත ගොඩනගන මොනවද මේ

# වත් පිළිවෙත්

2600 සම්බුද්ධත්ව ජයන්තියට අපේ රටේ තේමා පාඨය කරගත්තේ ''සම්බුද්ධත්ව ජයන්තියට පිළිවෙතින් පෙළ ගැසෙමු'' යන්නයි. හැම දහම් පාසලකමත්, රාජ්‍ය ආයතනවලත් මේ පාඨය ඇතුළත් බැනර් ප්‍රදර්ශනය කර තිබුණි. දැන් සම්බුද්ධත්ව ජයන්තිය සැමරීම ඉක්ම ගොස් තිබේ. ඔබ පසුගිය කාලයේ පිළිවෙතින් පෙළ ගැසුණේදැයි ඔබගෙන්ම විමසා බැලිය යුතුය. සැබැවින්ම බොහෝ දෙනෙක් පිළිවෙතින් පෙළ ගැසීම බැනරයට හෝ සටන් පාඨයකට පමණක් සීමා කළහ. ඊට ප්‍රධාන හේතුව වූයේ පිළිවෙත පිළිබඳ දැනුමක් නොමැති වීමය. ඇතැම් විට මේ පාඨය පුවරුවල සටහන් කළ අයගෙන් කී දෙනෙක් මේ පිළිබඳ අවබෝධයකින් සිටියේදැයි විමසිය යුතුව තිබේ.

රන් රිදී, මුතු මැණික්, ගේ දෙර, ඉඩකඩම් වැනි යෙදුම් සිංහල භාෂාවේ හඳුන්වන්නේ යුගල පද වශයෙනි. වත් පිළිවෙත් යන යෙදුමද එවැනි යෙදුමක් ලෙසයි පෙනෙන්නේ. වත් සහ පිළිවෙත් කියන පද දෙකට අරුත් දෙකක් තියෙන බව පෙනෙයි. යමකු තමන් සිටින ස්ථානයට හා එතැන ඇති පරිසරයටත්, බඩු භාණ්ඩ ආදියත් වෙනුවෙන් කළයුතු දේවල් වත් යනුවෙන් දක්වෙයි. ඒ ඒ ස්ථාන හා අවස්ථාවන්හිදී පුද්ගලයන් විසින් කළයුතු හෝ නොකර හරින දේවල් පිළිවෙත්වලට ඇතුළත් වේ. ඒ අනුව වත් හා පිළිවෙත් ප්‍රධාන වශයෙන් දෙකොටසක් හැටියට දැක්වීමට පුළුවන.

1. අප සමග ජීවත් වන විවිධ පුද්ගලයන් වෙනුවෙන් අප කරන වත් හා පිළිවෙත්.

2. අප ජීවත් වන පරිසරයේ යහපත පිණිස අප විසින් කළයුතු වතාවත් වශයෙනි.

බුදුරජාණන් වහන්සේ නිර්මාණය කළ සමාජය බෞද්ධ සමාජයයි. එය භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසගෙන් සමන්විතය. එයිනුත් භික්ෂු භික්ෂුණී යන දෙපිරිස විශේෂයි. භික්ෂු සමාජය ගොඩනැගුණේ එදා භාරතයේ විසූ බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ක්ෂුද්‍ර යන සියලු වර්ණයන්ට අයත් පිරිසගෙනි. ඒ කිනම් වර්ණයකින් පැමිණ පැවිද්ද ලැබුවත් ඒ සියලු දෙනා හඳුන්වන ලද්දේ ''සක්තපුත්ත සමණ'' යනුවෙනි. පැවිද්දට පෙර ඔවුන් වෙනම පවුල්වල, වෙනස් වූ සමාජ පසුතලවල, විවිධ සංස්කෘතීන්ට අනුගතව ජීවත් වූ අය වෙති. බුදුරජාණන් වහන්සේට වුවමනා කළේ විවිධතා ඇති මොවුන් එකම ස්වරූපයක් ඇති, එක් ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කරන පිරිසක් ලෙස හැඩ ගැස්සීමටය.

බෞද්ධ පැවිදි සමාජය සෙසු ගිහි හෝ පැවිදි සමාජවලට වඩා වෙනස් හා උසස් බවට හේතුව වන්නේද ඊට ඇතුළත් වූ අයගේ පැවැති මෙම උසස් සිතුම් පැතුම් රටාව හා හැසිරීම් රටාවයි. එම උසස් තත්ත්වය ගොඩ නගා ගැනීමට උපකාර වන ආකාරයෙන් සම්මත කරගත් සම්මුතීන් සමූහයක් වත් පිළිවෙත් ලෙස හඳුනා ගත හැක. මේවා කෙනෙක් තවත් අයකු ලවා කරවිය යුතු ඒවා නොවේ. හැම භික්ෂූන් වහන්සේ නමක්ම තම පැවිදි ජීවිතයේ කොටසක් ලෙස සලකා ඉටු කළයුතු ඒවාය.

### වත් පිළිවෙත්වල යෙදිය යුත්තේ ඇයි?

අප හැම විටකම ජීවත් වන්නේ සමූහයක් වශයෙන් පිරිසක් සමගිනි. විවිධතා ඇති කීප දෙනකුට එක තැනක සතුටින් හා සුහදව කලක් ජීවත්වීම ඉතාම දුෂ්කරය. නොයෙක් නොයෙක් හේතු නිසා ගැටුම්, ආරවුල්, අමනාපකම් ඇතිවේ. පැවිද්දකුට වත් පිළිවෙත් පිළිබඳ නිසි අවබෝධයක් ඇති කරගෙන, දෛනික ජීවිතයේ ඒවා අනුගමනය කිරීමෙන් සමූහයා සමග ගැටුමකින් තොරව සාමකාමීව සහජීවනයෙන් යුතුව ජීවත් වීමට පුළුවන. පුද්ගල සබඳතා යහපත්ව තබා ගැනීමටත්, අපේ සිරුර හා ජීවත් වන පරිසරය පිරිසිදුවත්, ක්‍රමානුකූලවත්, සෞභ්‍ය සම්පන්නවත් පවත්වාගෙන යාමටත් වත් පිළිවෙත් මහෝපකාරී වෙයි. ආරාමයට අයත් බාහිර, අභ්‍යන්තර පරිසරය පවිත්‍රව තබා ගැනීම නිසා තමන්ගේත්, ආරාමිකයන්ගේත් සිත් තුළ පහන් සිතිවිලි ජනිත කරවයි. එමෙන්ම යන එන දයක පිරිසගේද ප්‍රසාදයට හේතුවක් වෙයි. දෛනිකව වත් පිළිවෙත්වල යෙදීමෙන් කායික හා මානසික ව්‍යායාමයක් මෙන්ම නිරෝගී බවක්ද ලැබේ. භික්ෂූන් වහන්සේලා එකිනෙකා අතර සාමූහිකත්වය හා සුහදතාව වර්ධනය වීමටද වතාවත් බෙහෙවින්

"උත්සාහවන්තයා සියල්ල ජයගනී - වණ්ණුපථ ජාතකය"

උපකාරී වෙයි. ආරාමයක වෙසෙන රෝගී අය හැර අනෙකුත් සියලු ස්වාමීන් වහන්සේලා වත් පිළිවෙත්වල නිරත විය යුතුය. එයින් ඔවුන් තුළ සුහදත්වය හා සාමූහිකත්වය වැඩෙන අතර පැවිදි ජීවිතයට අපමණ වටිනාකමක්ද ලැබේ.

චුල්ලවග්ග පාලියේ වත්තක්ඛන්ධකයේ දෛනිකව හා සුවිශේෂී අවස්ථාවල භික්ෂූන් වහන්සේ ඉටු කළ යුතු වත් පිළිවෙත් මෙලෙස දක්වා තිබේ. ආගන්තුක වත්, ආවාසික වත්, ගමික වත්, අනුමෝදනා වත්, භත්තග්ග වත්, පිණ්ඩචාරික වත්, ආරඤ්ඤික වත්, සේනාසන වත්, ජන්තාඝර වත්, වච්චකුටි වත්, උපජ්ඣාය වත්, සද්ධිවිහාරික වත්, ආචරිය වත්, අන්තේවාසික වත් හා ගිලාන වත් වශයෙනි.

දැන් අපි එයින් එක් වතක් හෝ දෙකක් පිළිබඳ විමසා බලමු. ආගන්තුකව ආරාමයකට පැමිණෙන පැවිද්ද ආරාමයට පිවිසීමේදීත් ඒ තුළ වැඩ වාසය කරන කාලය තුළ සහ ආරාමයෙන් පිටව යන විටත් ඉටු කළ යුතු වත් හා පිළිවෙත් ආගන්තුක වත් ලෙස දක්වා තිබේ. ආගන්තුකව වැඩම කළ ඇතැම් ස්වාමීන් වහන්සේලා, ගොම මඩ ආදිය තැවරුණු අපිරිසිදු පාවහන් පැළඳ ආරාම තුළට පිවිසි බව පෙනෙයි. සමහරු දිග හැරගත් කුඩය නොහකුලාම ආරාම තුළට ඇතුල්ව තිබේ. මෙවැනි අශෝභන හැසිරීම් දුටු තථාගතයන් වහන්සේ භික්ෂුව විචාර ශීලී ශිෂ්ට සම්පන්න අයකු කරලීම පිණිස ආගන්තුක වත් නියම කළහ. ඒ අනුව ආරාමයකට පිවිසෙන විට ඒ බව සිහියේ තබාගෙන පාවහන් ගලවා, නිසි තැනක තබා, සිවුර මනා ලෙස සකසා ගෙන පිවිසිය යුතුය. ආවාසයික භික්ෂූන් පෙනෙන තැනක, නැතිනම් සිටින තැනකට ගොස් පා සිවුරු පසෙකින් තබා සුදුසු අසුනක හිඳ, වෙහෙස නිවා අවශ්‍ය නම් පැන් වළඳා වැඩිහිටි භික්ෂුවක් ඇත්නම් වැන්ද යුතුයි. අනතුරුව පානීය හා පරිභෝජනීය ජලය ඇති තැන් පිළිබඳ විමසා දැන ගත යුතුය. නවාතැන් ගන්නේ නම් ඒ සඳහා ලැබුණු තැන අපිරිසිදු නම්, පිරිසිදු කර ගතයුතු නියමිත වේලාවට දනය හා ගිලන්පස වැළඳීමට අදාළ ස්ථානයට යාමත් ස්ථානය හා පරිභෝග භාණ්ඩ පිරිසිදු කිරීම ආදිය සෙසු භික්ෂූන් සමග එක්ව කළ යුතුය. ආපසු යාමට පෙර නැවතී සිටි ස්ථානය හා පරිභෝග භාණ්ඩ ආදිය පිරිසිදු කොට නිසි තැන්හි තබා ආරාමයීය භික්ෂූන්ට දන්වාම පිටත් විය යුතුය. අද වෙනවිට ඇතැම් සමාජ සම්මුති හා පැවිදි පරිෂ්කාර ආදියේ යම් යම් වෙනස්කම් තිබෙන්නට පුළුවන. මෙම පිළිවෙත් තුළින් භික්ෂුවගේ සීලාචාර බව මනාව පිළිබිඹු වේ. එමෙන්ම පිරිසිදුකම හා පිළිවෙළද ආචාර සම්පන්න බවද පෙන්නුම් කෙරේ.

වර්තමානයේ බොහෝ ආරාමවල පිරිසිදුකම හා නිසි කළමනාකරණයක් නොමැතිකම නිසා ආරාමය අභ්‍යන්තර හා බාහිර පරිසරය අවුල් වී තිබේ. ආරාමිකයන්ගේ පුද්ගල සබඳතා බිඳ වැටීමට පවා එය හේතුවී තිබේ. ඒ තත්ත්වය ආරාමිකයින් තුළ පමණක් නොව ආරාමයට යන එන අය තුළද, පැහැදීම වෙනුවට කළකිරීම ඇති කරවන හේතුවක් බවට පත්වී තිබීම කනගාටුවට කරුණකි.

වත් පිළිවෙත් පිළිබඳ මනා වැටහීමක් ලබාගෙන ඒවා ක්‍රියාවට නැංවීම තුළින් භික්ෂු ජීවිතයට මොන තරම් වටිනාකමක් ලබාගත හැකිදැයි පෙන්නුම් කරන සාධකයක් චුල්ල ගෝසිංග සූත්‍රයෙන් පෙන්වා තිබේ. ගෝසිංග වනයේ භාවනාව සඳහා ගොස් සිටි අනුරුද්ධ, කිම්බිල හා නන්දිය තෙරවරුන් බැලීම පිණිස බුදුරදුන් වැඩම කරන්නේ කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරවය. අනුරුද්ධ තෙරුන් හමුවී උන්වහන්සේලා සමගියෙන්, සහයෝගයෙන් කටයුතු කරන්නේදැයි ඇසූ විට අනුරුද්ධ තෙරුන්ගේ පිළිතුර වූයේ කිරි හා දිය වෙන් කළ නොහැක්කා සේ, එකාවන්ව බැඳී තිදෙනා සමගියෙන් සතුටින් සිටින බවයි. ඊට හේතු වූයේ තම තමන් වහන්සේ ඉටු කළයුතු වත් පිළිවෙත් ගැන තිදෙනාම අවබෝධයෙන් කටයුතු කිරීමය. පවුල් ඒකකයේ සිට රාජ්‍යය දක්වා අද වන විට අවුල් සහගත තත්ත්වයක් පැන නැගී තිබෙන බව පෙනේ. ඒ ඔවුනොවුන්ට තමන් ඉටු කළයුතු වත් පිළිවෙත් පිළිබඳ ඇති අනවබෝධය හා නොදැනුවත්කම නිසාය. නැතිනම් ඒ පිළිබඳව දක්වන නොසැලකිල්ලයි. දරුවන් කුඩා කල සිට මේ සඳහා යොමු කොට හුරුවක් ලබාදීම දෙමාපියන්ගේ කාර්යයයි. නිවස හා අවට පරිසරය පිරිසිදුව හා විසිතුරු ලෙස පවත්වාගෙන යාමත්, ප්‍රයෝජනයට ගන්නා බඩු භාණ්ඩ භාවිතයෙන් පසු නිසි පරිදි පිරිසිදු කොට නියමිත තැන තැබීමටත්, ඔවුන් තුළ ආකල්පයක් ගොඩ නැගිය යුතුය. තමන් සිටින තැන හා නිවස අවට පරිසරය පිරිසිදුව තබා ගැනීම, ඇඳුම්, පොත්පත් හා භාවිතයට ගන්නා



සියල්ල පිරිසිදුව නිසි පරිදි තබා ගැනීමත්, නිවසෙහි වැසිකිළි කැසිකිළි ආදිය පවිත්‍රව තබා ගැනීමත්, ගෘහස්ථ වතාවත්වලට ඇතුළත් වේ. සියල්ල මව්පියන් විසින් ඉටු කිරීම දරුවන්ට කරන හානියක් මිස යහපතක් නොවේ. අද බොහෝ දෙනකුට යහපත් හා ශිෂ්ට සම්පන්න ලෙස පුද්ගල සම්බන්ධතා පැවැත්වීම පිළිබඳ හුරුවක් හා අවබෝධයක් නැත. විළි බිය නැතිව සතුන් මෙන් හැසිරෙන්නේ එනිසාය. වන්දනාමාන කිරීමට හා නැරඹීමට යන ආගමික ස්ථාන, දිය ඇළි, ජලාශ හා වැව් අවට පරිසරය අපද්‍රව්‍ය දමා විනාශ කිරීමට තරම් අපි අශීලාචාර වී සිටිමු. යම් තැනකට ගිය විට ඒ ස්ථානය අපිරිසිදු කොට කෙලෙසන තැනට මේ සමාජය පත්ව තිබේ. ඒ තුළින් ප්‍රදර්ශනය වන්නේ ඔවුන්ගේ අශීලාචාර බවයි. වත් නොපුරන්නාගේ සිල් නොපිරෙන බව දහමෙහි සඳහන් වේ. එහෙයින් වත් පිළිවෙත් මනාව අවබෝධ කරගෙන එහි නිරත වීමෙන් ජීවිතයට වටිනාකම් එකතු කරන සමාජයක් ගොඩ නගමු.

**පූජ්‍ය නෙළුවාකන්දේ ඤාණානන්ද හිමි**

"අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති - අපණ්ණක ජාතකය"



# වැඩිපුරම පින් ලැබෙන්නේ කුමන දානයකින්ද?

ලෝක සත්වයා නිතැතින්ම දුකට අකමැති, සැපට කැමැති පිරිසක් බව 'මා පුඤ්ඤභායි' සූත්‍රයේද භාග්‍යවතුන් වහන්සේ වදාළා.

"මා භික්ඛවේ, පුඤ්ඤානං භායිත්ථ සුඛස්සේතං භික්ඛවේ, අධිවචනං යදිදං පුඤ්ඤන්ති".

"පින්වත් මහණෙනි, පිනට බියවෙන්න එපා. පින කියන්නේ සැපයට කියන වෙනත් නමක්. පුණ්‍ය කර්මවල විපාකය තමා නිතැතින්ම දෙව් මිනිස් ලෝකවල සැප විපාක ලබාදීම."

භාග්‍යවතුන් වහන්සේ මා "පුඤ්ඤභායි සූත්‍රයේදී" හෙළිදරව් කරනවා උන්වහන්සේ අතීත ජීවිතයකදී "සුනෙත්ත" නම් වූ සෘෂීන් වහන්සේ නමින් පුරා සත් වසරක් අඛණ්ඩව මෛත්‍රී ධ්‍යානය වඩවලා ලබපු සැප විපාක ගැන.

පුරා සත් වසරක් මෛත්‍රී ධ්‍යානය වැඩීම නිසා ලෝකය විනාශ වන කල්ප (සංවට්ට කල්ප) ලෝකය යළි සකස් වන කල්ප (විවට්ට කල්ප) හතක් පහළ ලෝකවල ඉපදුණේ නෑ කියලා. සංවට්ට කල්පවල ආභස්සර බ්‍රහ්ම ලෝකවලත් විවට්ට කල්පවල ශුන්‍ය බ්‍රහ්ම විමානවලත් තමා උන්වහන්සේ ඉපදිලා තියෙන්නේ. ඒ වගේම ඒ පුණ්‍ය විපාකයේ ඵල විදිහට තිස්හත් වතාවක් සක්‍ර දෙවියන්ගේ වෙලා තියෙනවා. නොයෙක් සිය ගණන් වාරවල මහා පෘථිවියට රජ වූ සක්විති රජවෙලා තියෙනවා. මහා බ්‍රහ්මයා වෙලා ඉපදිලා තියෙනවා. බලන්න පිනේ විපාක.

භාග්‍යවතුන් වහන්සේ වේලාම සූත්‍රයේදී හෙළිදරව් කොට වදාළේ පින් රැස්කර ගන්නා ක්‍රම අතර දානයකින් ලබන පිනට වඩා සීලයෙන් රැස්වන පින අග්‍ර බවයි. සීලයෙන් රැස්වන පිනට වඩා භාවනාවෙන් රැ ස්වන පින අග්‍ර බවයි. ලෝකයේ පෞද්ගලික දාන 14 ක් සහ සංඝගත දක්ඛිණා 7 ක් තිබෙනවා. (දක්ඛිණා විභංග සූත්‍රය ම.නි.)

මේ කිසිදු පෞද්ගලික දානයකින් සංඝගත දක්ෂිණාවකින් ලබන පින රැස්වන්නේ නෑ. ඒ සියලු දානවලට වඩා සිව්දිගින් වඩින සංඝයාට කුටියක් හදලා පූජා කළොත් ඒ කුටි පූජාව තමා අග්‍ර වන්නේ. ඒ කුටි පූජාවටත් වඩා අවබෝධයෙන්ම තිසරණයේ පිහිටියොත් ඒක තමා අග්‍ර වෙන්නේ. තිසරණයේ පිහිටන විටත් වඩා නොකැඩුණු, නොකැළැල් පංච ශීල ප්‍රතිපත්තිය තුළ පිහිටියොත් ඒකයි අග්‍ර වෙන්නේ. මේ සියලු දානවලටත්, සියලු සීලවලටත් වඩා අග්‍ර වන්නේ ශ්‍රී සද්ධර්මය නුවණින් විමසීමයි. සිහිය පිහිටුවාගෙන වීර්යයෙන්, නුවණින් යුක්තව භාග්‍යවතුන් වහන්සේගේ ධර්මයට අනුවම නුවණින් විමසන්න ඕන. (යෝනිසෝමනසිකාරය) ඒකට තමා භාවනා කරනවා කියන්නේ. එදා "සූකරකත" ලෙනේදී සාරිපුත්ත ස්වාමීන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට පවන් සලන ගමන්ම සියලු කෙළෙසුන් නසා උතුම් අරහත්වයට පත්වුණා.

භාග්‍යවතුන් වහන්සේ "වේලාම" සූත්‍රයේදී වදාළා කෙනෙක් මලක සුවඳ සිඹින සුළු මොහොතක් අනන්ත ලෝක සත්වයන්ව අරමුණු කරගෙන උතුම් මෛත්‍රී ධ්‍යානය පුරුදු කරනවා නම් යට කියන ලද සියලු පින් අභිබවා යනවා කියලා. ඊළඟට උන්වහන්සේ මේ ලෝකයේ අග්‍ර පින් රැස්වන ක්‍රමය "වේලාම" සූත්‍රයේදී හෙළිදරව් කොට වදාළා. මේ පින කිසිදු දානයකින්, කිසිදු සීලයකින්, වෙනත් කිසිදු භාවනාවකින් රැස්වෙන්නේ නෑ කියනවා. ලෝකයේ පින් අතර අග්‍රයි කියනවා අනිත්‍ය භාවනාව. කෙනෙක් ඇසිපිය හෙලන මොහොතක් නමුත් මේ ඇස මම නොවේ, මගේ නොවේ, මගේ වසඟයේ පවත්වන්න පුළුවන් දෙයක් නොවේ කියලා අනිත්‍ය සංඥාව වඩවනවා නම් ඒක දෙව් මිනිස් ලෝකයේ අග්‍ර පින් රැස්වෙන ක්‍රමයයි. මේ ක්‍රමයට දෙවියන් අප්‍රමාණ පින් රැස්කර ගන්නවා.

අපි දානයක් දීලා හෝ සිල් රැකලා හෝ භාවනා කරලා හෝ පින් රැස්කළ යුත්තේ ඒ අමාමහ නිවන ඉලක්ක කොට ගෙනමයි. මොකද හේතුව "දානමහප්ඵල සූත්‍රයේදී භාග්‍යවතුන් වහන්සේ වදාළා අරමුණු වෙනත් එකක් වුණොත් සැප විපාක තියෙන බව. හැබැව. නමුත් අග්‍ර නෑ කියලා කරන ලද පිනෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට නම් චතුරාර්ය සත්‍ය අවබෝධය ඉලක්ක කිරීමයි ඒක කළ යුත්තේ. අනිත් කාරණා තමා අපි තේරුම් ගෙන තියෙන්න ඕන කල්ප ගණනකිනුත් ලොව දුර්ලභ ආශ්චර්යමත් මනුෂ්‍ය මාණික්‍ය රත්නය වන සම්බුදුරජාණන් වහන්සේ නමක් පහළවීමේ එකම ඉලක්කය චතුරාර්ය සත්‍යය අවබෝධ කරන හැටි දෙව් මිනිස් ලෝකයට කියලා දීමට කියන කාරණය. ඒක උන්වහන්සේ "උදුම්භරික සීහනාද සූත්‍රයේදී" අන්‍යාගමික තාපසින්නාන්සේලා තුන් දහසක් ඉදිරියේ ප්‍රකාශ කරමින් එදා සුමාගදාය පොකුණු තීරය ඉස්මත්තෙන් මොනරුන්ගේ අභය භූමියේදී මේ ධරණී තලය මත අභීත සිංහ නාද පැවැත්වූවා. අවබෝධ කළ යුතු ධර්මය නම් එයයි. ඒ සඳහා අපට තුණුරුවන්ගේ උතුම් ආශිර්වාදය සැලසේවා.

**නුගවෙල දීපාලෝක හිමි**


"අධික ලෝභයෙන් යුතුව යුක්තියට පිටුපාන අය වැනසෙති - සේරිවාණිජ ජාතකය"

සිතන්නට යමක්

# පළමුව ඔබේ සිත ගැන සිතන්න



හිත හිතවත් කරගැනීමට අප විසින් කුමක් කළ යුතු වෙමුද? හිත තමන්ට හිතවත් බව පළමුව විශ්වාස කළ යුතුය. ආත්ම විශ්වාසය යනු එයයි. හිත හිතවත් මිතුරකු වගේම අපට පිහිට වෙයි. දුකේදීත්, සැපේදීත් එය සමව පවත්වා ගතහොත් හරි මාර්ගය ඔස්සේ අපව ඉදිරියට ගෙන යයි. හිත හිතවත් කර ගැනීමට එය මැදම තබා ගන්න උත්සාහ කරන්න. එය කැමැතියි මැදට වෙලා ඉන්න. අතීතයේ සිදුවූ දේවල් ගැන නිතර හිත හිතා සිටීමෙන් හිත දුකට, කනගාටුවට පත්ව පසුතැවිලි වී බොහෝ සේ අසහනකාරී තත්ත්වයකට පත්වේ. හිතක් අපට තිබෙන්නේ හිත පිණිසමයි. හිත වරදෙහි යෙදුවොත්



එය බලවත් සතුරෙක් තවත් සතුරකුට කරන නපුරටත් වඩා අතිශය බලවත් නපුරක් සිදු කරයි. හිත යහපතෙහි යෙදුවොත් මව්පියන්ටත්, ඥාති හිතවතුන්ටත් වඩා තමා උසස් තත්ත්වයකට පත් කරවන බව සම්බුද්ධ දේශනාවයි.

"සම්මා පනිහිතං චිත්තං සෙය්‍යසෝනං තතෝකරෙ"

හිත හිතවත් බව හඳුනා ගන්න හිත තුළම ඉන්න. වඩාත් සිහි කල්පනාවෙන් සිටින විට හිතේ ස්වභාවය සියල්ලම හොඳ හෝ නරක වශයෙන් තමන්ටම දකගත හැකිය. හිත ඉතාම සංවේදීය. එය සියුම් බැවිනි. හිතට සියල්ල දනේ. සියල්ල වැටහේ. බුදුහාමුදුරුවෝ සර්වඥ බවට පත්වුණේ හිතේ හිතවත් බවම නිසයි.

ඇයි අපි මේ ලෝකේ ඉපදුණේ? දුක් විඳින්නද? සැප විඳින්නද? අපට තිබෙන්නේ උසස් සිතක්ම නිසා. ඇයි අප ඒ උසස් හිත තියාගෙන දුක් විඳින්නේ? හිතේ උසස් බව හිතටම දෙන්න. හිතට බලය පැවරූ කල්හි හිත අපව ලෝකේ උසස්ම තැනකට ගෙනියයි. "අග්ගෝ හමස්මිං ලෝකස්ස". ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨ තැන් තිබෙන්නේ මනුලොව උපන් අපටමයි. ඒ සුදුසු තැන් ලෝකේ කවදත් තිබෙනවා. මේ දුර්ලභ වූ මිනිසත් බව උසස් තත්ත්වයක් කරා ගෙන යාමට හිත කෙතරම් හිතවත්ව ක්‍රියා කරයිද?

හිතන හිතන දේ නේද අප කියන්නේ, කරන්නේ? ඒ නිසා හිතට ප්‍රධාන තැනක් දෙන්න. "මනෝ සෙට්ඨා" සියල්ලම හිත තුළ තිබේ. හිත හරි දේට පුරුදු කරගතහොත් කලක් යනවිට අපේ ජීවිතවල පාලන බලය සම්පූර්ණයෙන්ම අත්කර ගනී. එවිට මමත්වයද බැහැර කොට තවදුරටත් සිහියෙන්ම බලා සිටින විට සිතේ අපූර්වත්වය වඩ වඩාත් වටහාගත හැකිය.

හිතට නිදහසේ සිටීමට ඉඩ දී බාහිර අරමුණුවලින් හිත ඈත් කළ කල්හි, හිතකර දේ පමණක් හිත තුළ වැඩෙන්නට පටන් ගනී. එය තමාටම හිතකර වෙයි. "අත්තාහි අත්තනෝ නාථෝ" මේ හිතකර බව හිත තුළම පවතියි. හිතට බාහිර අරමුණු බාධාවක් නොවේ. ඒවාහි ඇති කාම, අකුසල් බව තුරන් කොට අපට අවශ්‍ය සතුට, සන්තෝෂය, ප්‍රීතිය, ඒකාග්‍රතාව ලබාදීමට හිත වගබලා ගනී. හිත බොහෝම ඥානවන්තයි. ප්‍රඥාව එහි අග්‍රඵලයයි. අප සතු ඇස්වලින් ලෝකයේ සියල්ල දකගත නොහැකිය.

පෙනෙන ලෝකය තුළ නොපෙනෙන ලෝකයක් ඇති බව පැහැදිලිව දකිය හැක්කේ හිතින්මයි. ඒ නිසා හිතින්ම හිත හිත, හිත තුළම වාසය කරන්න. "චිත්තේ චිත්තානුපස්සී විහරති" හිත අපව පෙරටම ගෙන යන යාත්‍රාවක් වගේ. සංඛාර විඤ්ඤාණ බවට පත්කරලා භවයෙන් භවයට අපව සැප දුක් ඔස්සේ ගෙන යන්නේ මේ හිතමයි. සැප නිපදවන බලාගාරයද හිතමයි. "චිත්තං දන්තං සුඛාවහං" තනිව ඈත දුර ගමන් කිරීම හිතේ ස්වභාවයයි.


හිතේ තනි බලය තහවුරු කරගත් කල්හි මේ දුර යාමද නවතා කය පිළිබඳ ඇති ආත්ම දෘෂ්ටියද බැහැර කොට එය බලවත් වීම අපට ලබාදෙන පළමු මාර්ග ඵලයයි. එවිට සසර පිළිබඳ කිසිදු බියක්, සැකක් නොවී අපා දුකටද නොවැටී, දෙව් මිනිස් දෙගතිය ඔස්සේ නිවන දක්වාම ඉදිරියට යා හැකිය.

ඉතාලියේ මෙස්සිනා බෞද්ධ විහාරාධිපති
**විලච්චියේ ධම්මවිජය හිමි**

"ධර්ම දානය සියලු දානයන්ට වඩා ශ්‍රේෂ්ඨයි."

# සදහම් ප්‍රහේලිකා අංක - 104

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773




## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ලිපිනය - සදහම් ප්‍රහේලිකාව (94), 112, දයාවංශ ජයකොඩි පොත් සමාගම, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදන.
3. පිළිතුරු පත් භාරගන්නා අවසාන දිනය මාර්තු මස 30 වෙනිද බව සලකන්න.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

### ▶ හරහට

1. පස්මහ බැලුම්වලින් එකකි.
3. අධික ශ්‍රද්ධාව ඇති අය අතරින් අගතැන්පත් තෙරණුවෝ.
5. දෙව්ලොවට අධිපති.
6. ත්‍රිවිධ තණ්හාවලින් එකකි.
8. බෞද්ධයා ගමන් කළ යුත්තේ මේ මාර්ග යේ බව සඳහන්ය.
9. රාශි දොළහින් එකකි.
10. මෙයද එක්තරා ලෝහයකි.
12. නැගෙනහිරින් පායයි.
13. මෙරට රූපවාහිනී නාලිකාවකි.
16. "රූප ශ්‍රීය" යන අරුත ගෙන දෙන වචනයකි.
18. මෙය නිවනට බාධාවකි.

### ▼ පහළට

2. අටලෝ දහමට අයත් වේ.
4. මෙය ගොනා පසුපස එන කරත්තය ලෙසට බුදු දහමේ ඉගැන්වේ.
7. පිපාසය සංසිඳුවන්නට උපකාරී වේ.
8. සමහරු මෙය රැස්කිරීම සඳහා වැරදි ක්‍රියාවල යෙදෙති.
11. බෞද්ධ සමාජයේ මෙබඳු සිවුවරුද සිටියහ.
12. ධන සම්පත් යන අර්ථය ගෙන දෙන තවත් වචනයකි.
14. රාත්‍රියට අහස බබළවයි.
15. පංචාරම්මනවලින් එකකි.
17. සියලු දේට මූල මෙය බව බුදු දහමේ ඉගැන්වේ.

### ප්‍රහේලිකා අංක 101 ජයග්‍රාහී වාසනාවන්තයින් නම්

- **උද්දික ලෙවුදෙනිය**
  **61, තේක්කවත්ත, තැන්නකුඹුර, මහනුවර.**
- **සෙහන්සා දිසානායක**
  **සුධර්මා දහම් පාසල, කව්වේරිය පාර, කුරුණෑගල.**

# අලුත් අවුරුද්දේ හිස තෙල් ගිරිමානන්ද සූත්‍රයෙන් පිරිත් කෙරේ

**සිංහල** අලුත් අවුරුද්දේ හිස තෙල් ගෑමේ මංගල්‍යය නිමිත්තෙන් සකස් කරනු ලබන ඖෂධීය හිස තෙල් ගිරිමානන්ද සූත්‍රයෙන් 108 වරක් පිරිත් කිරීම මෙම වසරේද අස්ගිරිය විජයසුන්දරාරාම පුරාණ විහාරයේදී අස්ගිරිය මහා විහාරයීය සංඝ සභාවේ මහෝපාධ්‍ය ශාස්ත්‍රවේදී පණ්ඩිත අමුණුපුර පියරතන නාහිමිපාණන්ගේ මූලිකත්වයෙන් සිදුකෙරේ.

ගිරිමානන්ද සූත්‍රයෙන් පිරිත් කරන ලද මෙම හිස තෙල් බෙදදීම හිස තෙල් ගෑමේ දිනයට පෙර දින එනම් අප්‍රේල් 14 වැනිද සිදුකෙරෙන බව පියරතන නාහිමි දන්වා ඇත. හිස තෙල් ගෑමේ චාරිත්‍රය අප්‍රේල් මස 15 වෙනි සෙනසුරාද දින පූර්වභාග 11.04 යෙදෙන සුබ මොහොතින් උතුර දිසාව බලා සිදුකෙරේ.

**කේ. බණ්ඩාරනායක**

# දළදා මාලිගයෙන් පණිවුඩයක්


● **මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න**

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඳ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට වාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

# අපවත්වී වදාළ අස්ගිරි මහා නාහිමිපාණන් වහන්සේගේ ගුණානුස්මරණ පුණ්‍යෝත්සවය

# බොදු පිළිවෙතට අනුව මහ ඉහළින්



"පරිජිණ්ණමිදං රූපං - රොගනිඩ්ඩං පභංගුරං
භිජ්ජති පූතිසන්‍දෙහො - මරණන්තංහි ජීවිතං"

ධම්මපදයේ ජරාවග්ගයේ සඳහන් වන ඉහත කී ගාථා පාඨයට අනුව "දිරන ස්වභාව ඇති මේ ශරීරය රෝගයන්ට ආකරයකි. වහා බිඳී යන ස්වභාව ඇත්තේය. මේ කුණු වැගිරෙන ශරීරය බිඳී යයි. ජීවිතය මරණය කෙළවර කොට ඇත්තේය." යන සනාථන ධර්මය සනාථ කෙරෙමින් අස්ගිරි මහා විහාර පාර්ශවයේ හිටපු මහානායක අතිගෞරවාර්හ උඩුගම සද්ධර්මකීර්ති ශ්‍රී ධම්මදස්සී රතනපාල බුද්ධරක්ඛිතාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේ අපවත් වී දෙවසරක් ගත විය. පසුගිය අප්‍රේල් මස 08 වන දා දෙවසර අනුස්මරණ පුණ්‍ය මහෝත්සවය අස්ගිරි මහා විහාර පාර්ශවයේ වත්මන් මහානායක රාජකීය පණ්ඩිත, මහෝපාධ්‍යාය, අතිගෞරවාර්හ වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන්, දර්ශනපති, අධ්‍යාපනපති, අතිපූජ්‍ය ආණමඩුවේ ශ්‍රී ධම්මදස්සී අනුනායක මාහිමිපාණන් වහන්සේගේ මෙහෙයීමෙන් ලියන්ගස්හින්න පුරාණ විහාරයේ දී පරිත්‍රාණ ධර්ම දේශනාවක් හා සංඝගත දක්ෂිණාවක් උත්කර්ෂවත් ලෙස පැවැත්විණ.

අපවත් වී වදාළ අප මහනාහිමිපාණෝ පැවිදි වූ භික්ෂුවක් තුළ පැවතිය යුතු පාතිමොක්ඛසංවරයෙන් සමන්විත වීම, ආචාරයෙන් හා ගෝචරයෙන් යහපත් හැසිරීමෙන් සමන්විත වීම, ස්වල්පමාත්‍ර නමුත් වරදෙහි බිය දැකීම, නිරවද්‍ය වූ කාය වාග් කර්මයෙන් යුක්ත වී සාරධර්ම ගති ඇතිකර ගැනීම, පිරිසිදු ආජීවයෙන් දෝෂ රහිතව, ඉන්ද්‍රියන්හි වැසූ දොර ඇතිව සිල්වත් විසීම, භෝජනයෙහි පමණ දැන වැළඳීම, සිහිනුවණින් සතුටින් යුක්ත වීම යනාදී ශීලසම්පන්න ගුණාංගයන්ගෙන් සමන්විතව බැබළුනු ශ්‍රේෂ්ඨ සංඝ පීතෲවරයාණන් වහන්සේ නමකි.

උන්වහන්සේ සසුනෙහි පිහිටියේ කෙලෙස් රජස් දුරුකර ගැනීමේ අටියෙන් මිස ලෞකික ලාභ අපේක්ෂාවෙන් හෝ සුඛවිහරණයක් පතා නොවන්නේය. කිසිවෙකුටත් හානියක් නොකර කරදරයක් නොවන සේ සංවරශීලයේ හැසිරුණාහ. එහෙයින්ම උන්වහන්සේගේ ගුණසුවඳ දෙස් විදෙස් සැදැහැතියන්ගේ සිත්සතන් පොබයමින් අදටත් පැතිර යන්නේය. කරුණාබර මුවමඬල, සාධුසංවර ශීලය තුළින් ශෝභාමත් විය. අනුන්ට හෙළා තලා කථා කිරීමෙන්, හිංසාවෙන් වැළකී, ශීලයෙහිම මනාව සිත පිහිටුවා බුදුන් දෙසා වදාළ දහම් මගෙහිම වැඩමකළ උන්වහන්සේ ගිහිපැවිදි කාහටත් ආදර්ශයට ගත හැකි වූහ.

තමන්වහන්සේට ලැබෙන සෑම සියලු පිරිකරක්ම නිර්ලෝභීව ඒ කිසිවක් කෙරෙහි නොඇලී කාහට වුවද පරිත්‍යාග කරමින් දාන පාරමිතාව පිරූහ. රෑ දහවල්හි නිතර බුදුගුණ සිහිකිරීමෙන්, දිනපතා තමන් වහන්සේම නෙළාගත් මලින් බුදුන් පුදා වන්දනාමානාදියෙහි නිරත වූහ. ලෙඩදුක, අපහසුකම් ගැන නොතකා ශාසනික සේවයෙහි නිබඳව නිරත වූහ. ලද දෙයින් සතුටුව පරාර්ථචර්යාවෙහිම යෙදුණාහ.

සත්සිය වසරක් ඉක්මවූ ඉතිහාසයක් ඇති රාජපූජිත මහා විහාර වංශික ථෙරවාදී සංඝ ශාසනයේ ප්‍රමුඛතම මූලස්ථානක් වූ අස්ගිරි මහා විහාරයේ උත්තරීතර මහානායක පදවියෙන් පිදුම් ලැබූ උන්වහන්සේ වයෝවෘද්ධ, ගුණෝවෘද්ධ, තපෝවෘද්ධ භාවයන්ගෙන් සමන්විතව, පර්‍යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනයෙහි ආරක්ෂාව හා පෝෂණය උදෙසා කැපවී සිටි නිහතමානි සෘජු සත්පුරුෂ ගුණයන්ගෙන් යුක්ත වීම නිසා දෙස් විදෙස් සැදැහැතියන්ගේ ගෞරවාදරයට අදටත් පාත්‍ර වන්නාහ.

අස්ගිරි මහා විහාර පාර්ශවයෙහි ගෞරවණීය පදවියක් වූ අතිපූජ්‍ය අනුනායක පදවියෙන් පිදුම් ලැබූ අතිපූජ්‍ය ආණමඩුවේ ශ්‍රී ධම්මදස්සී අනුනාහිමි සහ කාරක සංඝ සභික පූජ්‍ය වඳුරාගල ධම්මාරාම හිමි වැනි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ශාසනයට දායාද කළ උන්වහන්සේ ශාසනයේ චිර පැවැත්ම පිණිස දෙස් විදෙස්හි සිදුකරන ලද අනේකවිධ ශාසනික සේවාවන් ද, දළදා වහන්සේ විෂයෙහි සිදුකරන ලද පූජෝපහාරයන් ද උන්වහන්සේගේ ශාසනික ජීවිතය අදටත් ඔපවත් කරයි.

"යස්ස නත්‍ථි ධුවංඨිති" - "යම් ශරීරයක්හුගේ ස්ථිර පැවැත්මක් නැත්තේය" යන බුදු වදන පසක් කරමින් අපවත්වී වදාළ මහා විහාර වංශික ස්‍යාමොපාලි මහා නිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශවයේ අග්ගමහාපණ්ඩිත මහෝපාධ්‍යාය අතිගෞරවාර්හ උඩුගම සද්ධර්මකීර්ති ශ්‍රී ධම්මදස්සී රතනපාල බුද්ධරක්ඛිතාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේට අජරාමර අමාමහ නිර්වාණ සම්පත්තිය ප්‍රාර්ථනා කොට පැවැත්වූ දෙවන සංවත්සර පුණ්‍ය මහෝත්සවය කෘතගුණවේදී ගුණය ලොවට පසක් කරනු ඇත. අනුමෝදන් කරවූ සියලු පුණ්‍ය බල මහිමයෙන් අපවත් වී වදාළ අප මහනාහිමිපාණන් වහන්සේට නිවන් සුව අත්පත් වේවායි යළි යළිත් ප්‍රාර්ථනා කරමු.

**කේ. මීගහකුඹුර**

"සත්පුරුෂයන්ගේ උපදෙස් අනුව වැඩ කරන්නෝ දියුණුවට පත්වෙති - චුල්ලසෙට්ඨි ජාතකය"




# කුස ජාතකයෙන් හෙළිවන

## ස්ත්‍රීන් කෙරෙහි සිත් ඇති කර ගැනීමෙන් නුවණැත්තෝත් තේජසින් පිරිහෙන බව

මහා කාරුණික වූ ශාන්තිනායක අප සම්මාසම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ සිටින සමයෙහි සසුනෙහි උකටලීව වාසය කරන එක්තරා භික්ෂූන් වහන්සේ නමක් අරභයා මෙම 'කුස ජාතකය' දේශනා කොට වදාළ සේක.

සැවැත්නුවර විසූ එක්තරා කුල පුත්‍රයෙක් බුදුසසුන්හි පැහැද පැවිදිව එක් දවසක් සැවැත්නුවර පිඬුසිඟා වැඩියේය. හෙතෙමේ සර්වාභරණයෙන් සැරසුනු එක් ස්ත්‍රියක් දැක ශාසනයෙහි ඇලුම් නැතිව දික්වූ නිය හා කෙස් ඇතිව කිලිටු සිවුරු ඇඳ, සුදුමැලිව වාසය කළේය. ශාසනයේ පිරිහුණු මෙම භික්ෂුවගේ ශ්‍රද්ධාව නමැති



මල් පරවීමය, සිල් කිලිටි වීමය, නුගුණ පැතිරීමය, විරූප බවට පැමිණීමය, ක්ලේශ නමැති දාඩිය වැගිරීමය, විවේක ස්ථානයේ නොඇලීමය යන පූර්ව නිමිති පහලව ඇති බව දුටු අනෙකුත් භික්ෂූන් වහන්සේ, ඒ භික්ෂුව නොකැමැත්තෙන් වුව බුදුරජාණන් වහන්සේ වෙත කැඳවාගෙන ගොස් ශාසනයේ උකටලීව වසන බව දන්වා සිටියාහුය. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂුව අමතා ඔබ ශාසනයෙහි උකටලීව සිටින බව සැබෑදැයි විමසා, එය සැබෑවයි කී කල්හි එම අවස්ථාවෙහි බුදුන් වහන්සේ, මහණ, කෙලෙස් වසඟ නොවන්න. ශාසනයේ ඇලී වාසය කරන්න. ස්ත්‍රීන් කෙරෙහි සිත් ඇතිකර ගැනීමෙන් පෙර නුවණැත්තෝ ද තේජසින් පිරිහී ව්‍යසනයට පත්වූවා යැයි දක්වා, මලල රට කුසාවතී නම් නුවර කුස රජු පිළිබඳ කතා පුවත දක්වා වදාළ සේක.

පෙර මලල රට කුසාවතී නම් නුවර රජ කෙනෙක් දසරාජ ධර්මයෙන් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කළහ. ඔහුගේ අගමෙහෙසිය සීලවතී නම් වූවාය. ඇයට පුත් රුවනක් නැත්තාහ. එකල නුවර වැසියෝ රජ්ජුරුවන් වහන්ස, දැහැමින් රාජ්‍යය කරන්නට නිසි පුතනු කෙනෙක් පතනු මැනව. එය ඇසූ රජ්ජුරුවෝ මා විසින් කුමක් කළ යුතුදැයි විමසූ විට, අගමෙහෙසියගේ මුරකාවල් මුදා හැර සිත් සේ ඇවිදින්නට හැර දරු කෙනෙකුන් නො ලැබුව හොත් අත්හැර දමන්නැයි ඉල්ලා සිටියහ. මෙසේ කළත් දරුවන් නොලැබුණ හොත් කුමක් කරන්නේ දැයි සිතා රජතුමා නිහඬව සිටියහ. එවිට නගර වැසියෝ නැවත වරක් උද්ඝෝෂනය කළහ. එවිට රජතුමා ඒ හැමදෙනාගේ ඉල්ලීම පරිදි අගමෙහෙසිය රැකවලින් මුදවා මාළිගාවෙන් පිටත් කළහ.

බිසොවුන්ගේ සීල තේජසින් සක් දෙව්රජුගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උණු විය. එකනෙහි මේ කුමක් නිසාදැයි සිතූ ශක්‍ර දේවේන්ද්‍රයා සීලවතී දේවිය දරුවන් පතන නියාව දැක මම ඇයට දරු කෙනෙකුන් ලබා දිය යුතුයැයි සිතා දිව්‍ය ලෝකයෙන් එක්

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."

දිව්‍යපුත්‍රයෙකුට සීලවතී අගමෙහෙසියගේ කුස පිළිසිඳ ගත යුතුයැයි පොරොන්දු කරවාගෙන සීල භේද නොකරන්නැයි කියා සක්දෙව් මහලු බමුණු වෙසක් මවාගෙන රජ මාළිගාවේ දොරකඩට ගියාහුය. මහලු බමුණු වෙසින් සිටි සක්දෙව් දුටු නගර වැසියෝ කුමක් නිසා තොප මෙහි ආවේදැයි විමසූහ. එවිට ශක්‍රයා ඔහුට නින්දා කරද්දී බිසොවුන්ගේ අත අල්ලා ගෙනයන විට බිසව නොකැමැති වූවාය. එහෙත් ශක්‍රයා බිසොවුන් අරගෙන වාසල සමීපයෙහි දඬු මැසි ඇති පැල්පතක් මවා මම සාල් මාලු ආදිය සිඟාගෙන එන තෙක් මේ මැස්සේ නිදාගන්නැයි බිසොවුන්ට කියා නිදා ගන්නට සලස්වා බැහැර ගියේය. දිව පහස ලැබ නිදාගත් බිසව දේවානුභාවයෙන් තව්තිසා භවනයට ගෙන ගොස් දිවයහනක සතපවන ලදී.

බිසව අවදි වී බලත්ම දිව්‍ය ලෝක සම්පත් දැක මා රැගෙන ආවේ ශක්‍රයා යැයි සිතා සක්රජු කරා ගොස් වැඳ එකත්පස්ව සිටියාය. එවිට ශක්‍රයා ඔබට වරදානයක් දෙමි. කැමති වරයක් ඉල්ලන්න යැයි පැවසීය. එවිට බිසව මට පුත්‍රයෙක් දෙන්නැයි ඉල්ලා සිටියාය. මම දරුවන් දෙදෙනෙකු දෙමි. ඉන් එක්කෙනෙකු නුවණ ඇති, රූ නැති කෙනෙක් වෙයි. අනෙකා රුව ඇතිව නුවණ නැති කෙනෙක් වෙයි. මේ දෙදෙනාගෙන් කවුරු පළමුව ලබන්නේ දැයි විචාරා නුවණ ඇති තැනැත්තා පළමුව ලබනු රිසියෙමියි කීවාය. අනතුරුව සක් දෙව් රජු බිසව රජ්ජුරුවන්ගේ සිරියහන් ගබඩාවට ගෙනැවිත් තමාගේ මාපට ඇඟිල්ලෙන් බිසොවුන්ගේ පෙකණිය පිරිමැද ශක්‍ර පුරයට ගියේය. එකණෙහිම පුරන ලද බෝධි සම්භාර ඇති අප මහබෝසතාණෝ තව්තිසා භවනයෙන් චුතව අවුත් සීලවතී දේවීන්ගේ කුස පිළිසිඳ ගත්තේය. බිසොවුන් තමන් කුස දරු ගැබක් පිහිටි බව දැනගත්තාය. රජ්ජුරුවෝ පිබිදුණු විට බිසව දැක, දේවියනි, කවුරුන් විසින් ගෙනෙන ලද දැයි විචාළ කල්හි, ශක්‍ර දේවේන්ද්‍රයා විසිනැයි කී විට, මහලු බමුණෙක් ගෙන යනු මම දුටුවෙමි. දේවයන් වහන්ස, අදහාගත මැනව. දෙවනුව තුන්වනුව කීවත් පිළි නොගත්තෙන්, ශක්‍ර දේවේන්ද්‍රයා විසින් දෙන ලද කුසතණ හා දිවසළු ආදිය පෙන්වා ශක්‍ර දේවේන්ද්‍රයෝ දරු කෙනෙකුන් දුන්නාදැයි විචාළේය. එසේය දේවයන් වහන්ස, දරු කෙනෙකුන් ලදිමියි කීවාය. එබස් ඇසූ රජතුමා දේවියට ගබ් පෙරහර දැක්වීය.

බිසව දසඑකඩ මසක් ඇවෑමෙන් පුතනු කෙනෙක් ලැබූවාය. ඒ කුමාරයාට 'කුස' කුමාරයා යැයි නම් තැබූහ. ඒ කුමාරයා පියවර නගා ඇවිදින කාලයෙහි තවත් දිව්‍ය පුත්‍රයෙක් දෙව්ලොවින් චුතව බිසවගේ කුසෙහි උපන්හ. ඔහුට 'ජයම්පති' යැයි නම් තැබූහ. ඒ රාජ කුමාරවරු දෙදෙනා වැඩිවිය පැමිණ බෝධිසත්වයෝ තමන් නුවණ ඇති හෙයින් ආචාරවරයෙකුගෙන් නොඉගෙන තම නුවණින්ම ශිල්ප දත්හ. මහබෝධිසත්වයන් සොළොස් හැවිරිදි වියට පත්වූ විට කුමාරයා රාජ්‍යාභිෂේක කරනු කැමතිව මේ මුළු දඹදිව යම් රජෙකුගේ දියණියක් කැමති ද, ඇය ගෙන්වා අගමෙහෙසි කරවා දෙමි. කවර රජෙකුගේ දියණියක් කැමති වෙත් ද, ඔහුගේ අභිප්‍රාය ද එයම වෙයි.

මවුබිසොවුන් කුමරයාට මෙපවත් දන්වා ඔහුගේ කැමැත්ත දැනගෙන එන ලෙස කෙනෙකු යැව්වාය. ඒ ස්ත්‍රිය බෝධිසත්වයන්ගෙන් විමසූ විට, මම රූ නැත්තෙකු නිසා රාජ කුමාරිකාවක් ගෙනෙතොත් ඇය පලා යන්නේය. එබැවින් මට ගෘහ වාසයෙන් ඵලක් නැත. මාපිය දෙදෙනා ජීවත් වන තුරු උපස්ථාන කොට මාපිය දෙදෙනාගේ ඇවෑමෙන් මහණ වෙමියි ඒ පණිවිඩකාරියට පවසා සිටියේය. තුන්වරක්ම ප්‍රතික්ෂේප කොට, සතරවෙනි වාරයෙහි දෙමව්පියන් කීවා නොකර සිටීම වරදකැයි සිතා ඊට උපදෙසක් කියන්නෙමැයි බොහෝ රත්‍රං රිදී ගෙන ස්ත්‍රී රූපයක් කොට මෙබඳු රූප ශෝභාවක් ඇති තැනැත්තියක්



අවශ්‍යයැයි කියූ විට පෙරහරින් රන් රුව රැගෙන, වස්ත්‍රාභරණයෙන් සරසා ඇමතියෝ මහපෙරහරින් සෙනඟ රැස්වෙන තැන්හි තැබූහ. ඒ රුව දුටු බොහෝ දෙනා දිව්‍ය අප්සරාවක් මෙන් ඇය රූමත්ය. මැය කොහි සිට අවුදැයි, කුමක් නිසා මෙතන සිටින්නේදැයි අසමින් අප නගරයේම මෙබඳු රූපශ්‍රී ඇති කෙනෙකු නැතැයි පවසන විට නුවරින් නුවරට ගොස්, ඒ කිසිදු නුවරක දී රන් රුව හා සමාන රූපත් ස්ත්‍රියක් සොයාගත නොහැකිව, ඇමතියෝ අවසානයේ මද්‍ර රට සාගල නුවරට පැමිණියාහුය.

එරට රජ්ජුරුවන්ට දිව්‍ය ස්ත්‍රීන් හා සමාන උතුම් දූවරු අටදෙනෙක් සිටියාහ. ඒ අට දෙනාගෙන් රජ කුලයට පරිභව කරන්නා වූ රන් රුවෙහි දක්නා රූපය දුටු සේවිකාවෝ මෙම රූපය රජු දුටුවොත් අපට මැරුම් කන්නට වෙතැයි සිතා රන් රුවෙහි කොපුල් තලයට පහරක් ගැසූහ. එවිට අත්ල පැලී යන තරමේ වේදනාවට ඇති වී එය රන් රුවෙකැයි දැන ලැජ්ජා වී සිනාසෙමින් මම මාගේ දියණියකැයි සිතා පහර ගැසීමි. මැය මගේ දරුවන්ගේ රුවට කුමක් අගී ද? මද්‍ර රජුගේ දියණිය වූ ප්‍රභාවතිය රන් රුවෙහි ස්ත්‍රියට වඩා රූපත් බව දැන, ඔක්කාක රජුගේ දූතයෝ මද්‍ර රජුගේ රජ මැදුරට ගියහ. එම දූත පිරිස කුමක් නිසා පැමිණියේදැයි ඇසූ විට, කුස නම් කුමාරයාට අපගේ රජතුමා රාජ්‍ය දෙනු කැමැත්තෙන් නුඹ වහන්සේගේ ප්‍රභාවතී නම් කුමාරිකාව කුස කුමාරයාට පාවා දෙන්නැයි ඉල්ලා සිටියහ. එවිට කුමාරිකාවගේ පියාණන් එම විවාහයට කැමතිව දැන්වූ විට දූතයෝ වහාම සිය රටට ගොස් රජ්ජුරුවන්ට හා බිසොවුන්ට ඒ බව කීහ. ඔක්කාක මහරජ්ජුරුවෝ කුසාවතී නුවරින් නික්ම සාගල නුවරට පැමිණියහ. බෝසතුන්ගේ පියාණන් හා මෑණියන් මද්‍ර රජ්ජුරුවන්ගේ දියණිය තම පුත් කුමාරයාට විවාහ කර දීමට කැඳවාගෙන යාමට පැමිණි බවත්, කුමරු හා විවාහපත් වන රාජ කුමාරියට දාවල් කාලයේ ස්වාමියා දකින්ට නොලැබෙන බවත් කියා, ඊට කැමතිදැයි දියණියගෙන් විමසූ විට එකඟ වූයෙන් ඔක්කාක රජ්ජුරුවෝ මද්‍ර රජ්ජුරුවන්ට බොහෝ සම්පත් දී ප්‍රභාවතී කැඳවාගෙන ගියාහ.

එහිදී කුස රජ්ජුරුවෝ ප්‍රභාවතී දැකගැනීමේ අටියෙන් පළමුව ඇත්හලට ද, දෙවනුව අස්හලට ද ගොස් ඇය දැකීමට අපේක්ෂාවෙන් සිටියේය. ප්‍රභාවතී තම නැන්දනියගෙන් තම ස්වාමියා බැලීමට කළ ඉල්ලීම වළකාලිය නොහැකි තැන, කුස රජ්ජුරුවෝ හෙට නුවර පැදකුණු කරති. තොපට ඒ වේලාවට සීමැදුරු කවුළුවෙන් දකින්ට හැකියි කියා, කුස රජුගේ ජයම්පති මලණුවන් රාජාභරණයෙන් සරසා, මඟුලැතු පිට නංවා, බෝධිසත්වයන් ඇත්ගොව්වෙකු වේශයෙන් සරසවා යැවූ අතර, අගබිසව ප්‍රභාවතීට ඇතු පිට යන ජයම්පති කුමරු පෙන්වා, ඔබේ ස්වාමියාගේ ශ්‍රී විභූතිය බලන්නැයි කීවාය. එවිට ප්‍රභාවතී ජයම්පති කුමරු දැක මට සුදුසු වල්ලභයෙකු ලැබුණායැයි සතුටු වූවාය.

ඇත්ගොව් වෙසින් පිටුපස උන් බෝධිසත්වයෝ ප්‍රභාවතී දැක, උසුලු විසුලු පෑහ. ප්‍රභාවතීගෙන් ස්වාමිපුත්‍රයා දුටුවේදැයි විමසූ විට, දුටිමි, පිටුපස උන් ඇත්ගොව්වා ඉතාම චපලය, මට උසුලු විසුලු පෑවේය. මේ තැනැත්තා කුමක් පිණිස රජු පිටුපස යන්නේ දැයි ඇසුවාය. ප්‍රභාවතී, මේ ඇත්ගොව්වා ඉතා නිර්භීතය. රජ්ජුරුවන්ට රජ කෙනෙකැයි නොසිතති. මේ කිමෙක්ද? කුස රජ්ජුරුවෝ නම් මොහුම වෙතැයි කුමරිය සිතුවාය. එසේ සිතා කාන්තාවක කැඳවා මෑණියෙන්ගෙන් කුස රජු ඇතු පිට උන් තැනැත්තාදැයි, නැතහොත් පිටුපස උන් තැනැත්තාදැයි දැනගෙන එන්නැයි යැවුවාය. දුර සිට බලා සිට මැය ආවේ මා පරීක්ෂා කරන්නැයි දැනගත් බෝධිසත්වයෝ

''නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය.''

මැයට මා ගැන නොකියන්නැයි සේවිකාවට අණ කළහ.

නැවත කල්‍යාමෙන් බෝධිසත්වයෝ ප්‍රභාවතී දකිනු කැමතිව මෑණියන්ට කීවාය. එසේ නම් අප්‍රසිද්ධ වේශයෙන් උයනට ගොස් සිටිනු මැනවැයි කීවාය. එවිට කුස රජ්ජුරුවෝ උයනට ගොසින් මඟුල් පොකුණේ කරවටක් දියට බැස, නෙළුම් පතකින් හිස වසාගෙන සිටියහ. බිසොවුන් ප්‍රභාවති උයනට කැඳවාගෙන ගියාය. කුමරිය පැමිණි විට කුස රජු නෙළුම්පත ඉවත් කොට ප්‍රභාවතීගේ අත ඇල්ලුවේය. ඔහුගේ මූඛය දැක යක්‍ෂයෙක් මා අත අල්ලාගතැයි මුරගාමින් බයින් සිහි නැතිවිය. එවිට රජ්ජුරුවෝ අත ඇරපීය. එවිට බිසෝ සිහි ලබා ඇත්හලේ දී ඇත් බෙටියෙනුත්, අස්හලේ දී අස් බෙටියෙනුත් මොහු විසින්ම මට ගසන ලදී. ඇතුගේ පශ්චිම ආසනයෙහි ද සිට මා වෙහෙසවූයේ මොහුමය. මෙසේ විරූප වූ වල්ලභයාගෙන් මට ප්‍රයෝජන කිම්ද? ජීවත් වුනොත් මට වල්ලභයන් අරුම නැතැයි සිතා එක්ව ආ



අමාත්‍යයන් කැඳවා යාන වාහන සරසා අදම මට නික්මෙන්ට අවශ්‍යයැයි කීවාය. එය අසා රජ්ජුරුවෝ මැයට යන්ට අවසර නොදෙන්නේ නම් ළය පැළී මිය යනු ඇත. නැවත මාගේ බලයෙන් ගෙන්වා ගනිමියි සිතා යෑමට අනුදත්හ. එවිට ප්‍රභාවතී පිරිවර සමග පියරජුගේ සාගල නුවරට ගියාය. ප්‍රභාවතී පෙර ජාතියේ ප්‍රාර්ථනාවෙන් නොකැමැති වූවාය. බෝධිසත්වයෝ පූර්වයේ කරන ලද අකුසල බලයෙන් විරූප වූහ.

බෝධිසත්වයෝ ප්‍රභාවතී ගිය බව අසා ශෝකයට පත්වූහ. ප්‍රභාවතී නැති රජ ගෙය කුස රජ්ජුරුවන්ට හිස් වූවාක් මෙන් වැටහිණ. මෙසේ රාත්‍රියේ බොහෝ දුක්විඳ, අලුයම නැගිට සාගල නුවරට ගොස් ප්‍රභාවතී කැඳවාගෙන එමියි කියා, මෑණියන් අමතා, මා එනතුරු රාජ්‍යය භාර ගන්නා ලෙස පවරා, පංචායුද සන්නද්ධව කහවණු දහසකුත් ගෙන කොක නද නම් වීණාව අතින් ගෙන සවස් වේලෙහි සාගල නුවරට වන්හ.

එදින එක්තරා ස්ත්‍රියකගේ නිවසෙහි ලැඟුම් ගෙන මසු දහස ගෙහිමි ස්ත්‍රියට දී පංචායුදය එහි තබා මා ගොස් ආ යුතු තැනක් ඇතැයි කියා වීණාව අතට ගෙන ඇත්හලට ගොස් රාත්‍රියේ සැතපෙන තැනක් දෙවුනම් තොපට වීණා ගායනා කරමියි කියා ඇත්ගොව්වන්ගෙන් අවසර ගෙන මද වේලාවක් නිදා සිට විඩාව සන්සිඳුවාගෙන වීණා ගායනා කළහ. ප්‍රභාවතී එවිට එම ශබ්දය අසා මේ කුස රජුගේම වීණා නාදය විය යුතුයි අනුමාන කළාය.

බෝධිසත්වයෝ මෙතන විසීමෙන් ප්‍රභාවතී දැකිය නොහැකි බව දැන, මද්‍ර රජ්ජුරුවන්ගේ මඟුල් කුඹලාගේ ගෙට ගොස්, ඔහුට අතවැසිව ඔහුගෙන් අවසර ලබා මැටි පිඩක් අරගෙන සකය කරකවා වළං රූප තනා, මේ රූප ප්‍රභාවතී විනා අනෙක් කවුරුවත් නොදකිත්වායි අධිෂ්ඨාන කළේය. එවිට කුඹල්කරු මේ අත්කම් මද්‍ර රජ්ජුරුවන්ට ගෙන ගොස් පෙන්වූහ. මද්‍ර රජු ඒ වළං රූප දැක මේවා හැදුවේ කවුදැයි විමසා, කුඹලා මමයි කී කල තොපට මේ තරම් ලස්සන වළං නොකළ හැකියි රජු කී විට, තමාගේ අතවැස්සා විසින් කරන ලදැයි දැන්වීය. කුඹලා ප්‍රභාවතී දේවියට කළ වළං ඇයට දෙන ලදී. ප්‍රභාවතී ඒවා දැක මේවා අනෙකෙකු විසින් කරන ලද ඒවා නොව කුස රජු විසින්ම මා වෙනුවෙන් කරන ලදැයි සිතා කිපී, මට ප්‍රයෝජන නැත. කැමති කෙනෙකුන්ට දෙන්නැයි කියා ආපසු දුන්නාය.


ඉන් අනතුරුව රජ්ජුරුවන්ගේ නළකරුවා ළඟට ගොස් ඔහුට අතවැසිව තල්වැට ආදි කර්මාන්තයෙහි යෙදුනාහ. එම තල්වැට කර්මාන්තය රජුට ගෙනගොස් දුන් විට රජු එය කුමාරිකාවට දෙන මෙන් නියෝග කරන ලදී. එය ද බෝධිසත්වයන් විසින් කරන ලද බව දැන කිපී බිමට දමන ලදී. වරෙක මල්කරුවෙකු ලෙස ද, අරක්කැමියෙකු ලෙස ද රජගෙයි සේවය කරද්දී වළං කදක් ගෙන යන අතර පය පැකිල වැටී කෙඳිරිගාමින් ඇද වැටී සිටියහ. එවිට ප්‍රභාවතිය මුළු දඹදිවට අග්‍ර රාජ ඔහු මා නිසා රෑ දාවල් දුක්විඳින බැවින් ප්‍රාණය ඇත්දැයි, නැත්දැයි පරීක්‍ෂා කරන්නට කුස රජු හුස්ම ගන්නේ දැයි නැඹුරුව බැලූ විට, කුස රජ්ජුරුවෝ කෙළ කටක් පුරාගෙන ප්‍රභාවතීගේ මූණට දැමීය. ප්‍රභාවතී බැණ දොඩා පරිභව කර තද පරුෂ වචනයෙන් බැන වැදුනාය. එවිට බෝධිසත්වයෝ තොප කොපමණ පරිභව කළත් මම මෙහිම සිටිමියි කී විට, ප්‍රභාවතී, කුස රජ්ජුරුවන් කවර බසකින් වුවත් ලැජ්ජා කළ නොහැකි බව දැන, දොරගුළු ලා ගත්තාය. එවිට කුස රජු වළං කද ගෙන පලා ගියේය.

දිනක් ප්‍රභාවතිය දකිනු රිසියෙන් වසුරු කත් අදින බෝධිසත්වයන් දැක, ප්‍රභාවතිය, කුසරජු තමන්ට නුසුදුසු වහලුන් විසින් කළ යුතු දෙය කරයි. මා නිසා දිය දර අදිමින් හීන ක්‍රියාවන් කරමින් දුක් විඳිමින් නොසිට තම රටට ගොස් යකින්නක් අගමෙහෙසිය කර සිටින්නැයි කීවාය. එවිට බෝසතුන් ඉතා තද පරුෂ ගති ඇති මැයගෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? මගේ රටට ගොස් මා පිය දෙදෙනා දැක වාසය කරමියි සිතුවේය. එවිට ශක්‍ර දේවේන්‍ද්‍රයා සත්මසක් දුක්විඳ ප්‍රභාවතිය දැක්ක නොහී බෝසතුන් උකටලී වනු දැක ඇය ලබා දෙන්ට සිතා මද්‍ර රජු වෙත දූතයෙකු යවා ප්‍රභාවතිය කුස රජු ඇර පලා ගොස් ඇතැයි දන්වා රජවරුන් සත් දෙනෙකුට හසුන්පත් යැවූහ. ඒ සත් රජුන් ප්‍රභාවතී තමන්ට පාවාදෙන ලෙස දන්වා සටනට එළඹුනහ.

මෙම අවස්ථාවෙහි වළං සෝදමින් සිටි කුස රජු මවු දේවියට පෙන්වා කුස රජු දෙස බලන්නැයි ප්‍රභාවතිය කීවාය. සත් රජුන් යුද්ධයට පිවිසි විට කුස රජු විසින් ඔවුන් පරාජය කොට මද්‍ර රජුට දක්වා ප්‍රභාවතිය තමා විවාහපත් කාන්තාව නිසා තමාට ලබාදෙන ලෙසත්, සත් රජුන් නොමරා අනික් දූවරුන් සත් දෙනා ඔවුන්ට පාවා දෙන ලෙසත් දන්වා සිටියේය. කුස රජ්ජුරුවෝ මද්‍ර රජුගෙන් අවසර ඉල්ලා ප්‍රභාවතිය කැඳවාගෙන සාගල නුවරින් නික්ම කුසාවතී රාජධානියට පැමිණියහ. කුස රජු දසරජ දහමින් රජකම් කොට ප්‍රභාවති සමග ඒකාත්මිකව වාසය කළේය. එකල මවුපිය දෙදෙන සුද්ධෝදන රජු හා මහාමායා දේවියයි. ජයම්පති නම් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයන් වහන්සේය. ප්‍රභාවතිය නම් බිම්බා දේවියයි. කුස රජ්ජුරුවෝ නම් තිලෝගුරු බුදුරජාණන් වහන්සේමය.

**කේ. මීගහකුඹුර**

"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්."



# පැවිදි දිවියේ පනස් වසර සපුරන වේඩරුවේ උපාලි අස්ගිරි අනුනායක හිමිපාණන්ට චිරං ජයතු

ගැඹුරු බුදු වදන් සරල බසින් පහදා දෙමින් ජනමත සනසන වේඩරුවේ ධර්මකීර්ති ශ්‍රී රතනපාල උපාලි අභිධාන මහා විහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි විහාර පාර්ශ්වයේ අතිගරු අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උතුම් පැවිදි ජීවිතයේ 50 වෙනි වසර පිරීම නිමිත්තෙනි.

සිරිසර කන්ද උඩරට සෙන්කඩගල පුරවර විරාජමාන වන්නා වූ ශ්‍රී දළදා මාලිගාව නමැති අසහාය මහා පුණ්‍ය භූමිය කේන්ද්‍ර කර ගත් ආගමික හා ඓතිහාසික වශයෙන් ඉතා ශ්‍රේෂ්ඨ සිද්ධස්ථාන අතර ප්‍රමුඛස්ථානයක වැජඹෙන අස්ගිරි මහා විහාරයට අයත් ගෙඩිගේ රජමහා විහාරය නෙතට හමුවන සෑම අවස්ථාවකදීම සිහියට නැගෙන ප්‍රධාන කාරණා කීපයක් සනිටුහන් වන්නේය.

1. දිඹුලාගල මහා සංඝ පරම්පරාවෙන් පැවතෙන ධර්මකීර්ති මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන මහා සංඝ රත්නයට ගෙඩිගේ විහාරය පූජා කිරීම.

2. තෙවන වික්‍රමබාහු රජුගේ මැණියන් වන චන්ද්‍රවතී දේවිය සිහිවීමට බෝධීන් වහන්සේ නමක් රෝපණය කිරීම.

3. පළවෙනි විමලධර්මසූරිය රජතුමා දෙල්ගමු විහාරයේ සිට ශ්‍රී දළදා වහන්සේ මහනුවරට වැඩමවා ගෙඩිගේ රජමහා විහාරයේ ප්‍රථමයෙන් වඩා හිඳුවීම.


4. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා මෙම ගෙඩිගේ විහාරයේ පැවැත්ම සඳහා ඉඩ කඩම් පූජා කිරීම.

5. අස්ගිරි මහා විහාරයේ ග්‍රන්ථධූර අධිපතිව සිටි ගෙඩිගේ විහාරාධිපති ගොලහැන්වත්තේ ධම්මසිද්ධි හිමියන් විසින් උපසම්පදාව ඉල්ලා සියම් දේශයේ රජුට සන්දේශය සකස් කිරීම.

6. සියම් උපාලි මහා ස්ථවිරයන් ප්‍රධාන මහා සංඝරත්නය ලක්දිව උපසම්පදාව පිහිටුවන අවස්ථාවේ මෙම ගෙඩිගේ විහාරයේද උපසම්පදා විනය කර්ම කිරීම.

7. වර්තමාන දියුණුව හා පාලනය.

ථෙරවාදී බුද්ධ ශාසනය පිළිබඳව විවරණය කිරීමේදී උපාලි නාමය ආරම්භයේ පටන් ශාසන අන්තර්ධානය දක්වා ගිහි පැවිදි ජන හදවත් තුළ සනිටුහන් වන්නේය.



අප බුදුන් දවස කිඹුල්වත්පුර කරණවෑමි කුලයක උපන් උපාලි අනුපිය අඹ වනයේදී පැවිදිව බුදුරදුන්ගෙන් කමටහන් ගෙන භාවනා කොට රහත්ව විනයධර භික්ෂූන්ගෙන් අග්‍රස්ථානය ලබා ගත්හ. ප්‍රථම සංගායනාවේදී උපාලි රහතන් වහන්සේ විනය පිටකය ප්‍රකාශ කළ සේක. මිහිඳු මහ රහතන් වහන්සේගෙන් ආරම්භ වූ ලක්දිව මහා විහාර භික්ෂු පරම්පරාව මෙම උපාලි හිමියන්ගෙන් අවිච්ඡින්නව පැවැතෙන අතර, බු.ව. 1855 දී අස්ගිරි මහා විහාර ආරම්භයේදී වැඩමවා වදාළ පලාබත්ගල වනරතන හිමියන් ප්‍රධාන මහා සංඝරත්නය උපාලි මහ රහතන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවේ 142 වෙනි සඟ පරපුරට අයත් වන බව අස්ගිරි තල්පතෙහි සඳහන් වේ. තවද එතැන් සිට සියම් උපසම්පදාව දක්වා සංඝ පරම්පරා 28 ක් වන අතර, වර්තමාන අස්ගිරි මහා විහාරයේ වැඩ සිටින ශ්‍රීමත් මහා නායක මාහිමියන් වහන්සේ උපාලි මහ රහතන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව අඛණ්ඩව පැවැතෙන්නේ නම් 191 වෙනි සඟ පරපුරට අයත් වන්නේය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමන් විසින් සියම් දේශයෙන් උපසම්පදා විනය කර්මය සඳහා වැඩම වූ උපාලි හිමියන්ගෙන් ලද ශාසනික මෙහෙවර ඉතිහාසගත වී ඇත. මිහිඳු මහ රහතන් වහන්සේගෙන් ආරම්භ වූ ථෙරවාදී සඟ පරපුර සියම් උපසම්පදාව නිසා "මහා විහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වය, මල්වතු මහා විහාර පාර්ශ්වය" යනුවෙන් උභය මහා විහාර ඇති විය. මෙම සියම් උපාලි හිමියන් අපවත් වූයේ මෙම අස්ගිරි මහා විහාරයේ ගෙඩිගේ රජමහා විහාරයේදීය.

වර්තමාන මෙම උතුම් පුණ්‍ය භූමිය සෑම අංශයකින්ම සම්පූර්ණ කොට සංවර්ධනය කිරීමෙහි පුරෝගාමීත්වය දරන මහා විහාර වංශික සඟ පරපුරේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ අතිගරු අනුනායක ධුරය හොබවන වේඩරුවේ උපාලි නාහිමියන් පරිණත දැනුමෙන්, ශීලාදී ගුණ දහමින්, උපේක්ෂා ගුණයෙන්, වියත් විශාරද දෙසුමෙන්, ආදර්ශයෙන් සම්පූර්ණ බුද්ධ පුත්‍රයන් වහන්සේ නමකි.

පාසල් අධ්‍යාපනයෙන් හා පැවිදිව පිරිවෙන් අධ්‍යාපනයෙන් මූලික දැනීමත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් මධ්‍යම හා උසස් දැනීමත් ලබාගෙන සෙන්කඩගල පුරවර උසස් ශාස්ත්‍ර පීඨයක් වන ධර්මරාජ විද්‍යාලයේ ආචාර්යවරයෙක් වශයෙන් දහස් ගණන් සිසු දරුවන්ගේ සිත් සතන් ප්‍රඥා ගෝකයෙන් ප්‍රභාමත් කළ අප ගෞරවණීය වේඩරුවේ උපාලි අභිධාන නාහිමියන් වහන්සේ අධ්‍යාපන ක්ෂේත්‍රයට මහඟු සේවාවක් ඉෂ්ට සිද්ධ කළහ.

අස්ගිරි මහා සංඝ සභාවට යටත්ව පාලනය වන ඓතිහාසික බදුලු මුතියංගණ රජමහා විහාරයේ භාරකාරත්වය ලබා ගත් අප හිමිපාණෝ එම විහාරස්ථානය කේන්ද්‍ර කරගෙන ඌව පළාතට ආගමික ජාතික වශයෙන් කළ සේවය ගිහි පැවිදි ජන හදවත් තුළ සටහන් වී ඇත.

ගරුතර උපාලි නාහිමියන්ගේ පරිපාලන සේවය සම්බන්ධ දක්ෂතාව හඳුනා ගත් අස්ගිරි මහා සංඝ සභාව විසින් ඓතිහාසික පොළොන්නරු සොළොස්මස්ථානයේ නායක පදවියද පිරිනමන ලදී. ශ්‍රී ලංකාවේ සංඝ නායක පදවියකට වැඩිම විහාරස්ථාන ගණනක් හෙවත් රාජධානියක්ම අයිති වන්නේ මෙම මහා පදවියටයි. මහනුවර අස්ගිරි මහා විහාර පරිශ්‍රයේ පැරණිතම විහාරස්ථානය වශයෙන් ගෙඩිගේ විහාරය හෙවත් ශ්‍රී දළදා ගමන් මාලිගය දේශ දේශාන්තරව, ජනී ජනයාගේ ගෞරවාදරයට, වන්දනා මානයට කේන්ද්‍ර වී ඇත. මෙවන් පින් බිමක් ආරක්ෂා කිරීම, වර්ධනය කිරීමම මහා පින්කමකි. අවම වශයෙන් ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටිය සිද්ධස්ථානයේ සිටින්නට ලැබීමම මහා භාග්‍යයකි.

ගරුතර උපාලි නාහිමියන් පිළිබඳව විශාල වශයෙන් අතිශයෝක්තියෙන් තොරව කතා කිරීමේදී ස්වභාවයෙන් පිහිටා ඇති ගුණාංග කීපයක් මෙසේ දැක්විය හැක.


1. චාම් පැවැත්ම, 2. සරල ධර්ම දේශනා, 3. නිර්මාණ කුසලතා, 4. ජනප්‍රියත්වය, 5. උපේක්ෂා ගුණය.

මෙවන් ගුණ ඇති ඓතිහාසික සිද්ධීන් පරීක්ෂා කිරීමෙන් දැනුම ලබාගන්නා ස්වයං චින්තනයෙන් සුවිශේෂ භාෂණයෙන් රාජ්‍ය උතුමන් වශී කරවන ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ අනුනායක ධුරන්ධර ඓතිහාසික පොළොන්නරු සොළොස්මස්ථානාධිපති වේඩරුවේ ශ්‍රී උපාලි අභිධාන අතිගරු අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ බුද්ධාදී තෙරුවන් බලයෙන් ලංකාලෝක පාලක දෙවි දේවතාවන්ගේ ආරක්ෂාවෙන්, පිහිටෙන් ශ්‍රී ලංකා සම්බුද්ධ ශාසනය ආරක්ෂා පෝෂණය කිරීමට දිගාසිරි ලැබේවා.

චිරං ජයතු උපාලි නායක යතිවරෝ.

**පූජ්‍ය අමුණුපුර පියරතන හිමි**

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."



### වසරකට පෙර දෑයෙන් සමුගත්

# සසුනඹර මිණිපහන

## ගලගම ශ්‍රී අත්ථදස්සී මහානාහිමි

සියම් මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ විසි එක්වන මහා නායක පදවිය හෙබවූ ශ්‍රී සම්බුද්ධ පාදස්පර්ශයෙන් සුපූජිත ඓතිහාසික මහියංගන රජමහා විහාරය, ලෝක උරුමයක් වූ ඓතිහාසික රන්ගිරි දඹුළු රජමහා විහාරය, මැටියගනේ මයූරාවතී රජමහා විහාරය, ඓතිහාසික හුම්බුළුව රජමහා විහාරය, උරුලෑවත්ත රජමහා විහාරය යන පංච රජමහා විහාරාධිපති, ශ්‍රී හයගිරි විජයසුන්දරාරාම විහාරද්වයාධිපති, මජ්ඣිම භාණක, ත්‍රිපිටකාචාර්ය, රාජකීය පණ්ඩිත, අතිපූජ්‍ය ගලගම ධම්මසිද්ධි ශ්‍රී ධම්මානන්ද අත්ථදස්සාභිධාන මහා විහාර වංශික ශ්‍යාමෝපාලී මහා නිකායේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ අපවත් වී මාර්තු මස නව වන දිනට වසරක් සපිරෙයි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.

ත්‍රිපිටක බුද්ධ වචනය ග්‍රන්ථාරූඪ කිරීමෙන් සමස්ත ලෝකවාසී බෞද්ධ මහජනතාවගේ සම්භාවනාවට පාත්‍ර වූ මාතලේ මහ දිසාවේ අස්ගිරි පල්ලේසිය පත්තුබද ගලගම ග්‍රාමවරයේ ජන්ම ලාභය ලද මහනාහිමිපාණෝ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ ප්‍රථම මහානායක පදවියට පත් උරුලෑවත්තේ ශ්‍රී ධම්මසිද්ධි මහනාහිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට අයත් උඩුරාවණ ශ්‍රී ධම්මානන්ද නාහිමියන්ගේ ආචාර්යත්වයෙන් ප්‍රව්‍රජ්‍යා සම්පත් ලබා පිරුණු විසි වයස් එළඹුණු 1942 වර්ෂයේදී අස්ගිරි මහා විහාරයීය මංගල උපෝසථාගාරයේදී මුල්ලේගම ශ්‍රී ගුණරතන මහ නාහිමියන් උපාධ්‍යාය කොට සුපරිශුද්ධෝපසම්පදාවට පත්වූහ.

පරිවේණාචාර්යයන් වහන්සේ නමක සහ පරිවේණාධිපතීන් වහන්සේ නමක වශයෙන්ද, අස්ගිරි මහාවිහාරයීය කර්මවාගාචාර්ය, විංශත් වර්ගික කාරක සංඝ සභික, ජ්‍යෙෂ්ඨ කාරක සංඝ සභික, උපාධ්‍යාය ආදී තනතුරු හොබවමින්ද, මාතලේ යටවත්තේ උරුලෑවත්ත රජමහා විහාරය, අලව්ව හුම්බුළුව රජමහා විහාරය ආදී උරුලෑවත්ත සංඝ පරම්පරානුගත විහාරස්ථානයන් සහ මැටියගනේ මයූරාවතී රජමහා විහාරය, සම්බුද්ධ පාදස්පර්ශයෙන් සුපූජිත පරම පූජනීය මහියංගන රජමහා විහාරය, ලෝක උරුමයක් වූ රන්ගිරි දඹුළු රජමහා විහාරය ආදී අස්ගිරි මහා විහාරයීය විංශත් වර්ගික කාරක සංඝ සභාන්තර්ගත පූජ්‍ය ස්ථානයන්හි ආධිපත්‍යය දරමින්ද, අවස්ථා ගණනකදී ශ්‍රී දළදා වහන්සේ උදෙසා තේවා භාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ලෙසින් කටයුතු කරමින්ද සිදු කළ මෙහෙවර අනභිභවනීය වෙයි.

අනුක්‍රමිකව අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ අතිගරු අනුනායක පදවියෙන් සහ ඉනික්බිතිව අධ්‍යතන සම්බුද්ධ ශාසන භාරධාරී යතිවර ධූරාවලියේ අගතරලම්ණ වන් අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහානායක පදවියෙන් පුද ලද ගලගම ශ්‍රී අත්ථදස්සී මහනාහිමිපාණෝ මහානායක පදවිය හෙබවූයේ දස මසක කාලයක් වුවද සත් සිය වසරක අස්ගිරි මහාවිහාර ඉතිහාසයේ නොමැකෙන සටහන් ඉතිරි කොට තැබූහ. සියවස් ගණනාවකට පසු අස්ගිරි මහා විහාරයේ දෙවන අනුනායක පදවිය යළි ප්‍රතිෂ්ඨාපනය කිරීම මෙම යුගයේ සිදුවූ වැදගත් ශාසනික සංසිද්ධියකි.

ඉපැරණි අධ්‍යාපන ක්‍රමයේ පරතෙරට යමින් මජ්ඣිම භාණක, ත්‍රිපිටකාචාර්ය, රාජකීය පණ්ඩිත ආදී උපාධි හොබවමින් ව්‍යක්ත ධර්ම දේශකයකු සහ සරභඤ්ඤ විශාරදයකු වශයෙන් ප්‍රෞලත්වයට පත්ව වැඩ විසූ සේක. ගැඹුරු දහම් කරුණු සරල ගැමි වහරින් ඉදිරිපත් කිරීමේ දක්ෂතාවෙන් යුතු සිරිලක ඉපැරණි ධර්ම දේශනා ක්‍රම අතර එන මෛත්‍රී වර්ණනා, ආසන දෙකේ බණ, ආසන පහේ බණ, ආසන හතේ බණ ආදී රැය තුන් යම පහන් වනතුරු පවත්වන ධර්ම දේශනා සඳහා දිවයිනේ චිරප්‍රසිද්ධත්වයට පත්වූහ.

භික්ෂු සමාජයෙහි නායකත්වය සඳහා අදාළ වන සකලවිධ ගුණාංගයන්ගෙන්ම අනූන වූ මහ නාහිමිපාණෝ අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සුභරතා යනාදී ගුණාංගයන්ගෙන් යුතුව නිරන්තරයෙන් දෑහැමි සිතිවිලිවලින් මුව සරසාගෙන තම සමීපයට පැමිණෙන කාහටත් සමානාත්මතාවෙන් සත්කාර සම්මාන දක්වූහ. තම ආචාර්යයන් වහන්සේලා විසින් රැකගෙන ආ මහාවිහාර සම්ප්‍රදාය හා බද්ධ වූ චාරිත්‍ර වාරිත්‍ර විධි සමුදාය නොකඩකොට අනුගමනය කිරීම හා ආරක්ෂා කිරීම උදෙසා උන්වහන්සේ ගන්නා ලද උත්සාහය ප්‍රශංසාර්හ වේ.

දුටු දුටුවන්ගේ නෙත් සිත් ඇදී යන රූප කායෙන්ද, ගුණ නුවණින්ද, සංඝශෝභන අලාමක ගුණයන්ගෙන්ද පිරිපුන්ව ලෝකාර්ථචර්යාව උදෙසා සද ඇප කැපව සකල ලාංකේය බෞද්ධ ජනතාවගේ පමණක් නොව අන්‍ය ආගමිකයන්ගේද සඳදරණීය ගෞරව භක්ති ප්‍රණාමයට පාත්‍ර වෙමින් සංඝ රාජවරයකු සේ වැඩ හුන් ගලගම ශ්‍රී අත්ථදස්සී මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 2016 මාර්තු මස 9 වැනිද අපවත් වී වදාළ සේක.

**දිමුතු පුන්සර කොළඹගේ**

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැඟී යන්නෙකු වැනිය"

# මල්වතු, අස්ගිරි උභය මහා විහාරයන්හි උපසම්පදා පුණ්‍යෝත්සවයට සියල්ල සූදානම්

මහනුවර, මල්වතු අස්ගිරි උභය මහා විහාරයන්හි උපසම්පද පුණ්‍යෝත්සවයන් මෙම වර්ෂයෙහි (2017) මැයි මස 10 වෙනි බදාද සිට (වෙසක් පුණු පෝය දින) පටන් ජූනි මස 8 වෙනි බ්‍රහස්පතින්ද (පොසොන් පුණු පෝය දින) පවත්වා අවසන් කොට පහත සඳහන් පොහෝ දිනවල පෙරහර සහිතවද, සෙසු දිනවල පෙරහර රහිතවද සිදුකෙරෙන බව මහනුවර මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිගෞරවාර්හ මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මාහිමිපාණන් වහන්සේ සහ අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අතිගෞරවාර්හ මහානායක වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතන මාහිමිපාණන් වහන්සේ ශාසන ගෞරවයෙන් නිවේදනය කර ඇත.



රාජ්‍ය වර්ෂ 2017

**උපසම්පදා පුණ්‍යෝත්සවය**

2017 මැයි මස 10 වෙනි බුධ දින පටන් ජූනි මස 08 වෙනි ගුරු දින

අවසන් කොට



රාජ්‍ය වර්ෂ 2017

**උපසම්පදා පුණ්‍යෝත්සවය**

එම නිවේදනය අනුව මැයි 10 බදාද (වෙසක් පුර පසළොස්වක පෝද) මැයි 18 (බ්‍රහස්පතින්ද), මැයි 25 (බ්‍රහස්පතින්ද), ජූනි 1 (බ්‍රහස්පතින්ද) සහ ජූනි 8 (බ්‍රහස්පතින්ද) පොසොන් පුර පසළොස්වක පෝද) යන දිනයන්හි උපසම්පද පෙරහර සහිතවද, සෙසු දිනයන්හි උපසම්පදාවන් පෙරහර රහිතවද සිදුකෙරේ.

ජූලි මස 8 වන සෙනසුරාද ගිම්හාන ඍතුවෙහි 8 වෙනි පොහොය කොට පසුදින පෙරවස් එළඹිය යුතුය. අගෝස්තු මස 7 වෙනි සඳුද වස්සාන ඍතුවෙහි 2 වෙනි පොහොය කොට ඊට පසු දින පසුවස් එළඹීමද, ඔක්තෝබර් මස 5 වෙනි ගුරු දින වස්සාන ඍතුවෙහි 6 වෙනි පෝය කොට එදිනම පෙරවස් පවාරණයද නොවැම්බර් 3 වෙනි සිකුරාද වස්සාන ඍතුවෙහි 8 වෙනි පොහොය කොට එදිනම පසුවස් පවාරණය යෙදෙන්නේය.

උපසම්පදපේක්ෂකයන් පළාතේ නායක තෙරුන් වහන්සේගෙන්, පිරිවෙණක ශිෂ්‍යයෙක් නම් පරිවෙණාධිපති වහන්සේගෙන්ද, ගුරුවරුන් විහාරස්ථානය සහ ඉගෙනීම පිළිබඳ සහතික ලියුම් සහ සහතිකද ඇතිව පැවිදි කළ ගුරුවරුන් සමග පැමිණිය යුතුය. මෙම වර්ෂයේදී උපසම්පද වීමට බලාපොරොත්තු වන සාමණේර තැනගේ නමත්, උපන් දිනයත්, සම්මත පරිදි වාචෝද්ගත කරන ලද සාමණේර බණ දහම් ආදිය පිළිබඳ විස්තරත්, ගුරුවරයා හෝ ගුරුවරුන්ගේ නමුත්, විහාරස්ථානයේ ලිපිනයත්, දිස්ත්‍රික්කයත් 2017 අප්‍රේල් මස 20 වෙනි දිනට ප්‍රථම අප වෙත ලියා එවන ලෙස මල්වතු මහා විහාර පාර්ශ්වයට අයත් ප්‍රාදේශීය සියලුම භික්ෂූන් වහන්සේලා වෙත ඒ ඒ පළාත්වල අපේ නායක ස්ථවිරයන් වහන්සේලා විසින් දන්වා සිටිය යුතු බව මල්වතු මහා විහාර පාර්ශ්වයේ අති ගෞරවාර්හ මාහිමිපාණන් වහන්සේගේ නිවේදනයෙන් දක්වා ඇත. ඉහත කී එම විස්තර තොරතුරු මෙම වර්ෂයේ අප්‍රේල් 25 වෙනි දිනට ප්‍රථම අප වෙත ලියා දන්වන ලෙස අස්ගිරි මහා විහාර පාර්ශ්වයට අයත් ප්‍රාදේශීය සියලුම භික්ෂූන් වහන්සේලා වෙත ඒ ඒ පළාත්වල අපේ නායක ස්වාමීන් වහන්සේලා විසින් දන්වා සිටිය යුතු බව අතිගෞරවාර්හ අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ මහානායක මාහිමිපාණන් නිකුත් කළ නිවේදනයෙන් දක්වා ඇත.

මල්වතු අස්ගිරි උභය මහ විහාරයන්හි වාර්ෂිකව සිදුකරනු ලබන උපසම්පද පුණ්‍යෝත්සවයන්හි, පෝය දිනයන්හි වාහලනාග නාමයෙන් සිදුකරනු ලබන උපසම්පද කර්මයන්හි උපාධ්‍යායන් වහන්සේලා වශයෙන් අතිගෞරවාර්හ මාහිමිපාණන් වහන්සේලා දෙනම පෙනී සිටිති. වාහලනාග නාමයෙන් උපසම්පදාව ලබන සාමණේරයන් වහන්සේලා ශ්‍රී දළදා මාලිගාවේ සිට උපසම්පද පෙරහරෙන් මල්වතු අස්ගිරි උභය මහා විහාරයීය මංගල උපෝසථාගාර වෙත වැඩමවාගෙන යනු ලබති.

මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක ගෞරවාර්හ නියංගොඩ විජිතසිරි, අනුනායක ගෞරවාර්හ දිඹුල්කුඹුරේ විමලධම්ම යන නාහිමිවරු ප්‍රධාන උපාධ්‍යායන් වහන්සේලා මල්වතු මහා විහාරයේ උපසම්පද විනයකර්ම කටයුතු සිදු කෙරෙන අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ ගෞරවාර්හ අනුනායක වේඩරුවේ උපාලි, ගෞරවාර්හ අනුනායක ආණමඩුවේ ධම්මදස්සි නාහිමිවරු අස්ගිරි මහා විහාරයේ සෙසු උපාධ්‍යායන් වහන්සේලාගේ සහභාගිත්වයෙන් විනය කර්ම කටයුතු සිදුකෙරේ. මල්වතු මහා විහාර පාර්ශ්වයේ සංඝ සභාවේ වැඩබලන ලේඛකාධිකාරී පහමුණේ සුමංගල නාහිමි, ලේඛන කටයුතු සිදුකරන අතර අස්ගිරිය මහා විහාර කාරක සංඝ සභාවේ ලේඛකාධිකාරී මැදගම ධම්මානන්ද, නියෝජ්‍ය ලේඛකාධිකාරී නාරම්පනාවේ ආනන්ද හිමිවරු අස්ගිරි මහා විහාරයේ උපසම්පද ලේඛන කටයුතු සිදුකරති.

සම්ප්‍රදාය අනුව මල්වතු අස්ගිරි උභය මහා විහාරයන්හි වාහලනාග නාමයෙන් උපසම්පද ශීලයෙන් පිහිටුවනු ලබන සාමණේරයන් වහන්සේලා වෙනුවෙන් අටපිරිකර පූජාව ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ විසින් පැරණි චාරිත්‍ර වාරිත්‍ර අනුව සිදුකෙරේ.

**කේ. බණ්ඩාරනායක**